# දෙසතිය

පුවත් සඟරාව

2025 අප්‍රේල්



## වඩිමු උතුම් මුනි දළ දා



# ටයිටේනියම් හදවත

**රංගිකා අබේසේකර**

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ශාන්ත වින්සන් රෝහලේදී 40 හැවිරිදි ඕස්ට්‍රේලියානු ජාතිකයකුට ටයිටේනියම් යොදා ගනිමින් කෘත්‍රිම ව නිර්මාණය කළ හදවතක් (BIVACOR උපාංගය) බද්ධ කර තිබෙනවා. ඒ, 2024 නොවැම්බර් මාසයේදී. පූර්ණ කෘත්‍රිම හදවතක් බද්ධ කෙරුණු පළමු ඕස්ට්‍රේලියානු ජාතිකයා ලෙසත් ලොව පූර්ණ කෘත්‍රිම හදවතක් ලබාගත් 06 වැනි පුද්ගලයා ලෙසත් කෘත්‍රිම හදවතක් සහිත ව රෝහලෙන් පිට ව ගිය ලොව පළමු වැනි රෝගියා බවටත් පත්වෙමින් ඔහු වාර්තා අතරට එක් වුණා. මේ කෘත්‍රිම හදවත ඕස්ට්‍රේලියානු ජාතික විද්‍යාඥයකු වන වෛද්‍ය ඩැනියෙල් ටිම්ස් විසින් නිර්මාණය කරන ලද්දක්.

කෘත්‍රිම හදවත යනු මිනිස් හදවතක රුධිර ප්‍රවාහය අනුකරණය කිරීම සඳහා පූර්ණ ආදේශකයක් ලෙස ක්‍රියා කළ හැකි රුධිර පොම්ප උපකරණයක්. පරිත්‍යාගශීලීන්ගෙන් හදවත් බද්ධ කිරීමක් සිදුවන තෙක් හදවත් රෝගියකු ජීවත් කරවිය හැකි ආදර්ශකයක් ලෙසයි මෙය නිර්මාණය කර තිබෙන්නේ. වෛද්‍ය ටිම්ස්ගේ පරමාර්ථය වන්නේ මේ කෘත්‍රිම උපකරණය භාවිතයෙන් හදවත් රෝගීන් සාමාන්‍ය ජීවන තත්ත්වයකට ගෙන ඒම. මේ වන විට අවස්ථා 06කේදී මෙවැනි කෘත්‍රිම හදවත් බද්ධ කිරීම් වෛද්‍ය ක්ෂේත්‍රයෙන් වාර්තා වුවත් සෑම රෝගියකුට ම හදවත් පරිත්‍යාගකරුවකු ඉදිරිපත් වන තෙක් රෝහලේ රැඳී සිටීමට සිදු ව තිබෙනවා.

මේ ඕස්ට්‍රේලියානු ජාතිකයාට ඔහුට හදවත් පරිත්‍යාගශීලියකු හමු වී ඇත්තේ මාර්තු මස ආරම්භයේදී වන අතර පූර්ණ කෘත්‍රිම ටයිටේනියම් හදවතක් සහිත ව දින 100කට වැඩි කාලයක් ජීවත් වූ පළමු පුද්ගලයා ද ඔහු. කෘත්‍රිම ටයිටේනියම් හදවත, හදවත් රෝගවලින් පෙළෙන පුද්ගලයන්ට දිගුකාලීන විකල්පයක් බවට පත්කර ගැනීමේ සම්භාවිතාවක් පවතින බවයි විශේෂඥ වෛද්‍ය මතය.

# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 04,
2025 අප්‍රේල්



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





22
වඩිමු උතුම් මුනි දළ දා



16
ආසියානු දේශපාලන කරළියේ උණුසුම



03
උතුරුකරේ උළු



36
ගුරු ගීතය



11
සුව නින්දේ සුව සිහින



40
මලල ක්‍රීඩාවට ධනාත්මක ලකුණක්

# වන්දනීය පූජනීය වකවානුවක්

සිරි දළ ද වහන්සේ යනු ලෝ වැසි ජනයාගේ ගෞරවනීය වන්දනාමානයට ලක්වන තුන්හෙළයේ මුදුන්මල්කඩයි. 2025 අප්‍රේල් මස 18-27 දක්වා සිරි දළ දා ප්‍රදර්ශනයක් ශ්‍රී දළ ද මාළිගා පරිශ්‍රයේදී පැවැත්වීමට රජය තීරණය කර තිබෙනවා. මෙය දෙස් විදෙස් බෞද්ධයන්ගේ පමණක් නොව ජාති, ආගම් භේදයකින් තොර ව සමස්ත ලෝ වැසි ජනතා බුහුමනට පාත්‍ර වන අසිරිමත් ප්‍රදර්ශන මංගල්‍යයක්.

පිව් (Pew) පර්යේෂණ මධ්‍යස්ථානය සඳහන් කරන ආකාරයට 2020 වසරේ කළ ඇස්තමේන්තුගත කිරීමකට අනුව ලෝක ජනගහනයෙන් මිලියන 507ක් බෞද්ධයන්. කාම්බෝජය (96.8%), තායිලන්තය (92.6%), මියන්මාරය (79.8%), භූතානය (74.7), ශ්‍රී ලංකාව (68.6%) පිළිවෙළින් වැඩි ම බෞද්ධ ජනතාවක් වෙසෙන රටවල් වනවා. මිලියන 22.5ක් පමණ වන ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් මිලියන 15.4ක් බෞද්ධ ජනතාව.

ශ්‍රී ලංකාවේ බහුතරයක් බෞද්ධයන් වුවත් පොදුවේ ආගම් භේදයකින් තොර ව ජනතාව බෞද්ධාගමික වත්පිළිවෙත් සමග බද්ධ ව ක්‍රියා කරනවා. විදේශිකයන් ද විශේෂයෙන් ශ්‍රී ලංකාවේ බෞද්ධ සිද්ධස්ථාන නැරඹීමට සහ වැඳ පුදා ගැනීමට දක්වන්නේ ඉමහත් කැමැත්තක්. එසේ ම බොහෝ විදේශික ජනතාව බෞද්ධ දර්ශනයේ හරය ගුරුකොට ගනිමින් එහි දර්ශනික සංකල්ප සහ නිරාමිස සුව අත්විඳින ආකාරය ඔවුන් දක්වන අදහස්වලින් පැහැදිලි වනවා. විශේෂයෙන් ථෙරවාදී බුදු දහමේ පහස ලබන ශ්‍රී ලංකාව ඔවුන් සලකන්නේ පින්බිමක් ලෙස. මෙවැනි පසුබිමක සිරි දළ ද ප්‍රදර්ශනයක් පැවැත්වීමෙන් ඔවුන් ආධ්‍යාත්මික ව ලබන සතුට අප්‍රමාණ වනු ඇති.

අවසන් වරට සිරි දළ දා ප්‍රදර්ශනයක් පවත්වා ඇත්තේ 2009 වර්ෂයේ. වසර 16ක් ඉක්ම ගිය තැන පවත්වන මේ සිරි දළ ද ප්‍රදර්ශනය සමග රටේ සිදු විය හැකි පරිවර්තනීය වෙනස විමසා බැලීම ඉතා වැදගත්. මෙවැනි මොහොතක ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බෞද්ධාගම, බෞද්ධ දර්ශනය පිළිබඳ ඇති වන විද්වත් සංවාද, කතිකා ඔස්සේ රටේ ඇති වන්නේ නව බෞද්ධ ප්‍රබෝධයක්. ආගමික වශයෙන් ජනතාව අතර අන්‍යෝන්‍ය සුහදත්වය, අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය වීමත් ජාති, ආගම් වශයෙන් පවතින දුරස්ථභාවය අවම වී සහජීවන ආකල්ප සංවර්ධනයක් ඇතිවීමෙන් රටේ සාමය හා සංහිඳියාව වර්ධනය වීමට ඇවැසි පරිවර්තනීය වෙනසක් ඇති වීමත් පිණිස මේ ප්‍රදර්ශනය ඉවහල් වනු ඇති. මෙලෙස සිරි දළ ද ප්‍රදර්ශනය ලෝක ජනතාවගේ අවධානයට පාත්‍රවීමෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු වීමත් ජාත්‍යන්තර සබඳතා තහවුරු වීමත් ඉතා වැදගත්.

සිරි දළ ද වහන්සේ වන්දනාමාන කිරීමෙන් ජනතාව ආධ්‍යාත්මික ව ලබන සුවය පෞද්ගලික ව තමන්ටත් පොදුවේ රටටත් ධනාත්මක ව බලපාන නිසා රජය ගත් මේ තීරණය පැසසුම් කටයුත්තක්. ජනතාව ද මෙහිදී අවබෝධ කරගත යුත්තේ හුදෙක් සිරි දළ ද වහන්සේ වන්දනාමාන කිරීම පමණක් නොව සැදැහැ සිතින් ඇති කරගන්නා සිත් පහදවා ගැනීම ආයෝජනයක් ලෙස ගනිමින් රටේ සාමය, සංහිඳියාව, සංවර්ධනය ඇති කර ගැනීමට දායක වීම යුතුකමක් බව.

- සංස්කාරක -

**දෙසතිය**
පුවත් සඟරාව

**දෙසතිය සඟරා දායකත්වය**

වාර්ෂික දායකත්වය රු. 1500.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........
Address ..........
..........
..........
..........
..........
ID Number .......... Tel / Mobile ..........
Signature .......... Date..........

# උතුරුකරේ උළු





**බිනූ දිලාරා ගමගේ**

මිනිසා සතු මූලික අවශ්‍යතාවක් වන්නේ නිවහන. අවට පරිසරයෙන් තමන්ට එල්ල විය හැකි අවදානම පිළිබඳ සැලකිලිමත් වෙමින් ප්‍රාග් යුගයේ සිට ම මිනිසා තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් හිසට සෙවණක් සකස් කර ගැනීමට උනන්දු වුණා. මිනිසාගේ වේගවත් පරිණාමයත් සමග තමන් වෙනුවෙන් නිවාස නිර්මාණය කර ගැනීමේදී අනුගමනය කර ඇත්තේ විවිධ දියුණු ක්‍රම. විශාල වෘක්ෂ, ගස් බෙන, ගල් ගුහාවලින් මෑත්වෙමින් මිනිසා විසින් පියස්සට කොළ අතු සෙවිලි කර තනා ගන්නා ලද නිවාස එහි පළමු පියවර. තමන් අවට පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි ශාක කොටස් නිවසේ වහල සඳහා භාවිත කෙරුණු අතර මෑත ඉතිහාසයක් වන තෙක් ම සෙවලි මාධ්‍ය වශයෙන් ඉලුක් වැනි තෘණ වර්ග, තල් අතු, පොල් අතු වැනි ශාක පත්‍ර, වියළි පොතු වර්ග, පැඟිරි, පිදුරු වැනි කෘෂිකාර්මික අතුරුඵල වශයෙන් ලැබෙන ශාක කොටස් මූලික වශයෙන් භාවිත වුණා. පසුකාලීන ව නිවාස ඉදි කිරීමේදී එහි වහල සැකසීම එක්තරා ආකාරයක කලාවක්, තාක්ෂණයක් වශයෙන් මානව භාවිතයට පැමිණෙනවා. ඒ සමග එකතු වන්නේ වාස්තු විද්‍යාව හා ඉංජිනේරු තාක්ෂණය.

විශේෂයෙන් මහින්දාගමනයෙන් පසුව මෙරට ඇති වූ ආගමික පිබිදීමත් සමග වෙහෙර විහාර ඉදි කෙරුණේ



වාස්තු විද්‍යාත්මක ක්‍රමවේද අනුව. පුරා විද්‍යාත්මක ගවේෂණ අනුව අනාවරණය වන්නේ එම ඉදි කිරීම් සඳහා පිළිස්සූ මැටි භාවිත කර සකස් කළ සෙවිලි උළු, පිළිස්සූ මැටි බිම් උළු සහ පිළිස්සූ මැටි ගඩොල් යොදා ගත් බව. එමෙන් ම අනුරාධපුර සහ පොළොන්නරුව පෞරාණික රාජධානි පිහිටි බිම්වල සිදු කරන ලද පුරා විද්‍යාත්මක කැණීම්වලින් විවිධ හැඩවලින් යුත් කලාත්මක උළු කැට හමු වී තිබෙනවා. ඒ අනුව දේශීය වශයෙන් විකාශනය වූ එම උළු නිෂ්පාදන තාක්ෂණයේ අවසන් පුරුක වන්නේ අදටත් පැරණි ගොඩනැගිලිවල වහල මත දකින්නට ලැබෙන 'සිංහල උළු' කැටය.

වෙළෙඳපොළ ඉල්ලුම මත රැඳුණු උළු කර්මාන්ත ශාලා නිර්මාණය වන්නේ මින් පසුව. එහිදී මුල්කාලීන ව මෙරටට උළු නිෂ්පාදන ගෙන්වීම සිදුකර ඇත්තේ ඉන්දියාවෙන්. මෙරට පළමු උළු නිෂ්පාදන කර්මාන්තය ඉන්දියානු ජාතිකයකුගේ පෞද්ගලික ව්‍යවසායකත්වයකින් අම්පාර ප්‍රදේශයේදී ආරම්භ කර තිබෙනවා. අක්කර 232කින් යුත් එම කම්හල පසුකාලීන ව ලංකා පිඟන් සංස්ථාව වෙත පවරා ගැනුණා. මුලතිව්හි ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව ආරම්භ කරන්නේ 1968 වසරේදී. ඒ මාතර-යටියන, පුත්තලම-බංගදෙණිය, කුරුණෑගල-වෑ උඩ සහ අනුරාධපුර-ඇලයාපත්තුව යන උළු නිෂ්පාදන කම්හල් ද ඇතුළු ව චෙකොස්ලෝවැකියානු රාජ්‍ය විසින් පිරිනමන ලද ත්‍යාගයක් වශයෙන්. 1972 වසරේදී මේ කර්මාන්ත ශාලා 05 එතෙක් පාලනය කෙරුණු ජාතික සුළු කර්මාන්ත හා සංයුක්ත මණ්ඩලයෙන් ලංකා පිඟන් සංස්ථාව වෙත පවරා ගැනුණා. 1977 වසරේදී හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග උළු කර්මාන්තය සඳහා පෞද්ගලික අංශයට ප්‍රවේශ වීමට හැකියාව ලැබෙනවා. ලංකා පිඟන් සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දිනේෂ් සංජීව පවසන පරිදි ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව 1990 වසරේදී සංස්ථාවෙන් ඉවත් කර

2010 වර්ෂයේදී එය නැවතත් සංස්ථාවට පවරා ගැනීමෙන් පසුව 2015 වසර වනවිට කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමේ පළමු පියවර තැබුණා. 2025 වසර වන තෙක් එහි නඩත්තු සිදු කිරීමෙන් අනතුරු ව නිල වශයෙන් ආරම්භ කිරීම නොබෝද සිදු කෙරුණේ වසර 30කට පසුව.

මේ කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමේ අරමුණ වන්නේ සාමාන්‍ය ජනතාවට මිල දී ගත හැකි සාධාරණ මිලට දේශීය උළු නිෂ්පාදනය කිරීම. ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව මුලතිව් දිස්ත්‍රික්කයේ ආරම්භ වන පළමු වැනි රජයට අයත් කර්මාන්ත ශාලාව නිසා විශේෂිත වනවා. ඒ අනුව උතුරු ප්‍රදේශයේ පවතින රැකියා හිඟයට විසඳුමක් වශයෙන් රැකියා උත්පාදනයට මෙයින් ලැබෙන දායකත්වය ඉතා වැදගත්. මේ කර්මාන්ත ශාලාව වැඩිදියුණු කිරීමෙන් මුලතිව්, යාපනය, මන්නාරම, කිලිනොච්චිය ඇතුළු දිස්ත්‍රික්ක 05ක් ආවරණය වන පරිදි ප්‍රවාහන වියදම ඉතිරි කරමින් අවශ්‍ය උළු සැපයීමේ හැකියාව ලැබෙනවා. එමෙන් ම උතුරු ප්‍රදේශයේ කර්මාන්ත පුනරුදයක් ඇති කරමින් ජනතාවට ඒ ආශ්‍රිත ව සෘජු සහ වක්‍ර ආදායම් මාර්ග උත්පාදනය කර ඔවුන්ගේ ආර්ථිකය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් රජයේ අරමුණ වී ඇති බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දිනේෂ් සංජීව පවසනවා.

වසරේ වැඩි කාලයක් උතුරු ප්‍රදේශයට මුහුණදීමට සිදු වන අධික උෂ්ණත්වය නිසා නිවාසවල සෙවිලි මාධ්‍ය වශයෙන් උළු යෙදීම සිදු වන්නේ වැඩි වශයෙන්. එම නිසා ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාවට උතුරු ප්‍රදේශයේ ජනතාව අතර සාර්ථක වෙළෙඳපොළක් නිර්මාණය කර ගැනීමට ඇති හැකියාව ඉතාමත් ඉහළයි. මේ කර්මාන්ත ශාලාවෙන් ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වන සෙවිලි උළු, මුදුන් උළු, ඉංජිනේරු ගඩොල් සහ රස්නයට ඔරොත්තු දෙන සිදුරු සහිත ගඩොල් වෙළෙඳපොළට නිකුත් වන්නේ 'පාණ්ඩිය වන්දන්' නම් උතුරු ප්‍රදේශයට ආවේණික දෙවියකුගේ නාමය සහිත 'PV Tile' ලෙසින් නිසා ප්‍රදේශවාසීන් තුළ පවතින්නේ ද ප්‍රසාදයක්.

වසර ගණනාවකට පසුව නැවත විවෘත කිරීම නිසා පිළිසකර කිරීම් ගණනාවක් ද මෙහි සිදු කෙරුණා. එහිදී කර්මාන්ත ශාලාවේ නැවත භාවිත කිරීමට හැකියාව ඇති යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කර ඒවා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා එකතු කර ගැනුණා. ඒ අනුව මේ ව්‍යාපෘතියේ පළමු අදියර වන්නේ පවතින සම්පත් හා යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් සුදුසු නිෂ්පාදනයක් වෙළෙඳපොළට රැගෙන යාම. එයින් ලැබෙන ආදායමෙන් කර්මාන්ත ශාලාවේ ඉදිරි සංවර්ධනය සිදු කිරීමටත් අපේක්ෂිතයි. ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව සතුව දැනට පවතින සම්පත්වලින් දිනකට සෙවිලි උළු 5800ක්, සිදුරු ගඩොල් 3000ක් සහ ඉංජිනේරු ගඩොල් 8000ක් පමණ නිෂ්පාදනය කිරීමට හැකියාව තිබෙනවා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ අදහස වන්නේ මාස 06ක් ඇතුළත වෙළෙඳපොළට නිෂ්පාදනයක් නිකුත් කිරීමේ හැකියාව පවතින බව. කර්මාන්ත ශාලාවට අවශ්‍ය මූලික නිෂ්පාදන අමුද්‍රව්‍ය වන මැටි සහ දර සපයා ගැනීම ප්‍රදේශය අවටින් සිදු කෙරෙන බවත් ඔහු පවසනවා. ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව අවට ප්‍රදේශයේ පිහිටා ඇති වැව්වලින් නිෂ්පාදන සඳහා සුදුසු මැටි ලබා ගැනීමට හැකියාව තිබුණත් නිෂ්පාදනයට අවශ්‍ය සෙසු මෙවලම් ද්‍රව්‍ය, ප්‍රවාහන පහසුකම් යනාදිය ප්‍රදේශය අවටින් සපයා ගැනීමේදී පවතින්නේ සැලකිය යුතු අභියෝග ගණනාවනක්. ඇතැම් අවස්ථාවලදී යන්ත්‍රසූත්‍ර සඳහා අවශ්‍ය එම මෙවලම් කොළඹින් ගෙන්වා ගැනීමට පවා සිදුවන බව ද ඔහු පවසනවා.

වර්තමානය වන විට සෙවිලි මාධ්‍ය වශයෙන් ඇස්බැස්ටෝස් රැළි තහඩු, ගැල්වනයිස් රැළි තහඩු, ඇලුමිනියම්/ තුත්තනාගම් ආලේපිත රැළි තහඩු, කොන්ක්‍රීට් සෙවිලි උළු, වීදුරු තහඩු වැනි විවිධ වර්ගයේ ආදේශක උළු වෙනුවට වෙළෙඳපොළේ දක්නට ලැබෙනවා. එහෙත් පිළිස්සූ මැටි උළු නිෂ්පාදන සම්බන්ධයෙන් සහතික කළ හැකි සෞඛ්‍යාරක්ෂිත බව සහ පරිසර හිතකාමී බව මේ කිසිදු ආදේශකයකට සමාන කළ නොහැකියි. එසේ ම කලාත්මක වශයෙන් වැඩි වටිනාකමක් ලබා දෙමින් විවිධ හැඩතලවලින් නිර්මාණය වූ දේශීය උළු කැට වර්ග පවා වෙළෙඳපොළේ දැක ගැනීමට පුළුවන්.






ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව

# රන්මසු රකින ඔසු

රංගිකා අබේසේකර

දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා වාර්ෂික ව රජයට වැය වන්නේ විශාල මුදලක්. මේ නිසා එම මුදල් දේශීය ව ඉතිරි කර ගැනීමටත් ගුණාත්මක උසස් තත්ත්වයේ ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය ව නිෂ්පාදනයටත් රජයේ අවධානය යොමු වී තිබෙනවා. ඒ, ජාතික ඔසු වගා ව්‍යාපෘතිය සහ ඔසු එකතු කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවමින්. මේ ඔස්සේ ප්‍රජාවගේ ආර්ථිකය සවිමත් කිරීම, ව්‍යවසායකයන් බිහි කිරීම, විදේශ විනිමය රටේ රඳවා ගැනීම, නිමි ඖෂධ අපනයනය කර විදේශ විනිමය ලබා ගැනීම, දීර්ඝ කාලයක් රඳවා නොගත් උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය යොදාගත් ඖෂධ ජනතාවට පහසු මිලට ලබාදීම අරමුණු කෙරෙනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට අයත් ඔසු උයන් මූලික කර ගනිමින් 'ජාතික ඔසු වගා ව්‍යාපෘතියේ' සමාරම්භය නොබෝදා (මාර්තු 27) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය 'රන්දෙනිගම' ඔසු උයනේදී පැවැත්වුණා. ඒ අනුව ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සෘජු අධීක්ෂණය යටතේ එම සංස්ථාවට අයත් ඔසු උයන් 3ක් වාණිජමය ඔසු උයන් ලෙස සංවර්ධනය කිරීමට ද සැලසුම් කර තිබෙනවා. පාරම්පරික වෛද්‍යවරුන්, ආයුර්වේද සංරක්ෂණ සභා, ග්‍රාමීය ප්‍රජාමූල සංවිධාන, ඔසු ගොවියන් හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඇතුළු සියලු රාජ්‍ය ආයතන ඒකාබද්ධ ව පුළුල් වැඩපිළිවෙළක් ලෙස මේ ජාතික ඔසු වගා වැඩපිළිවෙළ දීප ව්‍යාප්ත ව ක්‍රියාත්මක කිරීමටයි සැලසුම් කර ඇත්තේ.

2024 වසරේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට පමණක් ඖෂධ ආනයනය සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 300ක්. එපමණ මුදලක් වියදම් කර ආනයනය කළ ද එම ඖෂධවල අන්තර්ගත බැරලෝහ ප්‍රතිශතය (Heavy metal content) පිළිබඳ තක්සේරුවක් නොමැති බවත් ඇතැම් පෞද්ගලික පාර්ශ්ව ඖෂධ ලෙස ආනයනය කර කුළුබඩු ලෙස විකුණන බවත් එයින් රජයට අමතර බදු ආදායමක් අහිමි වී යන බවත් ඉන්දියාවෙන් ගෙන්වන ආසන්නතම ඖෂධ නිශ්චිත ඖෂධ නොවන බවත් ඖෂධ වගා කිරීමේ හැකියාව ඇත්නම් මේ වැයවීම් වළක්වා ගැනීමට හැකි බවත් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ වෛද්‍ය එම්.ජේ. මාරසිංහ සඳහන් කරනවා.

මේ ව්‍යාපෘතියේ ප්‍රධාන සංකල්පයක් වන්නේ 'ගොවිපොළෙන් කර්මාන්තශාලාවට ඖෂධ ලබාගැනීම'. බොහෝ කාලයක් ගබඩාවල රඳවා තැබීමෙන් ඒ ඒ ඖෂධවල රසායනික සංයුතිය යම් ආකාරයකට වෙනස් වීමෙන් පසුව නිෂ්පාදන සඳහා යොදා ගැනීමට සිදුවීම නිසා ඖෂධවල ගුණාත්මක බව සහ ප්‍රමිතියේ අඩුවීමක් දැකගත හැකිවීම වර්තමානයේ පැන නැගී ඇති ප්‍රබල ගැටලුවක්. මෙරට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මීට වසර 10ක කාලයකට පෙර සිට තහනම් කර ඇති රසානික ද්‍රව්‍ය භාවිත කරමින් ඉන්දියාව වැනි රටවල ඖෂධ වගාකිරීම තවත් එක් ප්‍රබල ගැටලුවක් ව තිබෙන බවත් පරීක්ෂා



නිකවැරටිය 'රන්දෙනිගම' ඔසු උයනේ පැවති ජාතික ඔසු වගා ව්‍යාපෘතියේ සමාරම්භය

කිරීම්වලට අනුව ඇතැම් ඖෂධවල බැරලෝහ ප්‍රතිශතය තිබිය යුතු අගයට වඩා විසි ගුණයකටත් වඩා වැඩි අගයක් ගන්නා බවත් වෛද්‍ය එම්.ජේ. මාරසිංහ මතු කරන කාරණයක්.

'ගොවිපොළෙන් කර්මාන්ත ශාලාවට' යන සංකල්පය පිළිබඳ පැහැදිලි කරන වෛද්‍ය එම්.ජේ.මාරසිංහ; "අප ආයතනය සතු ව ඔසු උයන් තිබෙනවා. මේවායේ ඖෂධ නිෂ්පාදනය කරන්නේ කාබනික වගාවක් ලෙස. ඒ අනුව ජාතික ඔසු වගා ව්‍යාපෘතිය ඔස්සේ වගා කිරීමේ අවස්ථා පුළුල් කිරීමේ අවකාශය තිබෙනවා. එසේ ම මේ ව්‍යාපෘතිය නිසා අමුද්‍රව්‍යවලට සිදුවන අතරමැදි හානි වළක්වා ගැනීමටත් විශාල කාලයක් ගබඩාවල රඳවාගැනීම සීමා කිරීමටත් කෘමිනාශක වැනි දේ ඖෂධවලට එක්වීම වැළැක්වීමත් කාලය ඉකුත් වීමකින් තොර ව භාවිතයට ගැනීමේ හැකියාවත් කාබනික අමුද්‍රව්‍ය ලෙස තහවුරු කිරීමටත් හැකියාව තිබෙනවා".

අමුද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීම ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ලෙස මුහුණදෙන ප්‍රධාන ගැටලුවක්. වෛද්‍ය එම්.ජේ.මාරසිංහ සඳහන් කරන පරිදි මේ නිසා ඖෂධ නිෂ්පාදනයට විශාල කාලයක් බලා සිටීමට සිදුවීම අවාසියක්. සම්පූර්ණ අමුද්‍රව්‍ය නොමැති ව කිසිම අවස්ථාවක ඖෂධයක් නිෂ්පාදනය කරන්නේ නැති නිසා නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමාද සිදු වීමත් නොවැළැක්විය හැකි කාරණයක්. එවිට රෝගීන්ට නිශ්චිත කාලයට ඖෂධ සැපයීමට නොහැකි වනවා. ඔසු එකතු කිරීමේ මධ්‍යස්ථාන හෝ ඔසු උයන් ඔස්සේ මේ ක්‍රියාවලිය අඛණ්ඩ ව සිදු කිරීමෙන් එම ගැටලුව මඟ හරවා ගැනීමට හැකිවනු ඇති බවත් ඒ ඔස්සේ ප්‍රමිතියෙන් යුතු ඖෂධ නිසි වේලාවට, දැනට පවතින මිලට සාපේක්ෂ ව 40%ක් හෝ 50%ක් අඩුවෙන් රෝගීන්ට ලබාදීමට අවකාශ හිමි වනු ඇති බවත් ඔහු අවධාරණය කරනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ඖෂධ නිෂ්පාදනය සඳහා 2024 වසරේ වෙන්කර තිබූ මුදල මිලියන 1000ක්. 2025 වසර සඳහා වෙන්කර ඇත්තේ මිලියන 2000ක මුදලක්. වෛද්‍ය එම්.ජේ.මාරසිංහ සඳහන් කරන්නේ මිලියන 2000ක් වෙන් වන විට ඒ අනුව අමුද්‍රව්‍ය අවශ්‍යතාව ද දෙගුණයකට ආසන්න ව තිබෙන බව. එහෙත් මේ ජාතික ඔසු වගා ව්‍යාපෘතිය නිසා අමුද්‍රව්‍ය සඳහා යන වියදම අවම කර ගැනීමට හැකියාව ලැබීම ඉතා වැදගත්. විශේෂයෙන් ඖෂධ වගා කර ගැනීමෙන් සහ ග්‍රාමීය ප්‍රදේශවල අපතේ යන අරළු, බුළු, නාමල් වැනි බොහෝ ඖෂධ එකතු කර ගැනීමෙන් ඊට පිළියම් සොයා ගත හැකියි.

ග්‍රාමීය මට්ටමේදී ඖෂධ වර්ග හඳුනා නොගැනීම, ඒ සඳහා නිසි වෙළෙඳපොළක් නොමැතිකම ඖෂධ අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අපතේ යාමට හේතු වනවා. ඒවා හරවත් නිෂ්පාදන කාර්යයකට දායක කර ගැනීමෙන් නිශ්චිත අමුද්‍රව්‍ය ප්‍රමාණයක් රටේ ඖෂධ නිෂ්පාදනයට ලැබෙනවා පමණක් නොව ඉන් ග්‍රාමීය ආර්ථිකයට ලැබෙන්නේ ද ඉහළ පිටුවහලක්. මේ ව්‍යාපෘති ඔස්සේ ව්‍යවසායකයන් බිහි කිරීමත් අරමුණක්. එහිදී ඖෂධ සඳහා ව්‍යවසායක කණ්ඩායමක් සකසා ගැනීමට හැකියාව ලැබීමෙන් නිශ්චිත සැපයුම් ජාලයක් සකසා ගැනීමට හැකි වනු ඇති

ඖෂධ නිෂ්පාදනය කරන බොහෝ රටවල් ඉදිරියේදී අමුද්‍රව්‍ය වශයෙන් ඖෂධ ලබාදීමක් සිදු නොකරනු ඇත්තේ ඖෂධ ආශ්‍රිත නිමි ඖෂධ නිෂ්පාදනය කර අගය එකතු කර අපනයන කිරීමට. ඒ, ඊට ඉහළ වටිනාකමක් හිමිවන බැවින්. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන කළමනාකාර අධ්‍යක්ෂවරයා; "ඉදිරි වසර 5-10 ඇතුළත ආනයනික අමුද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වන නිසා ඒ සඳහා රටේ ඖෂධ නිෂ්පාදනය කරන නිශ්චිත ව්‍යවසායකයන් සංඛ්‍යාවක් බිහි කර ගත යුතුයි. ඖෂධ සඳහා අමුද්‍රව්‍ය රටේ වගා නොකළහොත් විශාල ගැටලුවකට මුහුණපෑමට සිදු වනවා. අගය එකතු කළ ඖෂධ ආනයනය කිරීමට විශාල පිරිවැයක් දැරිය යුතුයි. ඒ සඳහා අමුද්‍රව්‍යවල මිල මෙන් 10 ගුණයක් වැය වනවා. එය අපට කළ නොහැක්කක්.

වර්තමානයේ බෙලි, තොටිල වැනි මධ්‍යකාලීන ඖෂධ නෙළා ගැනීම පමණයි සිදුවන්නේ. එහෙත් ඒවා යළි රෝපණ අවශ්‍යතාවක් තිබෙනවා. නැතහොත් එම ඖෂධ වඳ වී යන්නට පුළුවන්. එවිට වන්නේ පරිසරයේ තිරසර බව ක්‍රමක්‍රමයෙන් ඉවත් ව යාම. මේ නිසා ඉවත් කරගන්නා ශාකවලට සමාන ශාක සංඛ්‍යාවක් රෝපණය කිරීම වැදගත්.

නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඖෂධවලින් 60%කට වඩා වැඩි ප්‍රමාණයක් වර්තමානය වන විට ආනයනය කරනවා. ශ්‍රී ලංකාව ඖෂධ අමුද්‍රව්‍ය ලබාගන්නේ ඉන්දියාවෙන්, චීනයෙන් සහ ඕස්ට්‍රේලියාවෙන් (මී පැණි). ඊට අමතර ව කාශ්මීරයෙන් (සහිඳ ලුණු) අමුද්‍රව්‍ය ලබා ගන්නවා. පාකිස්තානය ඇතුළු අරාබි රටවලින් යුනානි ඖෂධ සඳහා අමුද්‍රව්‍ය සපයා ගන්නවා. මේ ව්‍යාපෘති ඔස්සේ එය 40%ක් පහත හෙළීමට හැකිවනු ඇති බවයි වෛද්‍ය එම්.ජේ.මාරසිංහ ප්‍රකාශ කරන්නේ. ඔහු පවසන ආකාරයට මේ වන විට ඉගුරු වගා කළත් වියළි ඉගුරු ලබා ගැනීමට නිශ්චිත තාක්ෂණයක් අපට නැහැ. ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගන්නෝරුව පර්යේෂණ ආයතනය සමග සාකච්ඡා කර සුදුසු ක්‍රමවේදයක් සකසා ගැනීමට අපේක්ෂා කරන බව ඔහු පවසනවා. එවිට ඉගුරු ආනයනය අවශ්‍ය වන්නේ නැහැ. ඖෂධ අමුද්‍රව්‍යයක් නෙළාගෙන මාස 6කට පෙර එය භාවිතයට ගැනීමත් වැදගත්. එනම් ඖෂධ අමුද්‍රව්‍යවල ප්‍රමිතිය පවත්වා ගැනීමත් කළ යුත්තක්.

ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ඖෂධ ප්‍රමාණය 5%ක්. මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමෙන් එය 20%ක් දක්වා ඉහළ ගෙන ඒමට ද හැකි වනු ඇති. ඒ අනුව අගය එකතු කළ නිමි ඖෂධ ඉදිරියේදී අපනයනයෙන් විදේශ විනිමය ඉපැයීමටත් අවස්ථාව සැලසෙනු ඇති.


> ජාතික ඔසු වගා ව්‍යාපෘතිය ඔස්සේ වගා කිරීමේ අවස්ථා පුළුල් කිරීමේ අවකාශය තිබෙනවා. එසේ ම මේ ව්‍යාපෘතිය නිසා අමුද්‍රව්‍යවලට සිදුවන අතරමැදි හානි වළක්වා ගැනීමටත් විශාල කාලයක් ගබඩාවල රඳවාගැනීම සීමා කිරීමටත් කෘමිනාශක වැනි දේ ඖෂධවලට එක්වීම වැළැක්වීමත් කාලය ඉකුත් වීමකින් තොර ව භාවිතයට ගැනීමේ හැකියාවත් කාබනික අමුද්‍රව්‍ය ලෙස තහවුරු කිරීමටත් හැකියාව තිබෙනවා



# තහනම ඉවතට වාහන මෙරටට

**දීප්ත කුමාර බටගොඩ**

කොවිඩ්-19 වසංගතය සහ ගෝලීය සැපයුම් දාම බාධා හේතුවෙන් උග්‍ර වූ ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ අර්බුදයට ප්‍රතිචාර වශයෙන් වාහන ආනයනය තාවකාලික ව අත්හිටුවීමට එවකට ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයකට එළැඹුණා. ආර්ථිකය යථාවත් කර ගැනීම සහ විදේශ විනිමය සංචිත කළමනාකරණය අරමුණු කරගත් මේ තීරණය නිසා පාරිභෝගිකයන්ට, ව්‍යාපාරවලට සහ මෝටර් රථ කර්මාන්තයට එල්ල වූයේ දැඩි බලපෑමක්.

වේගයෙන් අවප්‍රමාණය වන මුදල් ඒකකයක් සහ හැකිළෙන විදේශ සංචිත සමග වාහන ඇතුළු සුඛෝපභෝගී පාරිභෝගික භාණ්ඩවලට වඩා අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනයට ප්‍රමුඛත්වය දීමටයි මෙහිදී රජය ක්‍රියා කළේ. එහි ප්‍රතිඵලයක් ලෙස අලෙවි නියෝජිත ආයතනවල විකුණුම් තියුණු ලෙස පහත වැටීමක් සහ වාහන මිලදී ගැනීමට උත්සාහ කරන පුද්ගලයන්ට දැඩි දුෂ්කරතාවලට මුහුණපෑමට සිදු වුණා. වාහන ඉල්ලුම්කරුවන්ට විකල්ප භාවිත සඳහා පෙළඹීමට සිදු වූ නිසා භාවිත කළ වාහන මිල ගණන් ඉහළ ගියේ ඉතා විශාල ලෙස. වාහන ආනයනය අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස අලෙවිකරුවන්ගේ ආදායම පහත වැටීම හා පිරිවැය ඉහළ යාම නිසා කාර්ය මණ්ඩල කප්පාදු කිරීම් හා ආර්ථිකයේ අනෙකුත් කර්මාන්තවල ගැටලු ඇති කර තිබුණා. මෝටර් රථ නඩත්තුව, කොටස් සැපයුම, රක්ෂණය සහ මූල්‍යකරණයට අදාළ අංශවලට මේ නිසා එල්ල වූයේ දැඩි බලපෑමක්. සමෘද්ධිමත් මෝටර් රථ වෙළෙඳපොළක් සාමාන්‍යයෙන් බොහෝ රැකියා සහ දේශීය ව්‍යාපාර සඳහා සහය වන අතර ඒ සියල්ලට ම වාහන ආනයනය අත්හිටුවීම සෘණාත්මක ලෙස බලපා තිබුණා.

> වාහන ආනයනය අත්හිටුවීම පිටුපස ඇති තාර්කිකත්වය, එහි බලපෑම් සහ තහනම ක්‍රමයෙන් ඉවත් කිරීම සඳහා වන විභව උපාය මාර්ග පිළිබඳ ව රජය සැලකිලිමත් වී ඇති බව කාණ්ඩ තුනක් යටතේ, යම් යම් කොන්දේසි සහිත ව ආනයනයට අවසර ලබා දීමෙන් පැහැදිලි වනවා. එහිදී වාහන ආනයනය සඳහා බදු අය කිරීමේ සිට ඒ සඳහා වැය කෙරෙන මුදල් සීමා පනවා තිබීම විශේෂිත කාරණා. මේ ඔස්සේ රට යථා තත්ත්වයට පත්වීමෙන් පසුව සංවර්ධන මාවතේ ගමන් කරන විට විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමත් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමත් යන ද්විත්ව අරමුණු අතර සමතුලිතතාවක් ඇති කර ගැනීමට රජය ක්‍රියා කර තිබෙන බව පැහැදිලි වන්නක්.

ශ්‍රී ලංකා ආර්ථිකයේ තත්ත්වය වඩාත් යහපත් හා යම් මට්ටමක ස්ථාවර තත්ත්වයකට එළඹීමෙන් පසුව, රජය වඩාත් නම්‍යශීලී වෙමින් වාහන ආනයන ප්‍රතිපත්තියක අවශ්‍යතාව හඳුනා ගත්තා. වාහන ආනයනය සඳහා තීරණයට එළඹුණේ ඒ හේතුවෙන් නැවතත් රට විදෙස් සංචිත හිඟයකට මුහුණදීමට සිදු නොවන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව සමග සාකච්ඡා කිරීමෙන් පසුව බවයි ජනාධිපතිවරයා අය වැය ඉදිරිපත් කරමින් පැවසුවේ. වාහන ආනයනයට ලබා දුන් අවසරය පුද්ගලික සහ වාණිජ ප්‍රවාහනය සඳහා ඇති ඉල්ලුම සපුරාලීම පමණක් නොව, පුළුල් ආර්ථික ප්‍රතිසාධන ඉලක්ක සමග ද සමපාත වන බවයි බොහෝදෙනකුගේ අදහස.

අතිවිශේෂ ගැසට් පත්‍රයකින් වාහන ආනයනයට අවසර ලැබුණු අතර මගී ප්‍රවාහනය සඳහා වන වාහන ආනයනයට 2024 දෙසැම්බර් 14 දින සිටත් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන සහ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වාහන වශයෙන් කාණ්ඩ දෙකක වාහන ආනයනය සඳහා 2025 පෙබරවාරි 01 දින සිටත් අවසර ලැබී තිබෙනවා. ඒ අනුව අනයනය කෙරෙන අලුත් ම වාහන තොගය මෙරටට ලැබුණේ පෙබරවාරි 01 දින.

වාහන ආනයනය අත්හිටුවීම පිටුපස ඇති තාර්කිකත්වය, එහි බලපෑම් සහ තහනම ක්‍රමයෙන් ඉවත් කිරීම සඳහා වන විභව උපාය මාර්ග පිළිබඳ ව රජය සැලකිලිමත් වී ඇති බව කාණ්ඩ තුනක් යටතේ, යම් යම් කොන්දේසි සහිත ව ආනයනයට අවසර ලබා දීමෙන් පැහැදිලි වනවා. එහිදී වාහන ආනයනය සඳහා බදු අය කිරීමේ සිට ඒ සඳහා වැය කෙරෙන මුදල් සීමා පනවා තිබීම විශේෂිත කාරණා. මේ ඔස්සේ රට යථා තත්ත්වයට පත්වීමෙන්

පසුව සංවර්ධන මාවතේ ගමන් කරන විට විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමත් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමත් යන ද්විත්ව අරමුණු අතර සමතුලිතතාවක් ඇති කර ගැනීමට රජය ක්‍රියා කර තිබෙන බව පැහැදිලි වන්නක්. "අප වසර 05ක් බලාගෙන සිටියා. යම් යම් කොන්දේසි යටතේ වුවත් වාහන ආනයන තහනම ඉවත් කිරීමට රජය ගෙන ඇති තීරණය පැසසිය යුතුයි. අප දන්නවා රට පැවතුණේ අර්බුදයක. තහනම ඉවත් කිරීමේදී පෙර පැවති ආකාරයට ක්ෂණික ව ම ගමන් කරන්නට බැහැ. එය ක්‍රමක්‍රමයෙන් යා යුතු ගමනක්. ආනයන සඳහා පනවා ඇති මූල්‍යමය සීමාව වුවත් ප්‍රමාණාත්මක ව සෑහෙනවා. ආනයනය කරන වාහන මාස තුනක් ඇතුළත අලෙවි කළ යුතුයි. නැතහොත් සියයට 3ක ප්‍රමාද ගාස්තුවක් අය වනවා. තහනම ඉවත් කිරීම නිසා වාහන ආනයනය මත යැපුණු ආර්ථිකයේ විවිධ පුද්ගලයන් සහ ආයතනවල යථාවත් වීමක් සිදු වන්නට පුළුවන්." වාහන ආනයනකරුවන්ගේ සංගමයේ සභාපති ප්‍රසාද් මානගේ පවසන්නේ එලෙස.

වාහන ආනයනය පදනම් කර ගනිමින් ආර්ථිකයේ ක්‍රියාත්මක වූ ආයතනික පද්ධතියේ බිඳ වැටීමක් මෙන් ම එකී අංශයේ සේවා වියුක්තිය හා ආදායම් අඩු වීමක් ද සිදු වුණා. වාහන ආනයනය වක්‍ර ව බලපෑම් කරන සංචාරක අංශය වැනි ක්ෂේත්‍රවල ද අපේක්ෂිත වර්ධනය ළඟා කර ගැනීමේ ගැටලුවලට මුහුණපෑමට ද සිදු වුණා.

වාහන ආයනයන සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමත් සමග බලපෑම ඇති වන්නේ තහනම නිසා ක්ෂණික ව ම බිඳ වැටුණු ක්ෂේත්‍රවල. මේ නිසා වාහනවල මිල ගණන්වල වෙනසක් ඇති වන්නට ද පුළුවන්. මේ පිළිබඳ අදහස් දක්වන වාහන ආනයනකරුවන්ගේ සභාපති ප්‍රසාද් මානගේ; "සමස්තයක් ලෙස ගත් විට වාහනවල මිල ගණන් පහළ යාමක් අපේක්ෂා කරන්නට පුළුවන්. නමුත් එය කාලයට සාපේක්ෂයි. 2024 වර්ෂය අවසානයේ වාහන මිල ගණන් සමග සැසඳුවහොත් මේ මිල පහළ යාම ඉදිරියේදී නිරීක්ෂණය කිරීමේ හැකියාව තිබෙනවා. 2019 වර්ෂයට පෙර පැවති වාහන මිල ගණන්වලටත් වඩා මිල පහළ යාමක් අපේක්ෂා කරන්න බැහැ. සෑම දෙයක් ම මිල ගණන් මත පමණක් පදනම් ව අගය තීරණය කළ යුතු නැහැ. අද මේ තහනම ඉවත් නොවුණානම් 2025 වසර අවසානය වන විට වාහන මිල ගණන් තවත් ඉහළ යාමේ හැකියාවක් තිබෙනවා. අලුත් වාහනයක් මිල දී ගැනීමට පාරිභෝගිකයාට අවස්ථාවක් ලැබී තිබෙන්නේ වසර 05කට පසුව. එය සතුටු විය හැකි කාරණයක්."

වාහන ආනයනයත් සමග දේශීය වෙළෙඳපොළේ භාවිත කළ වාහනවල මිල ගණන් ද ඉදිරියේදී පහළ යනු ඇතැයි යන්නයි බොහෝදෙනාගේ මතය. ආර්ථිකයේ යටිතල පහසුකම් වැඩිදියුණු වීමෙන් විවිධ අංශවලට ධනාත්මක බලපෑමක් සිදු වනු ඇති. පොදු මගී ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය ඇතුළු අනෙකුත් කර්මාන්තවල මගී හා භාණ්ඩ ප්‍රවාහනයේදී මෙතෙක් තිබූ ගැටලු යම් ආකාරයකින් සමනය වීමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කරන්න පුළුවන්.

2025 අයවැය කථාව ඉදිරිපත් කරමින් ජනාධිපතිවරයා පැවසුවේ වාහන ආනයන තහනම ඉවත් කිරීමෙන් රජය සැලකිය යුතු ප්‍රමාණයක රාජ්‍ය ආදායමක් අපේක්ෂා කරන බවක්. මේ නිසා වාහන ආනයන තහනම ඉවත් කිරීමෙන් රජයේ ආදායම යම් ආකාරයකින් අපේක්ෂිත ලෙස ඉහළ යනු ඇති. එය වාහන වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය මත තීරණය වන්නක්. බොහෝ විද්වතුන් අදහස් දක්වා ඇත්තේ අපේක්ෂිත ආකාරයෙන් රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමට නම් රාජ්‍ය ආයතනවල කාර්යක්ෂතාව පවතිනවාට වඩා ඉහළ මට්ටමක පවත්වා ගත යුතු බව. විශේෂයෙන් වාහන ආනයනයේදී ශ්‍රී ලංකා රේගුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඔවුන් විශේෂයෙන් අදහස් දක්වා තිබුණා. ප්‍රමාදයකින් තොර ව වාහන ආනයන කිරීමේදී ශ්‍රී ලංකා රේගුවේ කාර්යභාරය ඉතා වැදගත්.

සමස්තයක් ලෙස ගත් විට වාහනවල මිල ගණන් පහළ යාමක් අපේක්ෂා කරන්නට පුළුවන්. නමුත් එය කාලයට සාපේක්ෂයි. 2024 වර්ෂය අවසානයේ වාහන මිල ගණන් සමග සැසඳුවහොත් මේ මිල පහළ යාම ඉදිරියේදී නිරීක්ෂණය කිරීමේ හැකියාව තිබෙනවා. 2019 වර්ෂයට පෙර පැවති වාහන මිල ගණන්වලටත් වඩා මිල පහළ යාමක් අපේක්ෂා කරන්න බැහැ.

වාහන ආනයනය සඳහා ඩොලර් බිලියනයක පමණ සීමාවක් පනවා තිබුණත් වාහන ආනයන තහනම ඉවත් කිරීම නිසා නැවතත් රටට විදේශ සංචිත හිගයකට මුහුණපෑමට සිදු වනු ඇත් ද යන්න සමාජය විමසන පැනයක්. වාහන ආනයනය සඳහා විදේශ සංචිත භාවිත නොකළත් බැංකු පද්ධතිය ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය ලබා ගැනීමේදී යම් බලපෑමක් සිදු වේ යැයි ද ඇතැමුන් මත පළ කර තිබුණා. නමුත් බැංකු පද්ධතියේ පවතින විදේශ විනිමය භාවිතයේ සීමා පැනවීමට අමතර ව වාහන ආනයනය නිසා ආර්ථිකයට සිදු වන ධනාත්මක බලපෑම මෙහිදී සැලකිල්ලට භාජනය කර තිබුණේ නැහැ. ආර්ථිකයේ වර්ධනයක් අපේක්ෂා කරන රටකට දිගින් දිගට ම වාහන ආනයනය නොකර සිටීමෙන් තවත් ගැටලු රාශියකට මුහුණපෑමට සිදු වනවා. ප්‍රවාහන කාර්යක්ෂමතාව රටක නිෂ්පාදනයේ වර්ධනයට ඍජු ව ම බලපාන සාධකයක්. නිෂ්පාදනයේ වර්ධනයෙන් ජාතික ආදායම ඉහළ යන අතර රටක විදේශ විනිමය උත්පාදන මාර්ගවල දියුණුවීමක් හා පුළුල්වීමක් ද සිදු වනවා. මේ නිසා සිදු කළ යුතු වන්නේ වාහන ආනයන තහනම අඛණ්ඩ ව පවත්වාගෙන යාම නොව වාහන ආනයනය රටේ සංවර්ධන සැලසුම් සමග ඒකාබද්ධ වන අයුරින් සහ එයට ගැළපෙන අයුරින් සිදු කිරීම.



# අස්පර්ශනීය උරුමයක උරුමය

බාහිර කථිකාචාර්ය
**නාලක ජයසේන**

ව්‍යවහාර වර්ෂ ක්‍රමය ප්‍රකාර ව වසරක් ආරම්භ වන්නේ ජනවාරි මාසයෙන්. එහෙත් සිංහල මාස ක්‍රමයට අනුව වසරක් ඇරඹෙන්නේ අප්‍රේල් හෙවත් බක් මාසයෙන්. බක් මාසය සිංහලයාට තවත් එක් මාසයක් පමණක් නොවෙයි. එය වසරක් ගෙවී නව වසරක් උදා වන මාසයක්. පැරණි වසරට සමු දී නව වසර පිළිගන්නට ශ්‍රී ලාංකිකයන් අපූරු ක්‍රමවේදයක් අනුගමනය කරනවා. ඒ, ලෝකයට ජීවය දෙන සූර්යයාගේ අහස් ගමනට අදාළ ව ජ්‍යෝතිර්විද්‍යාත්මක සංසිද්ධියක් පාදක කරගෙන අලුත් මාසයට ගැළපෙන සංස්කෘතික උලෙළක් පැවැත්වීමෙන්.

ජ්‍යෝතිර්විද්‍යාත්මක ව අහස රාශි හෙවත් කලාප දොළසකට බෙදා ඒ ඒ කලාපවල ඇති තරු රටා සැලකිල්ලට ගනිමින් ඒවාට නම් දොළසක් ලබා දී තිබෙනවා. ඒ අනුව සූර්යයා මීන නමැති රාශියෙන් මේෂ නමැති රාශියට ගමන් ගන්නේ බක් මාසයේදී. අහසේ ඒ අපූරු සිද්ධිය සිදුවෙද්දී පොළොවේ ද වෙනස්කම් සිදු වනවා. කෘෂිකර්මාන්තයට අනුව මහ කන්නයේ අස්වනු නෙළන සමය වන මේ කාලයේ අලුත් සහල් නෙළා ගැනීමත් පරිසරයේ නැවුම් පිබිදීමත් දක්නට පුළුවන්. අහසේ හා පොළොවේ සිදු වන මේ විපර්යාසය ද පාදක කරගන්නා මිනිසුන් ඒ සමග ම තම ගතත් සිතත් අලුත් කරන්නා අටියෙන් සිංහල හා දෙමළ අවුරුදු උලෙළ පවත්වනවා. එදා එය හැඳින්වූයේ 'කෝණ මංගල්‍යය' යනුවෙන්. ඊට හේතුව ජ්‍යෝතිර්විද්‍යාත්මක ව බලන කල සිංහල වර්ෂ ක්‍රමයට අනුව පළමු කෝණ මාසය අවසන් වන්නේ සිංහල හා දෙමළ අවුරුද්දත් සමගින් වීම.

අහසේ හිරු දේවත්වයට නගා පුදන මේ සැණකෙළිය සංස්කෘතික මහෝත්සවයක් වන්නේ අනාදිමත් කාලයක පටන් පැවතෙන සිරිත් විරිත් මෙන් ම පිළිවෙත් හා තහංචි සමූහයක් ද සමගින්. එනයින් ගත් කල සිංහල හා දෙමළ අවුරුද්ද වනාහි සංස්කෘතික උරුමයක්. සංස්කෘතික උරුමයක් යනු සරල ව අතීතයේ පටන් සංස්කෘතික ව පැවත එන ක්‍රියාදාමයක්. ලොව සංස්කෘතික උරුමවල ඇති ස්වභාවය අනුව එය ප්‍රභේද දෙකකට බෙදා දක්වන්නට පුළුවන්. ඒ, ස්පර්ශ සංස්කෘතික උරුම (Tangible Cultural Heritage) හා අස්පර්ශ සංස්කෘතික උරුම ( Intangible Cultural Heritage) වශයෙන්. ස්පර්ශ සංස්කෘතික උරුම භෞතික ව අල්ලා බැලිය හැකි අතර ඇසට හා කනට සෘජු ව ගෝචර වනවා. නිදසුනක් ලෙස සීගිරිය නම් මහා සංස්කෘතික උරුමය දක්වන්න පුළුවන්. අස්පර්ශ සංස්කෘතික උරුම යනු අතින් අල්ලා බැලිය නොහැකි, සංකල්පීමය වශයෙන් සංස්කෘතික ප්‍රවාහයට අයත් උරුම. සිංහල හා දෙමළ අවුරුද්ද යනු අස්පර්ශ සංස්කෘතික උරුමයක්. සිංහල හා දෙමළ අවුරුද්දට පිසින කැවුම් කොකිස්, වයන රබන්, බඳින උන්චිල්ලා, නැගම් යාම, වැඩිහිටියන් පිදීම, ලිප් බැඳ ගිනි මෙලවීම, නැකතට ආහාර අනුභවය ඇසට පෙනුණත් කනට ඇසුණත් ඒවායේ සංකල්පීමය අර්ථය අස්පර්ශනීයයි.

> සිංහල හා දෙමළ අවුරුද්ද යනු ජ්‍යෝතිර්විද්‍යාත්මක ව සුබ මොහොත හෙවත් සුබ නැකත සංකල්ප මුල් කරගෙන සමරන උලෙළක්. මේ නැකත පිළිබඳ ජනශ්‍රැතිය පවා අස්පර්ශ සංස්කෘතික උරුමයක්. සිංහල හා දෙමළ අවුරුද්දට එදා අනුගමනය කළ මුල් ම නැකත වූයේ තෙල් වළං ලිප තැබීමේ නැකත. එය අද වන විට වියැකී ගොසින්. එපමණක් නොව එදා තෙල් වළං ලිප තැබීමේදී කැවිලි පිසීමට පෙර ඊට ආධාර වන උපකරණ තුන වන තෙල් හැන්ද, කූර හා පත්ත තෙල් වළඳෙහි ත්‍රිකෝණාකාර ව තබා රත්කර ගැනීම සිදු කෙරුණා. අද වන විට එය දැකිය හැක්කේ වැඩිහිටි අය කිහිපදෙනෙකු අතරේ පමණයි.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය ද අස්පර්ශ සංස්කෘතික උරුම කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනවා. මක්නිසාදයත් ස්පර්ශ සංස්කෘතික උරුමවලට සාපේක්ෂ ව අස්පර්ශ සංස්කෘතික උරුම ගෝලීයකරණය හමුවේ වේගයෙන් වියැකී යා හැකි බැවින්. යුනෙස්කෝ සංවිධානයට අනුව අස්පර්ශ සංස්කෘතික උරුමවල මූලික සහලක්ෂණ හතරක් තිබෙනවා. සාම්ප්‍රදායික වීම, සමකාලීන වීම හා එක ම කාලයක සජීව වීම පළමු සහලක්ෂණය. දෙවැන්න අන්‍යෝන්‍ය වශයෙන් අන්තර්ග්‍රහණය වීම. තෙවැන්න පරපුරෙන් පරපුරට සංස්කෘතිය නියෝජනය වීම වන අතර ප්‍රජා පාදක වීමයි සිව් වැනි සහලක්ෂණය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2003 ඔක්තෝබර් මස 17 දින පැරිසියේදී අස්පර්ශ සංස්කෘතික උරුම ආරක්ෂණ ප්‍රඥප්තිය පිහිටුවන ලද අතර එහි අර්ථදැක්වීමට අනුව ආකාර පහක

ප්‍රපංච අස්පර්ශ සංස්කෘතික උරුම යටතේ වර්ගීකරණය කර තිබෙනවා. ඒ, වාචික සම්ප්‍රදාය හා ප්‍රකාශන, දෘශ්‍ය කලා, සමාජ භාවිතය අභිචාර සහ සැණකෙළි අවස්ථා, ස්වභාවධර්මය හා විශ්වය පිළිබඳ දැනුම සහ භාවිතය, සාම්ප්‍රදායික කලාශිල්ප ආදී වශයෙන්.

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද විෂයක ඉහත නිර්වචන ගැළපීමේදී එහි අස්පර්ශ සංස්කෘතික උරුමයකට අයත්වන සිව්විධ ගුණාංග ම අන්තර්ගත වන බවත් අස්පර්ශ සංස්කෘතික උරුම යටතේ ඇති අංග සියල්ලක් ම පාහේ අවුරුද්දෙහි දැකිය හැකි බවත් පැහැදිලි වනවා. සිංහල හා දෙමළ අලුත් අවුරුදේ අස්පර්ශ සංස්කෘතික උරුමය පිළිබඳ සාකච්ඡාවේදී වැදගත් වන කරුණක් වන්නේ සිංහල හා දෙමළ අවුරුද්දට අදාළ ව සාම්ප්‍රදායානුකූල ව උරුම වූ එහෙත් කාලයත් සමග වියැකී යන පිළිවෙත් සංරක්ෂණය සහ යළිබලගැන්වීම.

සිංහල හා දෙමළ අවුරුද්ද යනු ජ්‍යෝතිර්විද්‍යාත්මක ව සුබ මොහොත හෙවත් සුබ නැකත සංකල්ප මුල් කරගෙන සමරන උලෙළක්. මේ නැකත පිළිබඳ ජනඥානය පවා අස්පර්ශ සංස්කෘතික උරුමයක්. සිංහල හා දෙමළ අවුරුද්දට එදා අනුගමනය කළ මුල් ම නැකත වූයේ තෙල් වළං ලිප තැබීමේ නැකත. එය අද වන විට වියැකී ගොසින්. එපමණක් නොව එදා තෙල් වළං ලිප තැබීමේදී කැවිලි පිසීමට පෙර ඊට ආධාර වන උපකරණ තුන වන තෙල් හැන්ද, කුර හා පත්ත තෙල් වළඳෙහි ත්‍රිකෝණාකාර ව තබා රත්කර ගැනීම සිදු කෙරුණා. අද වන විට එය දැකිය හැක්කේ වැඩිහිටි අය කිහිපදෙනෙකු අතරේ පමණයි. එපමණක් නොව තෙල් වළං ලිප තබා පිසින පළමු කැවුම 'කෝඳුරු කැවුම' ලෙස කෝඳුරුවන්ට වෙන් කොට නිවසේ වහලේ එල්ලීම හා එම කැවුම් තැම්බීමට යොදා ගන්නා 'යොදය' නමින් හැඳින්වෙන කැවුමට අදාළ මිශ්‍රණය (සීනි පැණි හා හාල්පිටි ආදිය) කෝඳුරුවන්ට 'හාල් කිරි' නමින් වෙන් කොට වහලේ තැබීම එදා දක්නට ලැබුණා. එසේ කළහොත් 'කෝණම් කැවිලි' නමින් හැඳින්වූ අවුරුදු කැවිලි පෙවිලිවලට කෘමිසතුන්ගෙන් හානි නොවන බවට ජනවිශ්වාසය තිබුණා. එම ක්‍රියාකාරකම සමග ප්‍රකට වුණේ මිනිසා පරිසරය හා සත්ත්වයා අතර තිබූ අන්‍යෝන්‍ය සහසම්බන්ධය පිළිබඳ අස්පර්ශ සංස්කෘතික ඥානය.

සිංහල හා දෙමළ අවුරුද්දේ සාම්ප්‍රදායික වීම සමකාලීන වීම හා එක ම කාලයක සජීව වීම යන අස්පර්ශ සංස්කෘතිකාංග සහලක්ෂණය දැකිය හැකි අදටත් ජීවමාන සාධකයක් වන්නේ දිය සමග ගනුදෙනුව. පඨවි, ආපෝ, තේජෝ හා වායෝ යන සතර මහාභූත ධාතුවලින් සුසැදි ලෝකයේ ආප්තය හෙවත් ජලය ජීවිතයට මෙන් ම කෘෂිකර්මයට ද අත්‍යවශ්‍ය සාධකයක්. අවුරුද්දට සහල් අස්වනු නෙළා ගන්නට

ලොව පවත්වන සෑම සංස්කෘතික උලෙළක ම මූලික අරමුණ වන්නේ සාමූහික විඥානය ගොඩනංවමින් සමාජය අනුකලනය. සිංහල හා දෙමළ අලුත් අවුරුද්දේ ද එය මනාකොට දක්නට පුළුවන්. පරණ අවුරුද්දේ තරහ මරහ අමතක කොට අලුත් අවුරුද්දට නෑසබඳතා අලුත් කර ගැනීමත් මහ ගෙදර සංකල්පය බලගන්වමින් පවුලේ සියලුදෙනා එකට එකතු වීමත් සිංහල හා දෙමළ අවුරුද්දේ විද්‍යමාන වන කරුණක්. අතින් අල්ලා බැලිය නොහැකි, එබැවින් ම අස්පර්ශ වූ සංස්කෘතික උරුමයක් වන එම කරුණෙන් ඉටුවන සමාජ කෘත්‍ය ඉතා ප්‍රබල වූවක්.

ජලය දුන් වැවට කළ සත්කාර හෙවත් දියවර ගනුදෙනු අද වන විට ගම්මානවල ළිඳ සමග ගනුදෙනු බවට රූපාන්තරණය වී තිබෙනවා. ළිඳක් නොමැති අධිනාගරික ප්‍රදේශවල සංකේතාත්මක ව අවුරුද්ද නිමිත්තෙන් නිවසේ ඇති වතුර පයිප්පයකින් ජලය ලබා ගනිමින් හෝ ඒ සිරිත ඉටු කරන්නටයි අද සමාජය පෙළඹී තිබෙන්නේ. මේ අස්පර්ශ සංස්කෘතික උරුමය මගින් අර්ථගැන්වෙන්නේ කෘතගුණ දැක්වීමේ උත්තම ගුණාංගය. එය මනෝමය වශයෙන් පුද්ගල අභිප්‍රේරණ සාධකයක් ද වනවා. ළිඳ සමග ගනුදෙනු කිරීමේදී ළිඳට වී මිටක්, ගොරක බිකක්, පඬුරු කාසියක්, තඹ කාසියක්, අඟුරු කැබැල්ලක් කුඩා පොට්ටනියක් සේ සකසා ළිඳට දමන්නේ සුදුමල් ද සමගින්. 'පනේ පොට්ටනිය' හෙවත් 'අලෙවි ගැටේ' නමින් ද හැඳින්වෙන එය ළිඳ සමග කරන ගනුදෙනුවේ 'දෙනු' කොටස වන අතර 'ගනු' කොටස වන්නේ වතුර බාල්දියක්. එසේ ගන්නා වතුර, බෝලතයක පුරවා ඊළඟ අවුරුද්ද තෙක් නිවසේ අල්මාරිය වැනි ස්ථානයක සුරක්ෂිත ව තැබෙනවා. සෑම වසරක ම එම චාරිත්‍රයට අදාළ ව වතුර බෝතලයක් ඇති අතර යම් හෙයකින් පසුගිය වසරේ පුරවා තිබූ ජල බෝතලයේ ජලය අඩු වී තිබේනම් පසුගිය වසර සුබදායක නොවූ බවයි විශ්වාසය. ඒ අනුව පැහැදිලි වන්නේ අස්පර්ශ සංස්කෘතික උරුම සමග බැඳුණු විශ්වාස පද්ධතියක් ද ඇති බව.

ලොව පවත්වන සෑම සංස්කෘතික උලෙළක ම මූලික අරමුණ වන්නේ සාමූහික විඥානය ගොඩනංවමින් සමාජය අනුකලනය. සිංහල හා දෙමළ අලුත් අවුරුද්දේ ද එය මනාකොට දක්නට පුළුවන්. පරණ අවුරුද්දේ තරහ මරහ අමතක කොට අලුත් අවුරුද්දට නෑසබඳතා අලුත් කර ගැනීමත් මහ ගෙදර සංකල්පය බලගන්වමින් පවුලේ සියලුදෙනා එකට එකතු වීමත් සිංහල හා දෙමළ අවුරුද්දේ විද්‍යමාන වන කරුණක්. අතින් අල්ලා බැලිය නොහැකි, එබැවින් ම අස්පර්ශ වූ සංස්කෘතික උරුමයක් වන එම කරුණෙන් ඉටුවන සමාජ කෘත්‍ය ඉතා ප්‍රබල වූවක්. අන්‍යෝන්‍ය වශයෙන් අන්තර්ග්‍රහණය වීම යන සාධකය පමණක් නොව පරපුරෙන් පරපුරට සංස්කෘතිකාංග නියෝජනය වෙමින් සම්ප්‍රේෂණය වීම යන අස්පර්ශ උරුම සහලක්ෂණ ද ඒ ඔස්සේ බලගැන්වෙනවා. ප්‍රජා පාදක වීම යන අස්පර්ශ සංස්කෘතික උරුමවලට අයත් වැදගත් ගුණාංගය ද සිංහල හා දෙමළ අවුරුද්දේ දැකගත හැකියි.

සිංහල හා දෙමළ අවුරුද්ද සමග කායික, මානසික විවේකය මෙන් ම විනෝදය ද පවුලේ කුඩා මහලු සැමට එක ලෙස ලැබෙනවා. එම කාය මනෝ තත්ත්වය ඇති වීම පිණිස ඉවහල් වන්නේ අස්පර්ශ සංස්කෘතික උරුම අඩංගු ක්‍රියාකාරකම් රාශියක්. දෙවියන් හා සම්බන්ධ වූ ක්‍රීඩා ද අවුරුද්දේ දක්නට ලැබෙනවා. එම ක්‍රීඩා හා සහබද්ධ වූ නැටුම් ගැයුම් වැයුම් බොහෝ පවතින අතර ඊට නිදසුන් ලෙස දැක්විය හැකි රබන් ගැසීම, උංචිලි පැදීම ආදී ජනකෙළිවල අස්පර්ශ සංස්කෘතික අංගයක් වූ දෘශ්‍ය කලා රාශියක් දක්නට ලැබෙනවා. මේ සියලු කාරණා සලකා බැලීමේදී විශද වන්නේ සිංහල හා දෙමළ අවුරුදු මංගල්‍යය යනු සපුරා ම අස්පර්ශ සංස්කෘතික උරුමවල එකතුවක් බව.



# සුව නින්දේ සුව සිහින

**සඳුනි අරුමප්පෙරුමාච්චි**

කිසියම් අවස්ථාවකදී පුද්ගලයකුට ප්‍රමාණවත් නින්දක් නොලැබෙන්නට පුළුවන්. ඉදහිට නින්ද අහිමි වීම එතරම් ගැටලුවක් නැහැ. එහෙත් දකුණු කොරියාවේ විශ්වවිද්‍යාලයක මීයන් යොදා ගනිමින් සිදු කළ නව පර්යේෂණයකින් සොයාගෙන තිබෙන්නේ දිගින් දිගට ම නිදි මැරීම පුරුද්දක් නම් එය ක්‍රමයෙන් මිනිස් මොළයේ ඇතැම් සෛල මරණයට පත් කරන බව. ඇමරිකාවේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ පර්යේෂක කණ්ඩායමක් වැඩිහිටි පුද්ගලයන් යොදා ගනිමින් MRI (Magnetic Resonance Imaging) පර්යේෂණ ඔස්සේ නිදි මැරීමෙන් මොළයට සිදු වන අහිතකර සෞඛ්‍ය තත්ත්ව පිළිබඳ තවදුරටත් පර්යේෂණ සිදු කර තිබෙනවා

එහි නිගමන අනුව ප්‍රමාණවත් නින්ද නොලැබීමෙන් මොළය ඇතුළේ ඇස්ට්‍රොසයිටිස් (Astrocytes) නමැති සෛල අධි ක්‍රියාකාරී වනවා. එය මොළයේ ආරක්ෂාවට වන ක්‍රියාවක් වුවත් දීර්ඝ කාලයක් සිදු වීමෙන් මොළයේ සමතුලිතතාව බිඳ වැටී, එම සෛල මොළයට හානි සිදු කරන අතර එය මොළයේ සෛල මිය යාමට හේතු වේ යැයි පර්යේෂකයන් අවධාරණය කරනවා. ඇස්ට්‍රොසයිටිස් යනු සිරුරේ මධ්‍යම ස්නායු පද්ධතියට අයිති ප්‍රධාන සෛලයක්. එම සෛලය මොළයට ලේ ගමනාගමනය හොඳින් සිදු කරමින් සංඥා වෙත යොමු කිරීමට දයක වනවා.

පර්යේෂණවලින් පෙන්වාදෙන මොළයේ සෛලවලට වන බලපෑම වර්තමානයේ වැඩිපුර අත්විඳින්නේ තරුණ වියේ ළමයින්. අවම වශයෙන් පැය 5ක හෝ නින්දක් නොමැති ඔවුන් ඉතා ඉක්මනින් රෝගවලට ගොදුරු වන බවයි එහිදී අනාවරණය.

නින්ද සිදු වන ආකාරය පිළිබඳ විග්‍රහ කරන ස්නායු රෝග විශේෂඥ සම්මානනීය මහාචාර්ය සමන් ගුණතිලක; “නින්දට අවශ්‍ය ස්නායු ක්‍රියාකාරකම් සිදු වන්නේ මොළය ඇතුළත. මොළයේ මධ්‍ය ස්නායු පද්ධතියේ ඇති පයිනියල් (Pineal) ග්‍රන්ථියෙන් මෙලටොනින් (Melatonin) හෝමෝනය ශ්‍රාවය වනවා. පුද්ගලයකු නිදා ගැනීම සහ අවදි වීම නියාමනය කරන්නේ එම හෝමෝනයෙන්. මෙය චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වනවා. රාත්‍රී කාලයේ පවත්නා අඳුරු පරිසර ස්වභාවය සමග මෙලටොනින් ශ්‍රාවය වීම වැඩි නිසා රාත්‍රී කාලයේදී ස්වාභාවික ව ම අපට නින්ද අවශ්‍ය වනවා.”

ඔහු පවසන ආකාරයට අඩු නින්ද හේතුවෙන් දරුවන්ගේ මතක ශක්තිය කෙමෙන් අඩු වී යාම, දහවල් කාලයේ ක්‍රියාකාරී ව තමන්ගේ කටයුතු සිදු කර ගැනීමේ අපහසුතා, නින්ද අඩු තරුණ දරුවන් හොඳ නින්දක් ලබන දරුවන්ට වඩා වයස වැඩි පෙනුමක් ලැබීම සහ තරුණ විය නිසි නින්ද අහිමිවූවන් වැඩිහිටිවියේදී දියවැඩියාව, අධි රුධිර පීඩනය, අංශභාගය, හෘදයාබාධ වැනි දීර්ඝකාලීන ලෙඩරෝගවලට පහසුවෙන් ගොදුරු වීම ආදිය සිදු වන්නට පුළුවන්. අඩු නින්ද නිසා මතකය ආශ්‍රිත ඩිමෙන්ෂියා (Dementia), ඇල්සයිම (alzheimer) වැනි රෝගින් ද බහුල ව දක්නට ලැබෙන බව ඔහු සඳහන් කරනවා.

ඇමරිකානු ස්නායු විද්‍යා ඇකඩමිය විසින් නිකුත් කරන ලද ප්‍රකාශනයක ප්‍රධාන කතුවරයා වූ සැන් ෆ්‍රැන්සිස්කෝ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ආචාර්‍ය ක්ලේමන්ස් කැවායිල්ස් පවසන්නේ පසුගිය කාලයේදී නින්දේ ගැටලු දුර්වල චින්තනය සහ මතක කුසලතා සමග සම්බන්ධ වී ඇති බව. අනාගත පර්යේෂණවලින් නින්දේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට නව ක්‍රම සොයමින් ද සිටින බව සඳහන්.

මිනිසාට නිරෝගී නින්දක් අත්‍යාවශ්‍ය වන්නේ ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වය යහපත් ව පවත්වා ගැනීමට, ශරීර වර්ධනයට සහ මොළයේ ක්‍රියාකාරිත්වයට. සෞඛ්‍ය සම්පන්න නින්දක් ලබා ගැනීමට නම් දිනපතා නියමිත කාල වේලාවකට නිදා ගැනීම හා අවදි වීම, දිනකට අවම වශයෙන් විනාඩි 20ක් හෝ 30ක් ව්‍යායාම කිරීම, රාත්‍රී ආහාර වේල නින්දට අවම පැය දෙකකට පෙර ලබා ගැනීම, නින්දට යාමට පෙර කැෆේන් වර්ග සහ මද්‍යසාර භාවිතයෙන් වැළකීම සහ නින්දට යාමට පෙර හෝ නින්දට යනතුරු ජංගම දුරකතන, ලැප්ටොප් භාවිත නොකිරීමේ (අවම වශයෙන් පැයකට පෙර එවැනි තාක්ෂණික උපකරණ ඉවත් කිරීම) සෞඛ්‍ය පුරුදු වැඩිදියුණු කර ගැනීම ඉතා වැදගත්.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව වැඩිහිටියන් අවම වශයෙන් රාත්‍රියකට පැය 7-8ක් නිදාගැනීම, වයස අවුරුදු 3-5ත් අතර ළමයින් පැය 10-13ක් අතර නින්දක් ලබා ගැනීම සහ බිලින්දන් දිනකට පැය 12-16ත් අතර නින්දක් ලබා ගැනීම අවශ්‍ය වනවා. එහෙත් පුද්ගලයකුට අවශ්‍ය නින්දේ ප්‍රමාණය වෙනස් වන්නේ වයස, සෞඛ්‍යය සහ ජීවන රටාව අනුව.

යම් පුද්ගලයකුට නින්ද නොයාම, නින්දෙන් නිතර ඇහැරීම, නින්දෙන් හුස්ම හිරවීම, ගෙරවීම වැනි තත්ත්වයකින් පීඩා විඳිනවා නම් එය යම්කිසි රෝගී තත්ත්වයක් හේතුවෙන් සිදු වන්නක් විය හැකි නිසා එම තත්ත්ව නිවැරදි ව හඳුනා ගැනීමට වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වීම වඩා සුදුසු බවයි ස්නායු රෝග විශේෂඥ මහාචාර්ය සමන් ගුණතිලක අවධාරණය කරන්නේ.



# කපුගල කන්ද පාමුල අධ්‍යාපන නිකේතනය

**සමේලා රාජපක්ෂ**

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික හොරණ නගරයට ආසන්න ව වෑවල කපුගල කන්ද පාමුල රමණීය භූමිභාගයෙහි පිහිටුවා තිබෙන අධ්‍යාපන නිකේතනයක්. 2024 නොවැම්බර් 29 දිනැති අංක 2412/35 දරන ගැසට් නිවේදනයෙන් එහි ජනමාධ්‍ය අධ්‍යයන අංශය ජනමාධ්‍ය පීඨයක් ලෙස නම් කෙරුණා. මෙය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ජනමාධ්‍ය විෂය සඳහා පීඨයක් ස්ථාපනය කළ ප්‍රථම අවස්ථාව වනවා. 2024 මැයි 20 දිනට ශ්‍රී පාලි මණ්ඩපය පිහිටුවා වසර 25ක්.

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ කලක් මණ්ඩපාධිපති ව සිටි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය ටියුඩර් වීරසිංහ ප්‍රකාශ කරන පරිදි ශ්‍රී පාලි මණ්ඩපය ඇරඹීමේ ඉතිහාසගත කතාවක් තිබෙනවා. අදහස් දක්වන ඔහු; "රටේ අවශ්‍යතාවක් තිබුණා උසස් මට්ටමින් ජනමාධ්‍ය විෂය අධ්‍යයනය කරන ස්ථානයක් පිහිටුවීමට. මෙරට පළමු වරට ජනසන්නිවේදනය පිළිබඳ පාඨමාලාවක් පටන් ගත්තේ 1969 වසරේ දෙහිවල කනිෂ්ඨ කාර්මික විද්‍යාලයෙන්. එහෙත් එය දීර්ඝකාලීන ව පැවතුණේ නැහැ. 1971 කැරැල්ලත් සමග රටේ තරුණ කොටස්වල ප්‍රශ්න සොයා බැලීම සඳහා කමිටුවක් පත් කළා. එම කමිටුවෙන් නිර්දේශයක් ලබා දුන්නා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ද්විතියික අධ්‍යයන පාඨමාලා පටන් ගැනීම සඳහා. ඒ අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මට්ටමෙන් ජනසන්නිවේදන පාඨමාලාවක් 1973 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලයේ ආරම්භ කළා. එම පාඨමාලාවෙන් ජනමාධ්‍ය, සන්නිවේදනය ආදී ක්ෂේත්‍රවලට උපාධිධාරීන් බිහි වුණත් ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යාපන ආයතනයක අඩුවක කතිකාවක් 90 දශකය මැද භාගයේ සිට 90 දශකය අවසානය දක්වා පැවතුණා."

> 1998 වසරේදී ජනමාධ්‍ය පීඨය සහ ප්‍රාසංගික කලා පීඨය ලෙස පීඨ 2කින් ඇරඹුණු ශ්‍රී පාලි මණ්ඩපයට අධ්‍යයන සහ අනධ්‍යයන අංශවල මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වී නැහැ. එම නිසා ඒවා ක්‍රියාත්මක වුණේ අධ්‍යයන අංශ ලෙස. එහෙත් මෑතකදී ජනමාධ්‍ය අධ්‍යයන අංශයට අදාළ අවශ්‍යතා සපුරා ගැනීමත් සමග ජනමාධ්‍ය පීඨය නිර්මාණය වන අතර ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය පීඨයක් බවට පත් වන තුරු එය ජනමාධ්‍ය පීඨය යටතේ පවතිනු ඇති.

මෙවැනි පසුබිමකයි 1996 ජූනි 20 දින නිකුත් කරන ලද 927/16 දරන ගැසට් නිවේදනයෙන් මේ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ 'බටහිර මණ්ඩපය' ස්ථාපනය කර තිබෙන්නේ. මෙය 1932 වසරේදී විල්මට් ඒ. පෙරේරාගේ ආරාධනයකට අනුව රවීන්ද්‍රනාත් තාගෝර්තුමන් 1934 මැයි 20 දින මුල්ගල තබා ආරම්භ කළ 'ශ්‍රී පාලි' නම් අධ්‍යාපන ආයතනය වන අතර විල්මට් ඒ. පෙරේරාට ගෞරව කිරීමට 1998 සැප්තැම්බර් 11 දින අංක 1044/37 දරන ගැසට් පත්‍රය ප්‍රකාර ව 'බටහිර මණ්ඩපය' යන නාමය වෙනුවට 'ශ්‍රී පාලි මණ්ඩපය' යන නාමය ප්‍රකාශයට පත් කර තිබෙනවා. ජපන් ජාතික

පූජ්‍ය ආචාර්ය ජිඋන් අඹිකි හිමියන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා කොළඹ විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇති ව මේ මණ්ඩපයේ දියුණුව සඳහා දායකත්වය ලබා දුන් බව සඳහන්. ශ්‍රී පාලි මණ්ඩපයේ පළමු වැනි මණ්ඩපාධිපති ලෙස පත් වුණේ මහාචාර්ය ආර්. ඒ. ආරියදාස. මෙහි පළමු වැනි ශිෂ්‍ය කණ්ඩායම 1999 වසරේදී බඳවාගෙන තිබෙනවා.

වර්තමානයේ ශ්‍රී පාලි මණ්ඩපය යටතේ ජනමාධ්‍ය අධ්‍යයන අංශය, ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය, භාෂා අධ්‍යයන අංශය සහ පරිගණක අධ්‍යයන අංශය වශයෙන් අංශ හතරක් ක්‍රියාත්මක වනවා. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජනමාධ්‍ය මෙන් ම ප්‍රාසංගික කලාව පිළිබඳ විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් පිරිනැමීම ආරම්භ වන්නේ ශ්‍රී පාලි මණ්ඩපයෙන්.

මහාචාර්ය ටියුඩර් වීරසිංහ සඳහන් කරන්නේ ඒ වනවිට සිදු වෙමින් තිබූ විද්‍යුත් මාධ්‍ය තාක්ෂණයේ ලෝක වර්ධනයත් සමග මාධ්‍ය ආයතන විමසමින් ශ්‍රී පාලි මණ්ඩපයෙන් රටට අවශ්‍ය කෙරෙන්නේ කුමන ආකාරයේ උපාධිධාරින් ද යන වග පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර සමීක්ෂණයක් ද සිදු කර ඇති බව. ඒ අනුව රටේ අවශ්‍යතා මුල්කරගෙන ජනමාධ්‍ය සහ ප්‍රාසංගික කලා ක්ෂේත්‍රය වර්ධනය වීමට අවශ්‍ය නව ප්‍රවණතා සහ තාක්ෂණික විශේෂතා හඳුනාගෙන තිබෙනවා. අදහස් දක්වන ඔහු; "එය සිව් වැනි කාර්මික විප්ලවය පැවති ශ්‍රේෂ්ඨ යුගයක් නිසා සන්නිවේදනය හා මාධ්‍ය ක්ෂේත්‍රවල සුවිශාල වෙනස්කම් සිදුවුණා. ශ්‍රී පාලි මණ්ඩපය ඊට ම ගැළපෙන ආකාරයේ මාධ්‍යවේදීන් මෙන් ම ප්‍රාසංගික කලාවේදීන් නිර්මාණය කිරීමේ අරමුණින් ජාතික ආයතනයක් ලෙසයි ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වුණේ. විශේෂයෙන් ජනමාධ්‍ය හා ප්‍රාසංගික කලාව යනු සංකල්පීය මෙන් ම න්‍යායාත්මක පදනමක් ඇති විෂය පමණක් නොවෙයි එය පුළුල් හා සමීප ලෙස මහජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා, තොරතුරු අවශ්‍යතා සපුරාලන ක්ෂේත්‍රයක්. කලාත්මක, සෞන්දර්යාත්මක දේ සැලකිල්ලට ගෙනයි එහි සමස්ත විෂය නිර්දේශය ම සකස් වී තිබෙන්නේ."

1998 වසරේදී ජනමාධ්‍ය පීඨය සහ ප්‍රාසංගික කලා පීඨය ලෙස පීඨ 2කින් ඇරඹුණු ශ්‍රී පාලි මණ්ඩපයට අධ්‍යයන සහ අනධ්‍යයන අංශවල මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වී නැහැ. එම නිසා ඒවා ක්‍රියාත්මක වුණේ අධ්‍යයන අංශ ලෙස. එහෙත් මෑතකදී ජනමාධ්‍ය අධ්‍යයන අංශයට අදාළ අවශ්‍යතා සපුරා ගැනීමත් සමග ජනමාධ්‍ය පීඨය නිර්මාණය වන බවත් ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය පීඨයක් බවට පත් වන තුරු එය ජනමාධ්‍ය පීඨය යටතේ පවතිනු ඇති බවත් ශ්‍රී පාලි මණ්ඩපයේ වත්මන් මණ්ඩපාධිපති ආචාර්ය, නීතිඥ ප්‍රතිභා මහානාමහේවා සඳහන් කරනවා. එසේ ම ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය පීඨය පිහිටුවීමෙන් ශ්‍රී පාලි මණ්ඩපය අහෝසි වීමක්, ශ්‍රේණිගතවීම පහළ යාමක් සිදු නොවන බවත් ඔහු අවධාරණය කරනවා. වෙනසකට වන්නේ පීඨයක් නිර්මාණය වීම පමණයි.

ඔහු පවසන්නේ මේ ජනමාධ්‍ය පීඨය ආරම්භ වීමත් සමග ප්‍රධාන වශයෙන් පරිපාලනමය වෙනස්කමක් ද සිදු වන බව. මෙතෙක්කල් ජනමාධ්‍ය අධ්‍යයන අංශය, ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය, පරිගණක අධ්‍යයන අංශය සහ භාෂා අධ්‍යයන අංශය ක්‍රියාත්මක වුණේ මණ්ඩපාධිපති යටතේ. ඔහු සඳහන් කරන ආකාරයට ජනමාධ්‍ය පීඨය ඇරඹීමත් සමග එහි පරිපාලනය සඳහා පීඨාධිපතිවරයකු පත් කරන අතර එවිට මණ්ඩපාධිපති යටතේ පීඨාධිපතිත් පීඨාධිපති යටතේ අධ්‍යයන අංශත් ක්‍රියා කළ යුතු වනවා.

> ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විද්‍යාර්ථීන් බඳවා ගැනීම තවදුරටත් වර්ධනය කර ගැනීම, ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බොහෝ විද්වතුන් දායාද කිරීම, ජනමාධ්‍ය පීඨය හා මාධ්‍ය වෘත්තිකයන් අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය පීඨය ඇරඹීමේ ඉදිරි ප්‍රතිඵල වනු ඇති.

ඉදිරියේදී ප්‍රාසංගික කලා අංශය ද පීඨයක් බවට පත්කර ශ්‍රී පාලි මණ්ඩපය දියුණු කරන්නට අපේක්ෂා කරන බව ශ්‍රී පාලි මණ්ඩපයේ ප්‍රාසංගික කලා අධ්‍යයන අංශයේ අංශාධිපති ආචාර්ය අමාලි පෙරේරා සඳහන් කරනවා. අදහස් දක්වන ඇය; "ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය පීඨයක් බවට පත් කිරීමට නම් ශ්‍රී පාලි මණ්ඩපය යටතේ තවත් අධ්‍යයන අංශ පිහිටුවීමට සිදු වනවා. එයයි අපට ඇති ප්‍රධාන අභියෝගය. ඒ නිසා ඉදිරියේදී ප්‍රාසංගික කලා පීඨයක් පිහිටුවීමේ අරමුණින් පසුකාලීන ව අධ්‍යයන අංශ බවට පත්කිරීමේ අභිමතාර්ථය ඇති ව ප්‍රාසංගික කලා අධ්‍යයන අංශයේ ඒකක (Units) පිහිටුවා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා."

විදෙස් සරසවි සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් විදෙස් සිසුන්ට පාඨමාලා සඳහා සම්බන්ධ වීමට ඇති අවස්ථාව පුළුල් කිරීමටත් සැලසුම් සකස් කරමින් සිටින බව ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපති, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුගත් සෙනරත් පවසනවා. ඒ අනුව ඇරඹෙන ජනමාධ්‍ය පීඨය යටතේ ඉදිරියේදී මෙරට ජනමාධ්‍ය (සංහතික මාධ්‍ය) සහ ජනසන්නිවේදන (සංහතික සන්නිවේදන) ක්ෂේත්‍රවල අධ්‍යයන තවත් පුළුල්වනු ඇති. එසේ ම ශ්‍රී පාලි මණ්ඩපය යටතේ තිබෙන මාධ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානයේ (Centre for Media Research–CMR) පර්යේෂණ ද වඩාත් පුළුල් වනු ඇති. ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විද්‍යාර්ථීන් බඳවා ගැනීම තවදුරටත් වර්ධනය කර ගැනීම, ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බොහෝ විද්වතුන් දායාද කිරීම, ජනමාධ්‍ය පීඨය හා මාධ්‍ය වෘත්තිකයන් අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය පීඨය ඇරඹීමේ ඉදිරි ප්‍රතිඵල වනු ඇති.

# අභිමි විප්ලවයක මතක

**වසන්ත දිසානායක**

1971 තරුණ කැරැල්ලට වසර 54ක්. අඩසියවසකට අධික කාලයක් ඉකුත් ව තිබුණත් 'ලාංකේය දේශපාලනයේ අදටත් එය විමර්ශනයට ලක් කළ යුතු සංසිද්ධියක් ය' යන්න බැහැර කරන්නට බැහැ.

ඇතැමුන් පවසන පරිදි 71 කැරැල්ල යනු හුදෙක් ඊට නායකත්වය දුන් ජවිපෙහි නායකයා වූ රෝහණ විජේවීර නමැති පුද්ගලයාගේ නිර්මාණයක් ම යයි කිව නොහැකියි. එහිලා ඊට දෘෂ්ටිමය, දේශපාලනමය හා සංවිධානමය බලය වූ ජවිපෙට නායකත්වය දුන් රෝහණ විජේවීරගේ සුවිශේෂ චින්තන ධාරාව තීරණාත්මක කාර්ය කොටසක් ඉටු කළ බව සත්‍ය කරුණක්. එනම් සිය චින්තනයට අනුව කියවාගත් හා අවබෝධකර ගත් මාක්ස්වාදය, අධිරාජ්‍ය විරෝධය, දේශප්‍රේමය, ඉන්දියානු ව්‍යාප්තවාද විරෝධය, කඳු රට දෙමළ වතු කම්කරුවන් ඉන්දියානු ව්‍යාප්තවාදී ප්‍රතිවිප්ලවීය හස්තයක් ලෙස ගත් දේශප්‍රේමී ප්‍රවේශය, ඉක්මනින් දේශපාලන බලය අත්පත් කර ගැනීමේ සුළු ධනේශ්වර ආවේශය යනාදිය නිර්මාණය කර ගත් විජේවීර චින්තනය ද අන් බොහෝ එවැනි නායකයන්ට වඩා විජේවීර සතු වූ ඇතැම් නායකත්ව හැකියාව ඇතුළු වෙනත් පුද්ගල බද්ධ හැකියා ද මෙහිදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළා. විජේවීරගේ මේ සුවිශේෂ චින්තනය කැටිකොට ඉදිරිපත් කෙරුණේ ඔහු විසින් නිර්මාණය කරන ලද 'ආර්ථික අර්බුදය', 'නිදහස', 'ඉන්දියානු ව්‍යාප්තවාදය', 'ලංකාවේ වාමාංශික ව්‍යාපාරය', 'ලාංකීය විප්ලවය ගත යුතු මග' නම් වූ එකල ඒවාට සවන් දුන් බොහෝදෙනා කිසියම් අන්දමකින් මෝහනයට පත් කළ සුප්‍රසිද්ධ පංති පහෙන්. එසේ වුවත් එම චින්තනය මෙරට සිංහල තරුණ ජනයාගෙන් සැලකිය යුතු තරම් කොටසක්, එනම් විසි තිස් දහසක් පමණ තරුණ බලවේගයක් ආකර්ෂණය කර ගනිමින් හා බලමුළු ගන්වාලමින් දේශපාලන

> තරුණ ජනයාගෙන් සාපේක්ෂ වැඩි පිරිසක් ආකර්ෂණය කර ගත හැකි වූයේ හදිසි කැරලි ගසා නැගිටීමකින් දේශපාලන බලය අල්ලා ගැනීමේ උපාය මාර්ගික ප්‍රවේශයක් ගත් ජවිපෙට. මෙහිලා රෝහණ විජේවීර විසින් නිර්මාණය කරන ලද 'ලාංකීය විප්ලවය ගත යුතු මග' නම් පංතියෙන් කැටි කර ඉදිරිපත් කරන ලද උපාය මාර්ගික ප්‍රවේශය කඩිනම් අපේක්ෂා සහිත තරුණ ජනයා වඩාත් ආකර්ෂණය කර ගැනීමට සමත් වූ බව පවසන්නට පුළුවන්.

බලය සඳහා අවි ගෙන සටන් වැදීමට සූදානම් ද්‍රව්‍යමය බලයක් බවට පත් කිරීමට හැකි වූයේ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද පැවති මනෝබද්ධ හා විෂයබද්ධ තත්ත්ව සමූහයක් ද හේතු කොටගෙන.

ජවිපෙ බිහි වූ වකවානුව ලොව විප්ලවීය වඩදිය රැල්ලක් මෝදුවෙමින් පැවති වකවානුවක්. එය ඉන්දු චීනයේ (වියට්නාමය, කාම්බෝජය හා ලාඕසය ඇතුළත් කලාපයේ), ලතින් ඇමරිකා කලාපයේ, අප්‍රිකාවේ හා මැද පෙරදිග කලාපයේ ජනතාව අධිරාජ්‍යවාදයට හා අධිරාජ්‍ය ගැති පාලනයට එරෙහි ව කරගෙන යමින් තිබූ විප්ලවීය අරගල උච්චස්ථානයකට නැගෙමින් තිබූ වකවානුවක්. විශේෂයෙන් කියුබානු විප්ලවය, බොලිවියාව ඇතුළු ලතින් ඇමරිකාව පුරා නැගෙමින් තිබූ විප්ලවීය අරගල, චේ ගුවේරාගේ ඝාතනය, වියට්නාම් ජනතාව ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ට හා එහි ගැති පාලකයන්ට එරෙහි ව ගෙන යමින් තිබූ විප්ලවීය අරගලය, පලස්තීන ජනතාව ආක්‍රමණික යුදෙව්වාදයට එරෙහි ව ගෙන ගිය විප්ලවීය අරගලය, චීනයේ සංස්කෘතික විප්ලවය, ඉන්දියාවේ නක්සල්බාරයෙන් ඇරඹී පැතිර යමින් තිබූ විප්ලවීය ක්‍රියාදාමය, 1968 ප්‍රංශයේ සටන්කාමී ශිෂ්‍ය අරගලය, පාලක පංති සාමකාමී ක්‍රම වෙනසකට ඉඩ නොදෙන බවට වූ ඉන්දුනීසියාවේ හා චිලියේ අත්දැකීම් වැනි සිදුවීම් දාමය පෙන්නුම් කළේ මේ වකවානුවේ ලොව විප්ලවීය මනෝභාවයක් ගොඩ නැගෙමින් තිබූ අයුරු. මේ විප්ලවීය මනෝභාවය ලෝක සමාජවාදී ව්‍යාපාරය තුළ වර්ධනය වී තිබූ ප්‍රතිසංස්කරණවාදී රැල්ලට එරෙහි ව පැන නැගුණක් වූ අතර එය නිරායාස ව ම මෙරටට ද ගලා එමින් විශේෂයෙන් තරුණ ක්‍රියාකාරීන් ආකර්ෂණය කරමින් ප්‍රකාශයට පත් වන්නට වුණා.

මේ අනුව මෙරට මුල් වාමාංශික ව්‍යාපාරය තුළ පැන නැගුණු ධනේශ්වර පක්ෂ සමග සන්ධානගත වීමේ සහාගවාදී දේශපාලන අපගමනයට එරෙහි ව වමේ ව්‍යාපාරය තුළ සටන්කාමී වාම ප්‍රවණතා මතුවන්නට වුණා. මේ ප්‍රවණතා සමත් වුණේ අප රටේ තරුණ ජනයාගේ, විශේෂයෙන් සරසවි සිසුන් ඇතුළු උගත් තරුණ ජනයාගේ සැලකිය යුතු ස්ථරයක් ආකර්ෂණය කිරීමට. මෙහිදී පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය කැපී පෙනෙන භූමිකාවක් නියෝජනය කළ අතර නව විප්ලවීය ව්‍යාපාරයක් ගොඩ නැගීමට පවා මුලපිරූ අයුරු නිරීක්ෂණය කරන්නට පුළුවන්. විද්‍යාලංකාර (කැලණිය), විද්‍යෝදය (ජයවර්ධනපුර) හා කොළඹ යන විශ්වවිද්‍යාල තුළ ද මෙවැනි ප්‍රවණතා පැන නැගෙමින් තිබුණා.

මේ සියල්ල පෙළ ගැසෙන්නට වූයේ පළමු ව දෘෂ්ටිමය ප්‍රවණතා වශයෙන්. ඒවා භෞතික බලයක් බවට පත් විය හැකි ව තිබුණේ අදාළ විෂයබද්ධ සාධකවල වැඩීමක් සමග අතිනතගෙන. මේ සාධකවල වැඩීමක් මේ වකවානුවේ ලොව පුරා දෘශ්‍යමාන වුණා. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල ඒවා දළ වශයෙන් මෙසේ සංක්ෂිප්ත කරන්නට පුළුවන්.

විශේෂයෙන් 1965 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත්වීමෙන් අනතුරු ව රටේ එතෙක් පැවති ආර්ථිකයේ අර්බුදය වඩාත් තීව්‍ර වන්නට පටන් ගත්තා. මේ කාලයේ ජනතාවට එතෙක් ලැබුණු සහල් සහනාධාරය කප්පාදු කිරීම, රුපියල අවප්‍රමාණ කිරීම ඇතුළු පියවර ගණනාවක් නිසා භාණ්ඩ මිල ඉහළ යාමත් සමග ජනතාවගේ ජීවන තත්ත්වය පහත වැටීම, වැඩි වන ජීවන වියදම් හා ජනයාගේ මූලික අවශ්‍යතා සපුරාගත නොහැකි සේ ජනයාගේ ආදායම් අඩු වීම හා ආදායම් උපයන පහළ පාංතිකයන්ගේ මූර්ත ආදායම් හා වැටුප් පහළ වැටීම, ජනයා පෙළන විශේෂයෙන් ගොවි ජනයා පෙළන ණය බර තීව්‍ර වීම, ආදායම් විෂමතාවත් දිළිඳු බවත් සමාජ අසාධාරණයත් වැඩී යාම, රැකියා විරහිතභාවය නැගී වර්ධනය වීම දක්නට ලැබුණා.

රැකියා විරහිතභාවය වර්ධනය වීම විශේෂයෙන් ඍජු ව ම තරුණ ජනයා කෙරෙහි ඇති කළේ තියුණු අවිනිශ්චිත හා බලාපොරොත්තු බිඳ දමන ලද තත්ත්වයක්. මේ කාලයේ උද්ගත වුණේ උපාධිධාරීන්ට පවා රැකියා නැති වන තත්ත්වයක්. මේ තත්ත්වය විශ්වවිද්‍යාල සිසුන් හා උසස් පෙළ සිසුන් කෙරෙහි විශාල බලපෑමක් ඇති කළා.

අධිරාජ්‍ය ගැති ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්තිය පණ ගැන්වීම, ඒකාධිපති දේශපාලන බලාධිපත්‍යයක් ස්ථාපිත කිරීමේ නැඹුරුවක් පෙන්නුම් කිරීම, 1948 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් රටට යම් නිදහසක් ලැබුණත් එය සැබෑ නිදහසක් නොවන බවත් යටත්විජිත පාලනයක් වෙනුවට නව යටත්විජිත පාලනයක් මේ නිදහස යටතේ ක්‍රියාත්මක ව තිබෙන බවත් දක්නට ලැබීම ආදී වශයෙන් වූ විෂයබද්ධ හේතු සමුදයක් ද ජවිපෙට දෘෂ්ටිමය පමණක් නොව භෞතිකමය බලයක් බවට පත්වෙමින් පාලකයන්ට එරෙහි ව කැරලි ගසා නැගී සිටීමට අවශ්‍ය භෞතිකමය පෙළඹුම ලබා දුන්නා.

මේ වන විට කැරලි ගසා නැගී සිටීමේ වුවමනාවෙන් සන්නද්ධ අරගලයක් සඳහා ක්‍රියාකාරී වූයේ ජනතා විමුක්ති පෙරමුණ පමණක් ම නොවෙයි. පෙරදිග සුළඟ, ගිනි පුපුර වැනි තවත් කණ්ඩායම් කිහිපයක් ද ඒ සඳහා ක්‍රියාකාරී වෙමින් සිටියා. ඔවුන් සූදානම් වෙමින් සිටියේ ජවිපෙ මෙන් හදිසි නැගී සිටීමකින් නොව දිග්ගැස්සුණ මහජන යුද්ධයකින් (චීනයේ මෙන්) රාජ්‍ය බලය අල්ලා ගැනීමට. එහෙත් තරුණ ජනයාගෙන් සාපේක්ෂ වැඩි පිරිසක් ආකර්ෂණය කර ගත හැකි වූයේ හදිසි කැරලි ගසා නැගිටීමකින් දේශපාලන බලය අල්ලා ගැනීමේ උපාය මාර්ගික ප්‍රවේශයක් ගත් ජවිපෙට. මෙහිලා රෝහණ විජේවීර විසින් නිර්මාණය කරන ලද 'ලාංකීය විප්ලවය ගත යුතු මග' නම් පංතියෙන් කැටි කර ඉදිරිපත් කරන ලද උපාය මාර්ගික ප්‍රවේශය කඩිනම් අපේක්ෂා සහිත තරුණ ජනයා වඩාත් ආකර්ෂණය කර ගැනීමට සමත් වූ බව පවසන්නට පුළුවන්. ඒ අනුව 1971 කැරැල්ල යනු විජේවීර චින්තනය සහ එද පැවති දේශීය හා ජාත්‍යන්තර සමාජ ආර්ථික දේශපාලන තත්ත්ව සමූහයක් එකට කැටි වීමක නිශ්චිත ප්‍රකාශනයක් මෙන් ම එය මෙරට සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රමයේ ම ඵලයක් ද ලෙස හඳුන්වන්නට පුළුවන්.



ජාත්‍යන්තර අපරාධ අධිකරණය

# ආසියානු දේශපාලන කරළියේ උණුසුම

නිහාල් පීරිස්

පිලිපීනයේ හිටපු ජනාධිපති රොඩ්‍රිගෝ ඩුටර්ටේ ආසියානු දේශපාලන කරළියේ ආන්දෝලනාත්මක ම චරිතයක් බව නොරහසක්. ඔහු එරට ජනාධිපති ධුරය දැරුවේ 2016 සිට 2022 දක්වා.

79 හැවිරිදි ඩුටර්ටේ බලයේ නැතත් ඔහු නැවතත් ප්‍රධාන මාතෘකාවක් බවට පත් ව ඇත්තේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ වරෙන්තුවක් මත අත්අඩංගුවට ගනු ලැබීම නිසා. ආසියානු කලාපයේ හිටපු රාජ්‍ය නායකයකු ජාත්‍යන්තර අපරාධ අධිකරණය විසින් අත්අඩංගුවට ගන්නා ලද පළමු අවස්ථාව ලෙස මෙය වාර්තා පොතට ද එක් වුණා. මේ සිදුවීම පිලිපීනයේ ඇති කළේ මහත් ආන්දෝලනයක්.

ජාත්‍යන්තර අපරාධ අධිකරණය විසින් නිකුත් කරන ලද වරෙන්තුවක් මත පිලිපීන පොලිසිය සහ ජාත්‍යන්තර පොලිසිය විසින් ඔහු අත්අඩංගුවට ගන්නා ලද්දේ මාර්තු 11 දින. එදින ඩුටර්ටේ හොංකොංහි සංචාරයක නිරත වී පෙරළා පිලිපීනය වෙත පැමිණි අවස්ථාවේ මැනිලා ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී අත්අඩංගුවට ගැනුණා. අනතුරු ව ඔහු හමුද කඳවුරක රඳවා තබන ලද බව පැවසුණු අතර එයින් පසු නෙදර්ලන්තයේ හේග් නුවර වෙත යවා තිබෙනවා. මේ සටහන ලියන අවස්ථාව වන විට ඩුටර්ටේ රඳවා සිටියේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිහිටා තිබෙන හේග් නුවර.

ඩුටර්ටේගේ පාලන කාලයේ එරට ඉතා දරුණු ගණයේ මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදු වූ බවට චෝදනා එල්ල වුණා. මේ චෝදනා එල්ල වූයේ ඔහු විසින් එරට මත්ද්‍රව්‍ය ජාවාරම්වලට එරෙහි ව දියත් කරන ලද කුප්‍රකට මෙහෙයුමට අදාළ ව. ඩුටර්ටේ බලයට ආවේ ම රටට පිළිලයක් බවට පත් ව තිබූ මත්ද්‍රව්‍ය උවදුර හොඳින් නැත්නම් නරකින් තුරන් කරන බව පවසමින්.

ඔහු දියත් කළ මෙහෙයුමේදී මත්ද්‍රව්‍ය පිළිබඳ සැකකරුවන් විශාල සංඛ්‍යාවක් කිසිදු ඇහිල්ලකින් බැලිල්ලකින් තොර ව මරා දමන ලද බව වාර්තා වුණා. මේ සැකකරුවන් මරා දැමුණේ කිසිදු නීතිමය ක්‍රියාවලියකින් තොර ව. ඇතැම් අවස්ථාවල අහිංසක කුඩා දරුවන් පවා මේ මෙහෙයුමෙහි ගොදුරු බවට පත් ව තිබුණා. 2020 වසරේ නිකුත් කෙරුණු වාර්තාවක සඳහන් වූයේ ඒ වන විට කුඩා දරුවන් 122 දෙනකු මෙහෙයුමේදී මරණයට පත් ව ඇති බවක්. අවුරුද්දක් වයසැති දරුවකු පවා මරා දමා තිබූ බව මේ වාර්තාව අනාවරණය කළා.

පොලිසිය සහ වෙනත් ඝාතකයන් විසින් මත්ද්‍රව්‍ය පිළිබඳ සැකකරුවන් මේ ආකාරයෙන් මරා දමන ලද්දේ ඩුටර්ටේගේ අනුමැතිය ඇති ව බවට චෝදනා නැඟුණා. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ භාවිත කරන්නන් මරා දමන මෙන් ඔහු පොලිසිය මෙන් ම සාමාන්‍ය ජනතාව ද දිරිමත් කළ බව ප්‍රකට කරුණක්.

රජයේ නිල සංඛ්‍යාලේඛනවල දැක්වෙන ආකාරයට 6,000කට ආසන්න සංඛ්‍යාවක් මෙලෙස මරා දමා තිබෙනවා. නමුත් ඇතැම් මානව හිමිකම් කණ්ඩායම් පවසන්නේ එම සංඛ්‍යාව ඊට වඩා



රොඩ්‍රිගෝ ඩුටර්ටේ

බෙහෙවින් වැඩි බවක්. ජාත්‍යන්තර අපරාධ අධිකරණය සඳහන් කර තිබුණේ මිය ගිය ගණන 30,000කට ආසන්න විය හැකි බව.

මෙමෙහෙයුමේදී වැඩි වශයෙන් මරණයට පත් ව තිබුණේ මත්ද්‍රව්‍ය ජාවාරමේ පහළ ම ස්ථරයේ සිටි සාමාන්‍ය අලෙවිකරුවන් සහ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්. ඒ අතරින් වැඩිදෙනා නාගරික ප්‍රදේශවල ජීවත් වූ දිළිඳු, නූගත් තරුණයන් බව පැවසුණා.

ඩුටර්ටේ අත්අඩංගුවට ගැනීමට ජාත්‍යන්තර අපරාධ අධිකරණය වරෙන්තු නිකුත් කළේ මේ සිදුවීම් පිළිබඳ ව කෙරෙන විමර්ශනයකට අදාළ ව. මානව හිමිකම් කණ්ඩායම් වැනි පාර්ශ්ව ඔහුගේ මේ මෙහෙයුමට දැඩි විරෝධය දැක්වුවත් ජනතාව අතර ඩුටර්ටේගේ ජනප්‍රියත්වය මේ කාලයේ වේගයෙන් ඉහළ ගියා. ඒ, මත්ද්‍රව්‍ය උවදුර පිලිපීනයට එතරම් ම ව්‍යසනයක් බවට පත් ව තිබූ බැවින්.

2022 වසරේ ඔහුගේ ධුර කාලය අවසන් වූ වකවානුවේ කරන ලද ජනමත සමීක්ෂණවලින් හෙළි වූයේ පිලිපීන ජනතාවගෙන් සියයට 90ක් ම ඔහු ජනාධිපති ධුරයේ ක්‍රියා කළ ආකාරය අනුමත කරන බව. පසුගියදා ඩුටර්ටේ අත්අඩංගුවට ගත් අවස්ථාවේ එයට එරෙහි ව බොහෝ පිරිස් විරෝධය දැක්වූවා.

මත්ද්‍රව්‍ය විරෝධී මෙහෙයුමේදී තමා වැරදි කළ බවක් ඔහු කිසිදු අවස්ථාවක පිළි ගත්තේ නැහැ. හිටපු ජනාධිපතිවරයා


ෆර්ඩිනන්ඩ් මාකෝස් (කනිෂ්ඨ)

නිතර ම පැවසුවේ තමා මේ හැම දෙයක් ම කළේ රට වෙනුවෙන් බව.

"මා කිසිවක් ගැන සමාව ගන්නේවත් නිදහසට කරුණු කියන්නේවත් නැහැ. ඒ නිසා මගේ ප්‍රතිපත්ති ප්‍රශ්න කරන්න එපා. මා කළේ මට කරන්න තිබුණු දේ. ඒ හැම දේ ම කළේ රට වෙනුවෙන්. මා මත්ද්‍රව්‍යවලට වෛර කරනවා. ඒ ගැන සැකයක් තියා ගන්න එපා". ඔහු එක් අවස්ථාවක ප්‍රකාශ කළා.

තමා නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි ජාත්‍යන්තර අපරාධ

රොඩ්‍රිගෝ ඩුටර්ටේ අත්අඩංගුවට ගෙන ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත භාර දීම මාකෝස්ට දේශපාලන වශයෙන් වාසිදායක බව අතැම් විශ්ලේෂකයන් සඳහන් කරනවා. පිලිපීනය කලින් ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ සාමාජික රටක් වුවත් 2019 වසරේ ඉන් ඉවත් වුණා. මේ නිසා ඩුටර්ටේ අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල නොවන බවට ද ඔහුගේ පාර්ශ්වය තර්ක කළා. එහෙත් මේ අත්අඩංගුවට ගැනීම අදාළ වන්නේ 2019 වසරට පෙර කාලයට බැවින් එය නීත්‍යානුකූල බව ජාත්‍යන්තර අපරාධ අධිකරණය පෙන්වා දී තිබෙනවා.

අධිකරණයට භාර දෙනවාට ඩුටර්ටේ ප්‍රකාශ කළේ සිය නොකැමැත්ත. "මා වරදක් කර ඇත්නම් පිලිපීන අධිකරණයක, පිලිපීන විනිසුරුවරුන් හමුවේ නඩු පවරන්න. මගේ රටේ මා සිරගත කරනවාට මා විරුද්ධත්වයක් දක්වන්නේ නැහැ" යැයි ඔහු පවසා තිබෙනවා.

වර්තමානයේ පිලිපීනයේ ජනාධිපති ධුරය දරන්නේ එරට ඉතා ප්‍රසිද්ධියට පත් ජනාධිපතිවරයකු වූ ෆර්ඩිනන්ඩ් මාකෝස්ගේ පුත්‍රයා වන ෆර්ඩිනන්ඩ් මාකෝස් (කනිෂ්ඨ). ඩුටර්ටේට එරෙහි ව ජාත්‍යන්තර අපරාධ අධිකරණය පැවැත්වූ විමර්ශනයට ඔහු කලින් සහය දැක්වූයේ නැහැ. එහෙත් මේ වෙද්දී මාකෝස් පවුල සහ ඩුටර්ටේ පවුල අතර විශාල විරසකයක් ඇති වී තිබෙන බව වාර්තා වනවා. කලකට පෙර මේ පවුල් අතර තිබුණේ සමීප සම්බන්ධයක්. මාකෝස්ගේ උප ජනාධිපතිවරිය වූයේ ඩුටර්ටේගේ දියණියක වන සාරා ඩුටර්ටේ.

රොඩ්‍රිගෝ ඩුටර්ටේ අත්අඩංගුවට ගෙන ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත භාර දීම මාකෝස්ට දේශපාලන වශයෙන් වාසිදයක බව අතැම් විශ්ලේෂකයන් සඳහන් කරනවා. පිලිපීනය කලින් ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ සාමාජික රටක් වුවත් 2019 වසරේ ඉන් ඉවත් වුණා. මේ නිසා ඩුටර්ටේ අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල නොවන බවට ද ඔහුගේ පාර්ශ්වය තර්ක කළා. එහෙත් මේ අත්අඩංගුවට ගැනීම අදාළ වන්නේ 2019 වසරට පෙර කාලයට බැවින් එය නීත්‍යානුකූල බව ජාත්‍යන්තර අපරාධ අධිකරණය පෙන්වා දී තිබෙනවා.

ඩුටර්ටේ ජනාධිපති ධුරයට පත් වීමට පෙර සිටියේ එරට ඩේවෝ නැමැති නගරයේ නගරාධිපතිවරයා වශයෙන්. ඔහු නැවතත් එම තනතුර සඳහා තරග කිරීමට සූදානමින් සිටි බව සඳහන්. එම මැතිවරණ පැවැත්වීමට නියමිත ව ඇත්තේ මැයි මාසයේ. පසුගිය දිනවල ඩුටර්ටේ හොංකොං වෙත ගොස් සිට ඇත්තේ ද මැතිවරණ ප්‍රචාරණ සඳහා. පිලිපීන ජාතිකයන් විශාල සංඛ්‍යාවක් හොංකොංහි වාසය කරනවා. ඩුටර්ටේට 'පෙරදිග ඩොනල්ඩ් ට්‍රම්ප්' යනුවෙන් ද නමක් පටබැඳී ඇත්තේ ඔහුගේ සෘජු, ආන්දෝලනාත්මක ප්‍රකාශ ආදිය නිසා.

# ලෝක සැරිසර

**චන්දන මාරසිංහ**



## පැය 17කින් පෘථිවියට

මාස නවයක් (දින 286ක්) අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ රැඳී සිටීමට සිදු වූ 59 හැවිරිදි Suni Williams සහ 62 හැවිරිදි Butch Wilmore Space යන ගගනගාමීන් දෙදෙනා X Dragon යානයෙන් නොබෝද (මාර්තු 19) පෘථිවියට පැමිණියා. පැය 17ක ගමනකින් ඔවුන් පැමිණියේ ෆ්ලෝරිඩා වෙරළ තීරයට. Boeing Starliner යානය පරීක්ෂා කිරීම සඳහා ඔවුන් දෙදෙනා දින අටක මෙහෙයුමක් වෙනුවෙන් 2024 ජුනි මාසයේදී පෘථිවියෙන් පිට ව ගියා. යානය අක්‍රිය තෙරපුමකට ලක්වීම ඇතුළු කාර්මික දෝෂ මතුවීම නිසා මිනිසුන්ට යාමට අවදානම් බව නාසා ආයතනය තීරණය කිරීම හේතුවෙන් ඔවුන්ට අභවකාශයේ රැඳී සිටීමට සිදුවුණා. ගගනගාමීන්ට අවශ්‍ය ආහාර, ජලය හා ඔක්සිජන් සපයා තිබෙන්නේ අභ්‍යවකාශ ආයතන සහ පෞද්ගලික ආයතන කිහිපයක්. මේ කාලයේ ඔවුන් අත්හදාබැලීම් 150ක් සහ පැය 900ක පර්යේෂණ සිදු කර තිබෙනවා. මීට පෙර 2022 හා 2023 වසරවල ඇමරිකානු ගගනගාමියකු වන Frank Rubio දින 371ක් ද 1991 වසරේදී රුසියා ගගනගාමියකු වන Sergei Krikalev දින 311ක් අභ්‍යවකාශයේ රැඳී සිටියා.



## දින 30 සටන් විරාමය

රුසියා-යුක්‍රේන යුද්ධය නතර කිරීම සඳහා ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඉදිරිපත් කළ යෝජනාවකට රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් එකඟත්වය පළ කර තිබෙනවා. ඒ, දින 30ක කාලයක් වෙනුවෙන් යුක්රේන බලශක්ති මධ්‍යස්ථානවලට ප්‍රහාර එල්ල නොකිරීමට. යුක්රේන ජනාධිපති වොලොද්මියර් සෙලෙන්ස්කි ද එය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් යුක්රේන නියෝජිතයන්, රුසියානු නියෝජිතයන් හා ඇමරිකානු නියෝජිත පිරිසක් සෞදි අරාබියේදී සාකච්ඡාවලට එක්වුණා. එහිදී කළු මුහුදේ නෞකාවලට එල්ල කරන ප්‍රහාර නතර කිරීමටත් රුසියාව එකගත්වය පළ කළා. කළු මුහුද පිහිටා තිබෙන්නේ යුක්රේනයට දකුණින් සහ රුසියාවට බටහිරින්. යුක්රේන ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ මේ ගිවිසුම වහා ම ක්‍රියාත්මක විය යුතු බව. එහෙත් රුසියානු බලධාරීන් සඳහන් කළේ ගිවිසුම ක්‍රියාත්මක වන ආකාරය හා අර්ධ සටන් විරාමයේ ස්වභාවය පිළිබඳ පැහැදිලි කළ යුතු බවත් කළු මුහුදේ සටන් විරාමය ක්‍රියාත්මක වීම සඳහා රුසියාවේ රාජ්‍ය කෘෂිකාර්මික බැංකුව මෙන් ම මූල්‍ය ආයතන කිහිපයකට පනවා ඇති සම්බාධක ඉවත් කළ යුතු බවත්. කළු මුහුදේ සටන් විරාමය මගින් යුක්රේනයට වැඩි වාසි හිමි වනවා. ඉන් ප්‍රධාන වන්නේ ධාන්‍ය අපනයනය සඳහා ආරක්ෂිත මුහුදු මාර්ගයක් ලැබීම.

රුසියා-යුක්‍රේන යුද්ධය නතර කිරීම සඳහා ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඉදිරිපත් කළ යෝජනාවකට රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් එකඟත්වය පළ කර තිබෙනවා. ඒ, දින 30ක කාලයක් වෙනුවෙන් යුක්රේන බලශක්ති මධ්‍යස්ථානවලට ප්‍රහාර එල්ල නොකිරීමට. යුක්රේන ජනාධිපති වොලොද්මියර් සෙලෙන්ස්කි ද එය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබෙනවා.



## යුද්ධයේ ඛේදවාචකය

සන්නද්ධ කණ්ඩායම් අත්පත් කරගෙන තිබූ සුඩානයේ Khartoum ගුවන්තොටුපළ යළි ලබා ගැනීමට සුඩාන ආරක්ෂක අංශවලට හැකි

ලෝකයේ බරපතළ ම සාගිනි තත්ත්වය මෙන් ම අවතැන් අර්බුදය නිර්මාණය කිරීමට ඉවහල් වී තිබෙන්නේ සුඩාන යුද්ධය. මාස පහකට පමණ පෙර මේ සන්නද්ධ කණ්ඩායම ඉතා බලවත් පිරිසක් ලෙස සැලකුණා. එහෙත් පසුව එය ක්‍රමයෙන් අඩු වී තිබෙනවා. මේ සඳහා දේශපාලන විසඳුමක් තිබිය යුතු බවයි කයිරෝවේ අධ්‍යනය හා සංවර්ධනය සඳහා වූ ආයතනය සඳහන් කරන්නේ.

වුණා. 2023 අප්‍රේල් මාසයේ සිට මේ සන්නද්ධ කණ්ඩායම් හා සුඩාන රජයේ හමුදා අතර ගැටුම් පවතින අතර ඔවුන් බටහිර සුඩානයේ ද ප්‍රදේශ රැසක් අත්පත් කරගෙන අවසන්. වසර දෙකකට ආසන්න කාලයක සිට පවතින ගැටුම් හේතුවෙන් දහස් ගණනක් ජනයා ජීවිතක්ෂයට පත් ව ඇති අතර මිලියන 12කට වඩා අවතැන් වී සිටිනවා. ලෝකයේ බරපතළ ම සාගිනි තත්ත්වය මෙන් ම අවතැන් අර්බුදය නිර්මාණය කිරීමට ඉවහල් වී තිබෙන්නේ සුඩාන යුද්ධය. මාස පහකට පමණ පෙර මේ සන්නද්ධ කණ්ඩායම ඉතා බලවත් පිරිසක් ලෙස සැලකුණා. එහෙත් පසුව එය ක්‍රමයෙන් අඩු වී තිබෙනවා. මේ සඳහා දේශපාලන විසඳුමක් තිබිය යුතු බවයි කයිරෝවේ අධ්‍යනය හා සංවර්ධනය සඳහා වූ ආයතනය සඳහන් කරන්නේ.




## හුරුබුටි වන Gigil

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂය Gigil යනුවෙන් අලුත් වචනයක් හඳුන්වා දී තිබෙනවා. උච්චාරණයේදී එය ghee - gill ලෙස සඳහන් විය යුතු බව දැක්වෙනවා. එහි තේරුම 'අතිමහත් හුරුබුටි' යන්න. මීට පෙර එම අදහස් සඳහා නිශ්චිත වචනයක් තිබී නැහැ. Gigil වචනය ඇතුළත් වන්නේ ඉංග්‍රීසි සමාන පද නොමැති වචන ලැයිස්තුවට. පිලිපීනයේ tagalog භාෂාවෙන් Gigil ලෙස සැලකෙන්නේ අත් තදින් මිරිකා ගැනීමට තරම් නොබිඳිය හැකි බැඳීමක් ඇතිවන හැඟීමක්. ඒ අනුව overwhelming cuteness යන්නෙහි අර්ථයට මෙය සමාන වනවා.



## මිනිස් අක්මාවට ආදේශකයක්

චීන වෛද්‍යවරුන් පිරිසක් පළමු වරට ඌරු අක්මාවක් මිනිස් සිරුරට බද්ධ කර තිබෙනවා. ජානමය වශයෙන් වෙනස් කළ ඌරකුගේ අක්මාවක් මෙලෙස බද්ධ කර තිබෙන්නේ මොළය මියගිය මිනිසකුට. මීට පෙර එවැනි අක්මාවක් මිනිස් සිරුරක් තුළ පරීක්ෂා කර නැහැ. මෙය බද්ධ කර තිබෙන්නේ සහායක අක්මාවක් ලෙස. මියගිය පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන්ගේ ඉල්ලීමට අනුව දින 10කට පසුව මේ අත්හදාබැලීම අවසන් කර තිබෙනවා. එම කාලය තුළ වෛද්‍යවරුන් අක්මාවේ රුධිර ප්‍රවාහනය, පිත නිෂ්පාදනය, ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරය ආදී කරුණු නිරීක්ෂණය කළා. ඌරු අක්මාව හොඳින් ක්‍රියාත්මක වූ බව වෛද්‍යවරු පවසනවා. මෙය මිනිස් සිරුරට ආදේශකයක් ලෙස ක්‍රියාත්මක වීම සාර්ථක ද යන්න ප්‍රකාශ කළ නොහැකි බව වෛද්‍යවරු සඳහන් කරනවා. ජීවත් ව සිටින මිනිසකුට මෙවැනි ඌරු අක්මාවක් බද්ධ කිරීමයි වෛද්‍යවරුන්ගේ මීළඟ සැලසුම.



## ඉරාන කතුන් ඩිජිටල් පරීක්ෂාවට

ඉරාන කාන්තාවන්ගේ ඇඳුම් පැලඳුම් සඳහා පවතින මාර්ගෝපදේශ නිසි පරිදි ක්‍රියාත්මක වීම නිරීක්ෂණය සඳහා ඉරාන බලධාරීන් ඩ්‍රෝන සහ ඩිජිටල් තාක්ෂණය භාවිත කරන බව ජගත් සංවිධානය ප්‍රකාශ කළා. ටෙහෙරාන් සහ දකුණු ඉරානයේ මේ සඳහා ඩ්‍රෝන ආරක්ෂක කැමරා යොදා තිබෙනවා. කුලී රථ සහ ගිලන් රථවලදී මෙන් ම පෞද්ගලික වාහනවලදී කාන්තාවන්ගේ ඇඳුම් පිළිබඳ වාර්තා කිරීමට දුරකතන යෙදවුමක් භාවිතයට ඉරානය පියවර ගෙන තිබෙන අතර නීති කඩකරන හෝ ඒවාට විරෝධතා

දක්වන කාන්තාවන්ට එරෙහි ව ක්‍රියා කිරීමටත් ඉරාන බලධාරීන් සූදානම්. එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ පිළිබඳ වින්දිතයන් හා සාක්ෂිකරුවන් 300කට ආසන්න පිරිසකගේ තොරතුරු ලබාගෙන සකස් කළ වාර්තාව මාර්තු 18 දින මානව හිමිකම් කවුන්සිලයට ද ඉදිරිපත් කර තිබෙනවා.



## සතුටේ රහස

එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කළ වාර්තාවකට අනුව 08 වැනි වරටත් සතුටින් ම සිටින රට ලෙස ෆින්ලන්තය නම් කර තිබෙනවා. මෙහිදී සලකා බලා තිබෙන්නේ ශක්තිමත් සුභසාධන පද්ධතිය, ස්වභාවධර්මයට ඇති ප්‍රවේශය, අන් අය සමග ගනුදෙනු කරන ආකාරය, අමුත්තන්ට සලකන ආකාරය ඇතුළු කරුණු. මෙහිදී ෆින්ලන්තයට ලකුණු 10න් 7.736ක සාමාන්‍යයක් හිමි වුණා. 02 වැනි ස්ථානය ඩෙන්මාර්කයටත් අයිස්ලන්තයට 03 වැනි ස්ථානයත් හිමි ව ඇති අතර පිළිවෙළින් ස්වීඩනය හා නෙදර්ලන්තය 04 වැනි හා 05 වැනි ස්ථානවල පසු වනවා. බ්‍රිතාන්‍යය 23 වැනි ස්ථානයට, ඇමරිකාව 24 වැනි ස්ථානයට පත් ව ඇති මේ ලයිස්තුවේ කොස්ටාරිකාවට සහ මෙක්සිකෝවට පළමු රටවල් 10 අතරට පැමිණීමට හැකි ව තිබෙනවා.



## ප්‍රාණ ඇපකරුවන් බේරාගත් මෙහෙයුම

පාකිස්තානයේ Balochistan බෙදුම්වාදීන් දුම්රියක් පැහැරගෙන සිවිල් වැසියන් ප්‍රාණ ඇපයට ගෙන තිබුණා. නැවතුම් ස්ථාන 30ක් පමණ ඇතුළත් Quetta සිට Peshawar දක්වා ධාවනය වෙමින් තිබූ මේ දුම්රියේ 400කට ආසන්න පිරිසක් ගමන් කළ අතර එයට ප්‍රහාර එල්ල වී තිබෙන්නේ Sibi නගරය ආසන්නයේ උමං මාර්ගයක් අසළදී. පාකිස්තාන ආරක්ෂක අංශ විශේෂ මෙහෙයුමකින් ප්‍රාණ ඇපකරුවන් 350කට ආසන්න සංඛ්‍යාවක් බේරාගෙන ඇති අතර මේ මෙහෙයුම අතරතුරදී සිදුවූ ප්‍රහාරවලින් සිවිල් වැසියන් 27ක් සහ සෙබළියක් මෙන් ම බෙදුම්වාදීන් 33 දෙනෙක් මිය ගොස් තිබෙනවා. පාකිස්තාන අත්අඩංගුවේ පසුවන බෙදුම්වාදීන්ගේ සංවිධානයට අයත් දේශපාලන නායකයන් පිරිසක් නිදහස් කරන ලෙස රජයට බල කිරීම සඳහා මේ පැහැර ගැනීම සිදු කර තිබෙනවා. බෙදුම්වාදීන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් 2006 වසරේ සිට එය තහනම් සංවිධානයක් ලෙස ප්‍රකාශ කර ඇති අතර ඇමරිකාව ඔවුන් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර තිබෙනවා. බෙදුම්වාදීන්ගේ අරමුණ වන්නේ මේ කොටස වෙන ම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.



## සෙලවුණු මියන්මාරය

මාර්තු 28 දින මියන්මාරයේ මැග්නිටියුඩ් 7.7ක ප්‍රබලත්වයෙන් යුතු භූමිකම්පාවක් සිදු වූ අතර එය තායිලන්තයට ද බලපා තිබුණා. එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනය (USGS) සඳහන් කරන ආකාරයට එය මැන්ඩලේ නගරය ආසන්න ව එරට වේලාවෙන් දහවල් 12.30ට පමණ සිදු වී ඇති අතර ඉන්පසුව මැග්නිටියුඩ් 4.5 සහ 6.6 අතර පසු කම්පන 4ක් ද එම ප්‍රදේශයේ සිදු ව තිබෙනවා.

ශ්‍රී ලංකා වේලාවෙන් මාර්තු 31 උදෑසන 8.30 පමණ වන විට මියන්මාරයේ පුද්ගලයන් අවම වශයෙන් 1,700ක් මියගොස් ඇති අතර අතුරුදහන් වී ඇත්තේ සිය ගණනක්. මේ භූමිකම්පාව හේතුවෙන් තායිලන්තයේ බැංකොක් අගනුවර ඉදිවෙමින් පැවති උස් ගොඩනැගිල්ලක් කඩා වැටී අතුරුදන් වූ ගණන් 76 ලෙස ගණන් බලා ඇති අතර මිය ගිය සංඛ්‍යාව 18 දක්වා ඉහළ ගොස් තිබෙනවා. ගොඩනැගිලි සුන්බුන් අතර සිරවී සිටින පුද්ගලයන් මුදා ගැනීම මියන්මාරයේ මෙන් ම තායිලන්තයේ ද අවසන් ව නැහැ. මෙය ඉතිහාසයේ මේ දෙරට මුහුණදුන් දරුණුම ස්වාභාවික විපත ලෙස සැලකෙනවා.

# චීනයේ ඉදිරිය

**දිනූෂි ධීරසිංහ** - චීන මාධ්‍ය සමූහය



චීනය වත්මන් ලෝකයේ විශාලතම හා බලවත් ම ආර්ථිකයක් හිමි රටක්. එමෙන් ම ලොව විශාලතම වාණිජ හා කාර්මික නිෂ්පාදන බලවතා වන්නේ ද චීනය. තාක්ෂණයේ අසීමිත ශක්‍යතා සහිත ව සුහුරු ලෝකයක් නිර්මාණය කිරීමේ පෙරගමන්කරුවකු ලෙසත් චීනය ප්‍රමුඛ වනවා. ගෝලීය සාමය සහ සංවර්ධනයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙමින් සංවර්ධනයේ ප්‍රතිලාභ සියලු මානව වර්ගයා සමග හුවමාරු කර ගැනීමේ නව සංවර්ධන සංග්‍රාමයත් චීනය අරඹා තිබෙනවා. එහි ඉදිරි ගමන්මග සම්බන්ධයෙන් මනාව පැහැදිලි කෙරුණු චීන ජාතික සැසිවාර නොබෝදා (මාර්තු 04 සිට මාර්තු 11 දක්වා) සාර්ථක ව අවසන් වුණා.

චීනයට අනන්‍ය සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය පිළිබිඹු කරන මේ චීන ජාතික සැසිවාර වාර්ෂික ව බෙයිජිං නුවරදී පැවැත්වෙනවා. මේ සැසිවාර 2 මහජනතාව දේශපාලන ක්‍රියාවලියට එක්වන චීනයේ අතිශය වැදගත් ක්‍රමවේදය ලෙසටයි සැලකෙන්නේ. මෙවර පැවැත්වුණේ 14 වැනි චීන ජාතික මහජන කොංග්‍රසයේ 3 වැනි සැසිවාරය සහ චීන මහජන දේශපාලන උපදේශක සභාවේ 14 වැනි ජාතික කමිටුවේ 3 වැනි සැසිවාරය.

පළමු ව ඇරඹුණු චීන මහජන දේශපාලන උපදේශක සභාව (CPPCC) යනු චීනයේ ප්‍රධාන දේශපාලන යාන්ත්‍රණයක්. චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ සෙසු දේශපාලන පක්ෂ 8, විවිධ මහජන කණ්ඩායම් මෙන් ම සුළු ජාතීන් හා විවිධ ක්ෂේත්‍රවල නියුතු සාමාජිකයන් 2100කට අධික පිරිසක් මේ සැසියේදී රටේ ප්‍රධාන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා.

චීනයේ උත්තරීතර රාජ්‍ය බලායතනය වන්නේ චීන ජාතික මහජන කොංග්‍රසය (NPC). චීනයේ සියලු ජන කණ්ඩායම් නියෝජනය කරමින් විවිධ ක්ෂේත්‍රවල නියෝජිතයන් 3,000කට ආසන්න පිරිසක් ඊට එක්වනවා.

චීන ජනාධිපති ෂී ජින්පිං ඇතුළු රාජ්‍ය හා පක්ෂ නායකයන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙවර සැසියේදී චීන අග්‍රාමාත්‍ය ලී ච්‍යං සම්ප්‍රදායානුකූල ව රාජ්‍ය කාරක වාර්තාව ඉදිරිපත් කළා. අවිනිශ්චිත ගෝලීය තත්ත්වය හමුවේ පවා ගෙවී ගිය වසරේ ආර්ථික වර්ධනය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට හැකි වූ බවයි එහිදී ඔහු ප්‍රකාශ කළේ. එනම් 2024 වසරේ දළ දේශීය නිෂ්පාදිත වටිනාකම (GDP) යුවාන් ට්‍රිලියන 134.9ක් වූ අතර ආර්ථික වර්ධන අනුපාතය 5 ක්. මෙහි විශේෂත්වය වන්නේ එය ලොව ප්‍රධාන ආර්ථික අතර ප්‍රමුඛස්ථානයක පසුවීම සහ ගෝලීය ආර්ථිකයට 30%ක අඛණ්ඩ දායකත්වයක් ලබාදීම.

2025, චීනයේ 14 වැනි පස් අවුරුදු සැලැස්මේ අවසන් වසර. ඉලක්ක මනාව සපුරා ගනිමින් 15 වැනි පස් අවුරුදු සැලැස්ම සඳහා ශක්තිමත් පදනමක් සකසා ගැනීම මේ වසරේ අපේක්ෂිත අරමුණ වනවා. මේ සඳහා ප්‍රබල ආර්ථික හිමි පළාත්, පෙරමුණ ගෙන ක්‍රියා කළ යුතු බව ෂී ජින්පිං කියා සිටියා. ඒ, සැසිවාරයට සමගාමී ව පැවති Jiangsu පළාත් නියෝජිත කණ්ඩායමේ සාකච්ඡාවට එක්වෙමින්. 2025 වසරේ චීනයේ අපේක්ෂිත ආර්ථික වර්ධනය 5%ක්. නාගරික විරැකියා අනුපාතය 5.5%ක මට්ටමේ පවත්වා ගනිමින් නව නාගරික රැකියා අවස්ථා මිලියන 12කට වැඩි සංඛ්‍යාවක් නිර්මාණය කිරීම ද ප්‍රමුඛ ඉලක්ක අතර වනවා.


නවීන සමාජවාදී ආර්ථිකයක් නිර්මාණය කිරීමේ ඉලක්කය සාක්ෂාත් කිරීම සඳහා උසස් තාක්ෂණයෙන් යුත් කාර්මික පද්ධතියක් ගොඩනැඟීම ද චීනයේ තවත් සැලසුමක්. විශේෂයෙන් ජෛව නිෂ්පාදන, ක්වොන්ටම් තාක්ෂණය, රොබෝ හා කෘත්‍රිම බුද්ධිය (AI) මෙන්ම 6G ඇතුළු නැඟී එන කර්මාන්තවල ආයෝජන පුළුල් කර සිය තාක්ෂණික ස්වයංපෝෂිතභාවය සහතික කර ගැනීම එහි ප්‍රධාන පියවරක්.

හරිත ආර්ථිකයක් නිර්මාණය කිරීම වර්තමාන ගෝලීය ඉලක්කයක්. ඒ සඳහා සහය වෙමින් කාබන් විමෝචනය හා පරිසර දූෂණය පිටුදැක හරිත පරිවර්තනය කඩිනම් කිරීමට චීන රජය පියවර ගනිමින් සිටිනවා. මේ වනවිට ලොව ප්‍රධානතම විද්‍යුත් වාහන අපනයනකරු බවට පත් ව සිටින්නේත් චීනය. එය අඛණ්ඩ ව පවත්වා ගනිමින් වඩාත් උසස් තත්ත්වයේ විද්‍යුත් වාහන නිෂ්පාදනය කිරීමත් ඔවුන්ගේ අරමුණක්. එපමණක් නොව පිරිසිදු බලශක්ති ප්‍රවේශය සඳහා පහසුකම් අන් රටවල් සමග සහයෝගයෙන් වැඩිදියුණු කිරීමට ද පියවර ගැනෙනවා.


විදේශ වෙළෙඳාමේ වර්ධනය ස්ථාවර ව පවත්වා ගනිමින්, ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු ව 'එක් තීරයක් එක් මාවතක්' වැඩපිළිවෙළ සංවර්ධනයටත් බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික කලාපීය ආර්ථික සහයෝගිතාව අඛණ්ඩ ව ශක්තිමත් කිරීමටත් චීනය මේ වසරේ පියවර ගනු ඇති.

වත්මන් ලෝකය අවිනිශ්චිත හා කැළඹිලි සහගත බවින් පිරී පවතින්නක් බැවින් ගෝලීය නිශ්චිතභාවය අභියෝගයට ලක් ව තිබෙනවා. මේ නිසා ම ලොව බලවත් රාජ්‍යවලින් ඇතැම් තීරණ, ගෝලීය රටාවට එල්ල කරන්නේ සෘජු බලපෑමක්. එවැනි අවස්ථාවක චීනයේ මේ සංවර්ධන නිශ්චිතභාවය අවිනිශ්චිත ලෝකයට තිරසරභාවයේ බලාපොරොත්තු රැගෙන එනු ඇති.

# වැඩිමු උතුම් මුනි දළ දා



සිරිලක 'සිරි දළ දා ප්‍රදර්ශනය' අප්‍රේල් මස 18 සිට 27 දක්වා දින 10ක් මුළුල්ලේ පැවැත්වීමට නියමිත ව තිබෙනවා. එය මෙරට ඓතිහාසික සිදුවීමක් වනු ඇත්තේ වසර 16කට පසුව පැවැත්වෙන 'සිරි දළ දා ප්‍රදර්ශනය' වීමත් රාජ්‍ය නායකයා ලෙස ජනාධිපතිවරයා විසින් බෞද්ධ ප්‍රබෝධයකට මුලපුරමින් නව සංස්කෘතික පරිවර්තනයකට රට යොමු කිරීමේ මාවත මේ ඔස්සේ විවර කර ගැනීමට ප්‍රවේශය ගනු ලැබීමත් නිසා. ඒ අනුව මෙවර දෙසතිය කවරයේ කතාව සැකසෙන්නේ 'සිරි දළ දා ප්‍රදර්ශනය' පිළිබඳ විමසුමක යෙදෙමින්.




මහාචාර්ය පූජ්‍ය නාවලපිටියේ
**අනුරාධා සුධම්මිකා භික්ෂුණිය**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය


## දළ දා වහන්සේ හා බැඳුණු භාරත සබඳතාව

සම්බුදු සසුන ලක්දිව ස්ථාපිත කිරීම තරමට ම වැදගත් සිද්ධියක් ලෙස දළ දා වහන්සේ ලක්දිවට වැඩම කරවීමත් ඒ හා බැඳුණු භාරත සබඳතාවත් සලකන්නට පුළුවන්. බුදුන් වහන්සේ වැඩසිටීමට සමාන වනවා බුදුන් වහන්සේගේ ශාරීරික කොටස් වැඩ සිටීම.

සම්මා සම්බුදුවරයන් වහන්සේලා විසිඅට නමක් ගැන ග්‍රන්ථාගත තොරතුරුවල සඳහන්. උන් වහන්සේලාගෙන් විසිඅට වැනි බුදුන් වහන්සේ වන්නේ ගෞතම බුදුන් වහන්සේ. භාරතයේ මධ්‍යදේශයේ උපන් මේ අසහාය මහා ප්‍රාඥයා දෙසූ දහම භාරතයෙන් සිංහල දේශයට ලැබුණු දා පටන් ජනතාව ඉමහත් ආදරයෙන් හා ගෞරවයෙන් 'අප බුදුන්' ලෙස හඳුන්වන්නට පුරුදු වී සිටින්නේ එම විසිඅට වැනි ගෞතම බුදුන් වහන්සේ.

ජීවමාන බුදු රජාණන් වහන්සේ ලක්දිවට අවස්ථා තුනකදී වැඩම කළ බව ඓතිහාසික වශයෙන් සාකච්ඡාවට බඳුන් වුවත් ලංකාවේ බුදු දහම රාජ්‍ය ආගම බවට පත් වූයේත් ලක්දිව බුදු දහම ස්ථාපිත වූයේත් බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දෙකහමාරක් පමණ ගත වූ තැන්හි භාරතයේ ධර්මාශෝක මහාධිරාජයාගේ කාලයේදී පවත්වන ලද තුන් වැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන්.

නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ සන්සුන් ඉරියව්වලින් පැහැදුණු ධර්මාශෝක මහාධිරාජයා, උන් වහන්සේ රජ මැඳුරට වැඩමවා ගත් විට සුදුසු ආසනය ලෙස සිංහාසනයේ වැඩ සිටි බවත් ධර්මය විමසූ කල්හි,

'අප්පමාදො අමතපදං' යනාදී ගාථාවෙන් අප්‍රමාදයෙහි අගය ගැන දහම් දෙසන ලද බවත් ඇසූ දහමට අනුව අප්‍රමාදී බවෙහි අරුත වටහා ගත් මහාධිරාජයා එවකට සම්බුද්ධ ශාසනයේ වගකිවයුතු කාර්යභාරයක් ඉටු කළ මොග්ගලී පුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ අනුශාසනා පරිදි තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට පූර්ණ අනුග්‍රහය ලබා දුන් බවත් වාර්තා වනවා.

ධර්මාශෝක මහාධිරාජයා තම කල්‍යාණ මිත්‍ර ධර්මයට අනුව තමා තෙරුවන් සරණ ගිය බව ද ඔබත් තෙරුවන් සරණ යන්න යැයි එකල ලක්දිව රාජ්‍ය කළ තිස්ස රජතුමාට පණිවිඩ එවා තිබෙනවා. ධර්මාශෝක රජු 'දෙවියන්ට ප්‍රිය වූ' යන අභිධානය, ගෞරව නාමය භාවිත කළ බැවින් එම රාජකීය ගෞරව නාමය තිස්ස රජතුමාටත් ප්‍රදානය කරමින් දේවානම් පිය යන අභිධානය සහිත ව අභිෂේක කරවූ බව ද කියැවෙනවා.

එම මිත්‍ර ධර්මයත් පදනම් කරගෙන තම පුතු වූ ධර්ම රාජයාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිස ලක්දිවට පිටත් කර හැරියා. මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ලක්දිව වැඩමවා සම්බුදු සසුන ස්ථාපිත කෙරුණා.

එම රාජකීය ගමනෙහි දෙවැනි පියවරක් ලෙස සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ ඇතුළු පිරිස ද ජය ශ්‍රී මහා බෝධීන් වහනන්සේ වැඩමවා ලක්දිව සංස්කෘතිය ස්ථාපිත කිරීම ද ඓතිහාසික වශයෙන් වැදගත් සංසිද්ධි.

ධර්මාශෝක මහාධිරාජයා තම රාජ්‍ය බලය සමග පැවැත්වූ සබඳතාවේ ප්‍රතිඵලය ලක්දිවට වාසනාව ගෙන ආවා. ඒ, සම්බුදු දහම අපට ලැබීම නිසාත් ගෞතම බුදුන් වහන්සේට බුද්ධත්වය ලැබීමට සෙවන දුන් බෝධීන් වහන්සේ රාජ්‍ය සංකේතය බවට පත් වීමත් නිසා. එලෙස සම්බුදු දහමත් බෞද්ධ සංස්කෘතියත් ස්ථාපිත වූ රාජ්‍යයක් ලෙස ලංකාව ලෝක ප්‍රකට වී තිබෙන්නට ඇති.

එතැන් පටන් ලක්දිව බෞද්ධ රාජ්‍යයක් ලෙස ස්ථාපිත වූ අතර ඒ සඳහා ගැළපෙන ව්‍යවස්ථා ද සැකසුණා. රාජ්‍ය නායකත්වයට පත්වන නායකයා දිවි හිමියෙන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේත් මහා සංඝ රත්නයත් රටවැසියාත් සුරක්ෂිත කළ යුතු වුණා.

ක්‍රි. පූ. 3 වැනි සියවසේදී එසේ ස්ථාපිත වූ සම්බුදු දහමත් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පදනම් කරගත් සංස්කෘතියත් සමග ගෙවී ගිය ලංකාවේ සියවස් 5ක පමණ කාලයේ දළ දා වහන්සේ භාරතයේ වැඩ සිටි බව වාර්තා වී තිබෙනවා. එම කාලයේ විවිධ රජවරුන්ගේ කාලවලදී අප ගෞතම බුදුන් වහන්සේගේ බොහෝ ශාරීරික ධාතූන් වහන්සේලා ශ්‍රී ලංකාවේ විවිධ චෛතියවල තැන්පත් කර ගෞරව බහුමානයට ලක් කරන ලද අතර වර්තමානයේ මහනුවර දළ දා මාළිගාවේ වැඩ සිටින දළ දා වහන්සේ ලක්දිවට ලැබුණේ ක්‍රි.ව. 4 වැනි සියවසේදී.

බුදුන් වහන්සේගේ පිරිනිවනින් පසු එනම් ක්‍රි.ව. 6 වැනි සියවසේදී ආදාහන චිතකයෙන් ඛේම නම් මහරහතන් වහන්සේ ලබා ගත් දළ දා වහන්සේ දඹදිව හෙවත් ඉන්දියාවේ කළිඟුපුරයේ බ්‍රහ්මදත්ත රජුට බාර දුන් බවත් ඔහු ඇවෑමෙන් එම රජ මැදුරේ පූජනීයත්වයෙන් පරම්පරා හතක් දක්වා ම දළ දා වහන්සේ සුරක්ෂිත ව පුද පූජා ලද බවත් ගුහසීව රජුගේ කාලයේදී හෙවත් ක්‍රි. ව. 4 වැනි සියවස වන විට දඹදිවදී දළ දා වහන්සේ සුරක්ෂිත නොවන තත්ත්වයකට පත් වූ බවත් රාජ්‍ය බලය පදනම් කරගත් යුද වාතාවරණය යටතේ ගුහසීව රජු දළ දා වහන්සේ රැක බලා ගත් බවත් දාඨාවංශයේ සඳහන් වනවා.

ගුහසීව රජු සහ බෑනණුවරුන් දෙදෙනෙක් සමග අවසන් වරට යුද වැදුණු අවසාන අවස්ථාවේ තමා යුද්ධයෙන් පරාජය වුවහොත් දළ දා වහන්සේ රැගෙන සිංහල දේශයට යන ලෙස තම දියණිය වූ හේමමාලි කුමරියටත් බෑනණු වූ දන්ත කුමරුටත් කියා තිබුණු බැවින් රජු පරාජය වූ බව අසා, එම දෙපළ දළ දා වහන්සේ ලක්දිවට වැඩමවූ බව වාර්තා වන්නක්. එකල එම තොරතුරු සිංහල දාඨාවංසයක ලියා තබන ලදුව පසුව එය පාලියට පරිවර්තනය කිරීමේදී එම ග්‍රන්ථය ගැන සඳහන් කර ඇති බැවින් පාලි දාඨාවංසය සිංහල දළ දා වංසයක පරිවර්තනයක් බව ද හඳුනා ගන්නට පුළුවන්.

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු යන රාජකීය දෙපළ දළ දා වහන්සේ වැඩමවාගෙන ලක්දිව පැමිණෙන විට, කීර්ති ශ්‍රී මේඝවර්ණ (ක්‍රි.ව. 301-328) රජුගේ රාජ්‍යත්වයෙන් 9 වැනි වර්ෂය වුණා. එනම් ක්‍රි. ව. 310 යැයි අනුමාන කළ හැකියි. දළ දා වහන්සේ ලක්දිවට වැඩමවන තෙක් දඹදිව (ඉන්දියාවේ) කළිඟු දේශයේදී පිදුම් ලද දළ දා වහන්සේ හේමමාලා කුමරියගේ මුහුළසෙහි බැඳී දන්ත කුමරු ද සමග ලක්දිවට වැඩමවීම තෙක් සිදු වූ ප්‍රාතිහාර්ය ගැන දාඨාවංසයෙහි 298 වැනි ගාථාවේ ද ක්‍රි.ව. 5 වැනි සියවසේදී ලියන ලදැයි සැලකෙන මහාවංශයෙහි 37 පරිච්ඡේදයෙහි 92 ගාථාවේ ද සඳහන්. එම ඉතිහාසය මහනුවර දළ දා මාළිගාවේ අලුත් මාළිගාව නමින් හඳුන්වන ගොඩනැගිල්ලේ සිතුවම් ලෙස ප්‍රදර්ශනය කර තිබෙනු අදටත් දැක ගත හැකියි. සැබවින් ම මේ පූජනීය මහනීය වස්තුව ලෝකයේ අනෙකුත් රටවල් අතුරින් ලක්දිවට ලැබීම ම අපූර්ව වූ ප්‍රාතිහාර්යයක්.



## දළ දා වහන්සේ හා සිංහල රාජ්‍යත්වය

දළ දා වහන්සේ මෙරටට ලැබුණු දා පටන් කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු ලංකා රාජ්‍යයෙන් පුදා 'ධාතුසු ඨිතාසු බුද්ධා ඨිතා හොන්ති' (ධාතූන් වහන්සේ වැඩ සිටීම බුදුන් වහන්සේ වැඩ සිටීමක් හා සමාන ය) යනුවෙන් රාජකීය පූජාවලින් පූජා කරන්නට යෙදුණා. දළ දා වහන්සේ වැඩමවූ යුගයේ දළ දා වහන්සේ රජමාළිගාවේ ම වැඩ සිටි අතර රජුට විවිධ රාජකීය කටයුතු නිසා පුද පූජා පැවැත්වීම අතපසු වන බැවින් එම කාර්යය රාජදේවීවරුන්ට පවරා තිබෙනවා. එබැවින් මුල් ම යුගයේ දළ දා පූජා සිදු කළේ රාජදේවීවරුන්. එම දේවීවරු පූජා කළ රන්පාත්‍ර හතරක්, රන් කෙණ්ඩි ආදිය අදටත් සුරක්ෂිත ව තිබෙන බවත් හේමමාලා කුමරිය දළ ද වහන්සේ වැඩමවීමේදී කොණ්ඩයට ගැසූ කොණ්ඩකූර, හෙළ රාජදේවීවරුන් පිදූ රන්මාල දළ ද වහන්සේ තැන්පත් කරඬුව අදටත් සරසවන බවත් දළ දා ඉතිහාසය ගැන ලියා තැබූ ප්‍රාඥයන්, පර්යේෂකයන් සඳහන් කරනවා. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෙස්වලින් සැකසූ මුස්නක් දළ දා වහන්සේ පිරිසිදු කිරීමට පූජා කර තිබීම අපට සියැසින් දැක ගන්නට පුළුවන්.

> පාලි වංශකථා අනුව මුල් ම දළ දා ප්‍රදර්ශනය සහ පෙරහැර ආරම්භ වූයේ ක්‍රි.ව. 4 වැනි සියවසේදී කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාගේ (ක්‍රි.ව. 304-328) රාජ්‍ය යුගයේදී, එතුමා දළ දා වහන්සේ පිළිගෙන ධම්මචක්ක ගේහ නම් මන්දිරයෙහි තැන්පත් කොට පූජනීය බවට පත් කළ බව මූලාශ්‍රවල සඳහන්.



එතෙක් රාජ්‍ය සංකේතය වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙනුවට ක්‍රි. ව. 4 වැනි සියවසෙන් පසුව බුදුන් වහන්සේගේ ශාරීරික ධාතුවක් වූ දළ දා වහන්සේ රාජ්‍යයේ සංකේතය බවට පත් වනවා. එතැන් පටන් රාජ්‍යත්වයට පත් වන රජවරු දළ දා වහන්සේ දිවි හිමියෙන් සුරක්ෂිත කළ යුතු බවට ප්‍රඥප්තියක් තිබුණා. එය අදටත් වලංගු වන්නක්. එනම් බුද්ධාඥාව සිත්හි තබා ධාර්මික ව සාමයෙන් රටේ ජනතාවට යහපත සැලසීමටත් බුදු දහම මූලික කරගත් බෞද්ධ භික්ෂු භික්ෂුණී පරපුර සුරක්ෂිත කිරීමටත් රාජ්‍ය නායකයා බැඳී සිටිනවා.

එයින් මිදුණු අවස්ථාවලදී රටට විපත් සිදු වූ බවයි මහජනතාවගේ විශ්වාසය. මිථ්‍යාදෘෂ්ටි ගත් රජවරුන්ගේ කාලවලදී දළ දා වහන්සේ රැක ගැනීමට දිවිහිමියෙන් ක්‍රියා කළ රජවරු, භික්ෂූන් වහන්සේලා ගැන ද කියැවෙනවා.

## දළ දා පෙරහැර, පුද පූජා හා අසිරිමත් සිදුවීම්

දළදා වහන්සේ වැඩමවීමෙන් අනතුරු ව දළදා පෙරහැර, දළදා පූජා හා සිරිත් විරිත් මෙන් ම ඒ හා බැඳුණු අසිරිමත් සිදුවීම් ලක්දිව බෞද්ධ සංස්කෘතියේ දෙවැනි ආරම්භයක් ලෙස සඳහන් කළ හැකියි.

පෙරහැර සංස්කෘතිය ලක්දිවට හඳුන්වා දුන්නේ ධර්මාශෝක මහාධිරාජයා. සඟමිත් මහරහත් මෙහෙණින් වහන්සේ ඇතුළු එකොළොස් නමක් වූ භික්ෂුණීන් වහන්සේලා සමග බෝධි ආරක්ෂක කුල දහඅටක පිරිසක් (එක් ශිල්ප ශ්‍රේණියකින් අට දෙනා බැගින්) පැමිණි බවත් මහාවංශයේ 18 වැනි පරිච්ඡේදයේ සඳහන් වනවා. බෝධීන් වහන්සේ රජු සේ සලකමින්, රජකු වෙනුවෙන් කෙරෙන සියලු ගෞරව බහුමාන සිදු කිරීම දෙවැනි පෑතිස් රාජ්‍ය කාලයේ පටන් සිදු වුණා.

පාලි වංශකථා අනුව මුල් ම දළ දා ප්‍රදර්ශනය සහ පෙරහැර ආරම්භ වූයේ ක්‍රි.ව. 4 වැනි සියවසේදී කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාගේ (ක්‍රි.ව. 304-328) රාජ්‍ය යුගයේදී. එතුමා දළ දා වහන්සේ පිළිගෙන ධම්මචක්ක ගේහ නම් මන්දිරයෙහි තැන්පත් කොට පූජනීය බවට පත් කළ බව මූලාශ්‍රවල සඳහන්.

ක්‍රි.ව. 5 වැනි සියවසේදී ලක්දිව පැමිණි චීන දේශාටක ෆාහියන් භික්ෂුවගේ දේශාටන වාර්තාව අනුව දළ දා පෙරහැර සහ ප්‍රදර්ශනය ගැන මහාචාර්ය වල්පොල රාහුල හිමියන් 'ලක්දිව බුදුසමයේ ඉතිහාසය' කෘතියේ සඳහන් කර තිබෙනවා. එයට අනුව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු කරවන ලද ධම්මචක්ක ගේහ නම් මණ්ඩපයේ දළ දා වහන්සේ වඩා හිඳුවා රාජකීය පූදපූජා කරවූ බව ද අභයගිරි විහාරයට පෙරහැරින් වැඩමවාගෙන ගොස් මහජනයාට ප්‍රදර්ශනය කළ බව ද ඒ අනුව ක්‍රි. ව. 5 වැනි ශතවර්ෂයේදී දළ දා උලෙළ සියැසින් ම දුටුවකුගෙන් එම උලෙළ පිළිබඳ විචිත්‍රාලංකාර විස්තරයක් අසන්ට ලැබීම අපේ වාසනාවක් යනුවෙන් සඳහන් බව ද දැක්වෙනවා.

හියුං සියැං භ්‍රමණ වෘතාන්තයේ මෙබඳු සඳහනක් තිබෙනවා. "රජ මාළිගාව අසළ දළ දා මැදුර ඇත. අඩි සිය ගණන් උස මෙය මාණික්‍යාලෝකයෙන් දීප්තිමත් දුර්ලභ මාණික්‍යයන්ගෙන් අලංකාර කරන ලද මන්දිරයකි. විශාල පද්මරාගයක් ඇල්ලූ යෂ්ටියක් විහාරය මුදුනෙහි සවි කොට තිබේ. '(Hiuen Tsiang. Bk. xi, P. 248)"

කිත්සිරිමෙවන් රජතුමා දළ දා පූජා විධි පැවැත්විය යුත්තේ කෙසේදැයි 'දාඨාධාතු චාරිත්ත' නම් ලේඛනයක් ද සකස් කොට මතු පරපුර වෙනුවෙන් සංරක්ෂණය කර තැබූ බව ද වාර්තා වනවා.



ෆාහියන් භික්ෂුව කියන හැටියට "මුල පටන් ම දන්ත ධාතුව අභයගිරිය හා සම්බන්ධ වස්තුවක් විය. එබැවින් දළ දා දැක්වීම හා වාර්ෂික ධාතු පූජෝත්සවය පැවැත්වුණේ අභය ගිරියෙහි ය. (දා. වං. 406) එහි දළ දාව සඳහා විශේෂ මන්දිරයක් විය. (Fa Hien P. 104) වර්ෂයේ තුන් වන මස මැද භාගයේදී දන්ත ධාතුව එළියට වැඩම කරවීම එකල සිරිත ය. ඊට දස දවසකට කලින් රජතුමා ඇතෙකු සර්වාභරණයෙන් සරසවා, ව්‍යක්ත ස්වරයෙන් බිණිය හැකි පුරුෂයකු රජ සළුපිලි අන්දවා රජ අබරණින් සරසා ඇතු පිට නංවා නුවර වටා යවයි. මේ පුරුෂයා ද මහබෙරයක් වයමින් බුදු ගුණ හා බුදු සිරිත කියමින්, 'අසව්! මෙතැන් පටන් දස දවසකින් සම්බුද්ධ දන්ත ධාතුව එළියට වැඩම කරවා අභයගිරි විහාරයට ගෙන යනු ලැබේ. පැවිදි හෝ වේවා ගිහි හෝ වේවා, පින් රැස් කර ගන්ට කැමති හැම කෙනෙක් ම මහ මග අතු පතු ගා සමතලා කොට,

> වර්තමාන දළ දා වහන්සේගේ භාරකාරත්වය පැවරී තිබෙන්නේ රාජ්‍ය අනුග්‍රහය සහිත ව මල්වතු අස්ගිරි දෙපාර්ශ්වයේ මහානායක හිමිපාණන්වහන්සේලා දෙනම සහ දියවඩන නිලමේ වෙත. දළදා ප්‍රදර්ශන අවස්ථාවලදී මේ තිදෙනා ම එකතු වීමෙන් දළ දා වහන්සේ වැඩ සිටින කරඬු හත විවෘත කරන බව අප අසා දැක තිබෙන්නක්.

කුදු මහත් හැම වීදියක් ම විසිතුරු ලෙස සරසා, පුද පිණිස මල් හා සුවඳ රැස් කර තබත්වා! යි රටවැසියාට දන්වයි.

මෙසේ අණබෙර ලැමෙන් පසු, රජතෙමේ ජාතක කථාවල එන පරිදි ඒ ඒ පූර්වාත්මයේදී බුදුන් ගත් කාය ස්වරූපය දැක්වෙන රූප පන්සියයක් මහජනයාට පෙනෙනු පිණිස මග දෙපස තැබී ය. මේ හැම රූපයක් ම නොයෙක් පැහැයෙන් පැහැ ගන්වා පණ පිටින් සිටින්නා සේ අඹා තිබුණේ ය."

මේ විස්තර කිරීමේදී ෆාහියන් භික්ෂුව දුටු පරිදි කියා ඇත්තේ "මේ පෙරහැරෙන් පසු දළ දා වහන්සේ පුරා අනූ (90) දවසක් අභයගිරි විහාරයේ වඩා හිඳුවා පූජා පවත්වනු ලැබී ය. ඉන්පසු ඇතුළු නුවරට එබඳු ම පෙරහැරකින් ම දළ දා වහන්සේ වැඩමවනු ලැබී ය." යනුවෙන්

ෆාහියන් භික්ෂුව දුටු දළ දා පූජාව ගැන සඳහන් තොරතුරු හැර දළ දා ප්‍රදර්ශන ගැන තොරතුරු හමු වන්නේ අල්ප වශයෙන්. එහෙත් දළ දා සිරිතෙහි දළ දා වහන්සේ වෙනුවෙන් කෙරෙන පුද සිරිත් දක්වා තිබීම විශේෂත්වයක්. පිළිවෙළින් දඹදෙණි, කුරුණෑගල, යාපහුව ආදී රාජධානිවලදී රජවරු දළ දා පූජා පැවැත්වූයේ රාජකීය පූජාවක් වශයෙන්.

කෝට්ටේ යුගයෙදී ලියැවුණු සැළලිහිණි සන්දේශයෙහි සඳහන්

ලොව විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමදා සිරි සග මොක් සැප නිසැ දී

ලද මුනිඳා දම් කඳ පහස මන බැඳී
වඳු දළ දා හිමි තෙමහල් පහය රැඳී

යන්නෙන් කෝට්ටේ රාජධානියේදී ද දළ දා වහන්සේ වැඩ සිටියේ තෙමහල් පහයක බව ද දළ දා වහන්සේ වන්දනා මානන කරන ලෙස දූතයාට උපදෙස් ලබා දීමෙන් දළ දා වහන්සේ කෙරෙහි පැවති ගෞරවය ද හඳුනා ගන්නට පුළුවන්.

දළ දා වහන්සේගේ ඉතිහාසය විමසීමේදී දළ දා වහන්සේ කුරහන් ගලක වැඩ සිටි බව ද දෙල්ගමු විහාරයේ සිට සෙංකඩගල පුරයට වැඩමවීම, පෘතිගීසි ආක්‍රමණ නිසා සෙනරත් රජතුමා දළ දා වහන්සේ මැද මහනුවරට වැඩමවීම, ස්‍යාමෝපසම්පදාව මෙරට පිහිටුවීම ආදී තත්කාලීන පුවත් ද දළ දා පූජාවලියේ 'දළ දා වරුණ' නමින් පද්‍ය 40කින් යුත් කුඩා ග්‍රන්ථයේ I වැනි

# උතුම් බොදු පිළිවෙතින් වළඳිමු දළ දා මුනි රද




ආචාර්ය

**පූජ්‍ය පහමුණේ ශ්‍රී සුමංගල නා හිමි**

පොළොන්නරුව සෝමාවතී රාජමහා විහාරාධිපති

මහාලේඛකාධිකාරී

මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වය


සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ වාම ශ්‍රී දළ දා වහන්සේ එදා ශ්‍රී ලංකාද්වීපයට වැඩම වූ දා පටන් ලංකාවාසීන්ට එය මහා පූජනීය සංස්කෘතියක් බවට පත් වුණා. ඓතිහාසික වාර්තා අනුව ලංකාද්විපය තුන් වතාවක් දළ දා වහන්සේ වෙත පුද කළ බවයි විශ්වාසය. මෙය ඉතා උත්තරීතර පූජ්‍ය වස්තුවක්. අප රටේ මහානීය බලවේගය බවට මුදුන් ගෞරවය පිරිනැමෙන්නේ දළ දා වහන්සේට. මෙවර දළ දා ප්‍රදර්ශනය වඩාත් ශ්‍රේෂ්ඨත්වයට පත් වන සුවිශේෂ පුණ්‍යෝත්සවයක්.

අතිගෞරවාර්හ තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ මහාවිහාර වංශික අස්ගිරි විහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ වරකාගොඩ ශ්‍රී ඥානරතනාභිධාන මහානායක ස්වාමින් වහන්සේ යන මහනාහිමිවරුන්ගේ අනුශාසනා පරිදියි මේ උතුම් පින්කම සිදු වන්නේ. ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ඇරයුම පරිදි සහ නිලංග දැල දියවඩන නිලමේතුමන්ගේ මැදිහත්වීම

විමලධර්මසූරිය රජතුමා දක්වා රජවරුන් දළ දා වැඳී පුවත් ද විස්තර කෙරෙනවා.

අවසන් සිංහල රාජධානිය ලෙස සැලකෙන මහනුවර නගරයේ ප්‍රථම දළ දා මාළිගාව ගොඩ නගා ඇත්තේ ක්‍රි. ව. 1592- 1604 අතර කාලයේදී. එනම් මහනුවර රාජධානිය 14 වැනි සියවසේදී ඇරඹී කාලයාගේ ඇවෑමෙන් සංවර්ධනය වූ රාජධානියක්.

1815දී ඉංග්‍රීසීන්ට මෙරට යටත් වන තෙක් ම සිංහල රාජධානිය ලෙස ගෞරවයට පාත්‍ර වූ මහනුවර ඉදිවුණු රජමාළිගාව අද අප හඳුනා ගන්නේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් කැප කළ විහාරයක් ලෙස.

බුදුන් වහන්සේ වෙනුවෙන් අග්‍ර උපස්ථායක අනඳ හිමියන් සිදු කළ සොළොස් උපස්ථාන අදටත් සිදු කරන බව වර්තමාන තේවා බාර ස්වාමින් වහන්සේලා වෙතින් දැන ගන්නට ලැබෙනවා. බදාදා දිනවලදී නානුමුර මංගල්‍යය, අනෙකුත් සෑම දිනක ම ජීවමාන බුදුරජාණන් වහන්සේ අවදි වූ මොහොතේ පටන් දැහැටි දඬු වළඳා පැන් පහසු වීම, උදෑසන ආහාර බුද්ධ පූජාව, රජු වෙනුවෙන් සකසන ලද දෙතිසක් ව්‍යඤ්ජන සහිත රාජකීය භෝජනය අරමුණු කර සම්බුද්ධ පූජාව සිදු කෙරෙනවා. කැඳ, අවුල්පත්, පලතුරු සහිත පූජාව සෑම දිනක ම සිදු කරනවා. රජු දිනෙක ප්‍රමාද වී පැමිණීම නිසා රජු වෙනුවෙන් දෙවැනි දළ දා පූජාවක් පැවැත් වීම ද මාළිගාවේ චාරිත්‍රයක්. උදෑසන හයට පැවැත්වෙන දළ දා පූජාවෙන් පසුව විවිධ සුවඳ මල් අතර සමන් පිච්ච මල් පූජාව විශේෂ වනවා.

දහවල් සම්බුද්ධ පූජාව ද දෙතිසක් ව්‍යඤ්ජන සිහිත රාජ භෝජනය අරමුණු කර සිදු කෙරෙන්නක්. ඒ සඳහා රජවරු පිදූ කෙත්වතු ආදිය ද මාළිගාවට අයත් කර දී තිබෙනවා. අදටත් මේ වෙනුවෙන් සිටිනවා සේවක සේවිකාවන් සිය දහස් ගණනක්. සවස 7ට ගිලන්පස සම්බුද්ධ පූජාව සිදු කෙරෙන අතර අෂ්ටපාන, චතුමධුර සහිත ව දෙවරක් එම පූජාව සිදු කෙරෙනවා. මේ සියලු පූජා සිදු කරන්නේ පංචතූර්ය නාදය සහිත ශබ්ද පූජා, ස්තෝත්‍ර ගායනා සහිත ව වීම විශේෂත්වයක්.

පෙර රජදරුවන්ට උරුම ව පැවති දළ දා වහන්සේ ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමෙන් අනතුරු ව අස්ගිරි-මල්වතු දෙපාර්ශ්වයට මාරුවෙන් මාරුවට තේවා කටයුතු බාර දීමෙන් අදාළ ගිහි භාරකාරත්වය රජුගේ පැන් සැනහෙන කාර්යයේදී දියවඩන නිලමේ නමින් සිටි නිලධාරියා වෙතට පත් කර තිබෙනවා. එහෙත් අද වන විට දියවඩන නිලමේ තනතුර පත් කර තිබෙන්නේ දළදා මාළිගාවේ ගිහි භාරකාරත්වය බවටත් ඡන්දයෙන් පත්වන තනතුරක් බවටත්.

වර්තමාන දළ දා වහන්සේගේ භාරකාරත්වය පැවරී තිබෙන්නේ රාජ්‍ය අනුග්‍රහය සහිත ව මල්වතු අස්ගිරි දෙපාර්ශ්වයේ මහානායක හිමිපාණන්වහන්සේලා දෙනම සහ දියවඩන නිලමේ වෙත. දළදා ප්‍රදර්ශන අවස්ථාවලදී මේ තිදෙනා ම එකතු වීමෙන් දළ දා වහන්සේ වැඩ සිටින කරඬු හත විවෘත කරන බව අප අසා දැක තිබෙන්නක්.

දළ දා වහන්සේ සම්බන්ධ අසිරිමත් සංසිද්ධිවලදී අදටත් පැවතෙන ප්‍රවාදය නම් ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේදී වැසි ලබා ගැනීමට දළ දා වහන්සේ මහමළුවට වැඩම කළ බවත් මහ වැසි ඇති වී දළ දා වහන්සේ වැඩම වූයේ බෝට්ටුවක ආධාරයෙන් බවත් එය ඉතිහාසයේ ‘දළ දා වතුර’ නමින් ප්‍රකට වී ඇති බවත්. දළ දා පෙරහැර යනු වැසි ලබා ගැනීම අරමුණුකොට සංකේතාත්මක ව කස පිපිරවීම, බෙර හඬ ඇතුන් ආදිය යොදා ගැනීම ගැන කියැවෙන ජාතියේ මහා සංස්කෘතික මංගල්‍යයක්.

## දළ දා ප්‍රදර්ශනය හා බැඳුණු ඓතිහාසික පසුබිම

අනුරාධපුර යුගයේදී දළ දා වහන්සේ මෙරටට වැඩමවූ දා පටන් දළ දා වහන්සේ වෙනුවෙන් විවිධ පුද පූජා පැවැත්වුවත්

මහනුවර රාජධානිය ඉංග්‍රීසින්ට යටත්වීමෙන් පසුව වත්පිළිවෙත් කිරීමට කිසිවකු සිටියේ නැහැ. බුද්ධාගමත් එහි පුද සිරිත් විරිත් ආදියත් සිදු කරන්නට සහ ආරක්ෂා කරන්නට ඔවුන් මනාප වුණේ නැහැ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1853 වසරේදී දළ දා වහන්සේගේ භාරකාරත්වය අස්ගිරි මල්වතු උභය විහාරයන්හි අතිගරු මහානායක හිමිපාණන් වහන්සේ දෙනමටත් දියවඩන නිලමේටත් පවරා දුන්නා. ඒ අනුව සිංහල රජ සමයේ පටන් දළ දා තේවාව භාර ව සිටියේ අස්ගිරි මල්වතු දෙපාර්ශ්වයේ භික්ෂු මහා සංඝරත්නය. එතැන් පටන් අද දක්වා ම එම විහාර පාර්ශ්ව දෙකේ භික්ෂූන් වහන්සේලා දළ දා වහන්සේ වෙනුවෙන් තේවාව මාරුවෙන් මාරුවට සිදු කරනවා




ඓතිහාසික වශයෙන් සැලකීමේදී ෆාහියන් නම් චීන දේශාටක භික්ෂුවගේ වාර්තාව දළ දා ප්‍රදර්ශනය ගැන විසිතුරු සාක්ෂ්‍ය සපයන අතර ඉන්පසුව අපට දළ දා ප්‍රදර්ශන මතක තිබෙන්නේ 20 වැනි සියවසේ අග භාගයේදී. ඒ, ලංකාවට නිදහස ලැබීමෙන් පසු සිංහල රාජ්‍ය නායකයන් යටතේ ක්‍රමයෙන් සංවර්ධනය වුණු දළ දා මාළිගාවත් එහි පුදපූජා සහ සංස්කෘතික සුරක්ෂිතතාවත් සමග.

1990 සහ 1991 යන වර්ෂ දෙකේදී ම දළ දා වහන්සේ ප්‍රදර්ශනය කිරීමක් මා ඇසින් දැක තිබෙනවා. දළ දා ප්‍රදර්ශනය දින කවුරුත් කාර්ය බහුලයි. එසේ වුවත් එකිනෙකාට පැවරුණු කාර්ය සමූහයක් අදාළ කෙටි වේලාවක සිදු කළ යුතු වන්නේ අඛණ්ඩ ව දළ දා මාළිගාවේ තේවාව ද කළ යුතු නිසා. දහවල් දළ දා වහන්සේ උදෙසා පවත්වන බුද්ධ පූජාවෙන් පසුව, දන් වළඳන මහානාහිමිපාණන් වහන්සේලා ඇතුළු මහාසංඝ රත්නය ද, ඉතා ම මනහර ලෙස සුදු පැහැති රාජකීය ඇඳුම් කට්ටලයකින් සැරසුණු දියවඩන නිලමේ ද එතැනට පැමිණෙනවා. අනෙකුත් නිලධාරින්ට ද පැවරුණු කාර්ය තිබෙනවා. එම කාර්ය නැකැත් වේලාවකට සිදු කිරීම විශේෂත්වයක්.

පළමුවෙන් ආලත්ති බෑම නම් චාරිත්‍රයක් දළ දා තේවාවට සම්බන්ධ කිලි වරන ලද කාන්තාවන් දෙදෙනකු විසින් සිදු කරනු ලැබීමෙන් අනතුරු ව කරඬු විවෘත කිරීමේ චාරිත්‍රය එළැඹෙනවා. ඒ සඳහා සියලු සංඥා ලබා දෙන්නේ හේවිසිවලින්. දළ දා වහන්සේ වැඩ සිටින කරඬු හත විවෘත කරන්නේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ. දියවඩන නිලමේ ද පිරිත් සජ්ඣායනා කරමින් ඉතා ම භක්තිවන්ත ව වන්දනා කරමින් සිටින කල්හි ඔහුගේ දෝතට සුවඳ පැන් ඉසීම එක් නිලධාරියකු සිදු කරනවා. නැවත ද සුවඳ පැන් ඉස එතුමන්ගේ දෝතට පිළිවෙළින් නිල් පලසක් සහ රතු පලසක් එළනවා. මහානාහිමිපාණන් වහන්සේලා විසින් වීදුරු කරඬුවක තැන්පත් කොට ඇති දළ දා වහන්සේ සහිත කරඬුව දියවඩන නිලමේ දෝතෙහි රත් පලස මත තැන්පත් කරන්නේ ඉන්පසුව. හේවිසි නාදයෙන් සාධුකාර සහිත කවිකාර මඩුවෙහි ආශීර්වාද ස්තෝත්‍ර ගායනා මධ්‍යයේ, දළ දා වහන්සේ වැඩම කරවන විට, දළ දා වහන්සේට සිදු කරන ගෞරව බහුමාන තිබෙනවා. එළන ලද පාවාඩ මතින් මුතු කුඩ සේසතින් දෙපස ආවරණය කරන ලදු ව දළපුඩු සේස්ත්

මත මේ උත්තම වැඩසටහන තවදුරටත් ජනහිතකාමී ව ආශිර්වාදාත්මක ව ඉදිරියට ගෙන යාමට අපට හැකි වුණා.

මෙවැනි උදාර පින්කම්වලින් ජනතාවගේ භක්ත්‍යාදරය හා පිළිගැනීම තව තවත් වැඩිවනවා. එය දළ දා වහන්සේගේ ආරක්ෂාවට හා ආශිර්වාදයට හේතු වන්නක්. මේ උත්තරීතර පින්කම සඳහා සහභාගිවීමට අවශ්‍ය සියලු පහසුකම් සලසා දෙන නිසා සාමය හා සහජීවනය ඇති ව ජනතාවට මේ උතුම් දැක්මට සහභාගිවීමට අවස්ථාව තිබෙනවා. මෙය අසීමිත භාග්‍යසම්පන්න මොහොතක්. විශේෂයෙන් අපගේ සාරධර්ම යහගුණධර්ම මනු සමාජයේ යළි රෝපණය කිරීමට අවශ්‍ය බලය මෙයින් ලැබෙනවා. එය මානව ධර්මතා අනුව හැඩගස්වා ගැනීමේ අභියෝගයයි අප ඉදිරියේ තිබෙන්නේ.

ජාති, කුල මල භේද කිසිවක් නැති පොදු ගුණදම් යළි උපදවා ගැනීමට එය ධනාත්මක ව මෙයින් පර්වර්තනය කර ගත හැකියි. බුදු දහමේ දක්වන පරිදි ප්‍රායෝගික ගැටලු නිරාකරණය සඳහාත් මෙය කදිමට ආදේශ කර ගත හැකියි. සරල වන්දනීය බව ගැඹුරු දාර්ශනිකත්වයකට පමුණුවා ගත හැකිය යන්නයි ඉන් අවධාරණය වන්නේ. එය නුවණින් වටහාගෙන සඳහම් මඟට අවතීර්ණ වීමයි අත්‍යාවශ්‍ය. එවිට අපට ධාර්මික සමාජ ක්‍රමය මෙන් ම සංවිධිත ජන හිතකාමී සැලසුම් ක්‍රියාවට නැංවීමටත් යහපත් පසුබිමක් සැලසෙනවා. ඉතා සාර්ථක දහම් ප්‍රවේශයක් කරා ගෙනයාමට දළ දා ප්‍රදර්ශන පින්කමෙන් ලෝකයට ම ලැබෙන්නේ විවෘත අවස්ථාවක්. එය නිවැරදි ව වටහා ගතහොත් ජන සමාජය මෛත්‍රියෙන්, කරුණාවෙන් හා උපේක්ෂාවෙන් ආඪ්‍ය කරවීමට හැකි වන යහපත් පුණ්‍ය කාලයක් මේ උදා වන්නේ. එය ධාර්මික ව තේරුම්ගෙන බෞද්ධ ප්‍රතිපදාවෙන් යුතු ව ක්‍රියා කිරීමයි පින් කැමති රටේ සියලු දෙනාගේ ම වගකීම විය යුත්තේ.

රට සුරැකීම යනු දහමේ සුරක්ෂාවයි. ලෝකය ම දහම් දියෙන් සනසාලන උතුම් සද්ධර්මය අපගේ යථා මාර්ගය බව පසක් කර ගැනීම වැදගත්. එය ශපථ කරවන ධාර්මික වත්පිළිවෙත් අනුගත පූජනීය ප්‍රතිපදාවයි මේ පුණ්‍යෝත්සවයේ ආලෝකය වන්නේ.

**නිශාන්ත පීරිස්**



හේමමාලා කුමරිය සහ දන්ත කුමරු

ප්‍රදර්ශනය අවසන් කරන්නේ දොරටු වැසීමෙන්. එදින කාර්ය අවසන් කරන්නේ ද දළ දා වහන්සේ ප්‍රදර්ශනය කරන පිරිත් මණ්ඩපයේ සිට පිරිත් සජ්ඣායනා කොට දෙවියන්ට පින් දී ඇතුළු මාළිගාව හෙවත් වැඩසිටින මාළිගාවට වැඩම වීම, පූර්වයෙන් කියන ලද චාරිත්‍රානුකූල ව හේවිසිනාද මධ්‍යයේ ම. එකල දළ දා මාළිගාව සුර විමනක් සේ දෙව් බඹුන්ගේ ආකර්ෂණයට පත් වන සේ සරසා තිබීම ද විශේෂත්වයක්.

සහිත ව හෙමින් හැරෙන දියවඩන නිලමේ දළ දා වහන්සේ වැඩ සිටින මාළිගාවේ සිට පිරිත් මණ්ඩපයට මහත් ගෞරවයෙන් වැඩමවද්දී තවත් නිලධාරින් කිහිපදෙනකු නෙළුම්මල් සහ රෝසමල් පෙති, සුවඳ සමන් පිච්ච දළ ද වහන්සේ දෙපසින් සිට ඉසින්නේ සැදැහැතියන් සාධු නාද පවත්වන අතරතුර. එය මහත් වූ ගෞරවණීය අවස්ථාවක්.


දෙපස සිට නරඹන්නන් ඇස් ලැබීමේ මහා භාග්‍යය ආවර්ජනය කරන අතර ජීවමාන බුදුන් වහන්සේ දකින මොහොත තරම් භක්තියෙන් ඉපිළෙනවා. ලක්ෂ සංඛ්‍යාත ජනතාව පොරකමින් පුදපූජා සඳහා සුවඳමල් ආදී විවිධ ද්‍රව්‍ය තබාගෙන තමන් දන්නා ගාථා, පිරිත් සජ්ඣායනා කරනවා. දින ගණනාවක් දළ දා වහන්සේ ප්‍රදර්ශනය කරන විට මහානායක මාහිමිපාණන්වහන්සේලා ඇතුළු මහා සංඝරත්නයට ගිලන්පස ආදිය පිළිගැන්වීමටත් අවස්ථාව ලබා ගන්නේ බැතිමත් දායකයන්. බුදුන් දකින සැදැහැ සිතින් පෙළ ගැසී සිටින සියලු ජනතාවට දළ දා වහන්සේ ප්‍රදර්ශනය කර මොහොතක් හෝ දකින්නට සැලැස්වීමයි උත්කර්ෂවත් සැදැහැවත් මේ මහනීය පින්කමේ අරමුණ.

ප්‍රදර්ශනය අවසන් කරන්නේ දොරටු වැසීමෙන්. එදින කාර්ය අවසන් කරන්නේ ද දළ ද වහන්සේ ප්‍රදර්ශනය කරන පිරිත් මණ්ඩපයේ සිට පිරිත් සජ්ඣායනා කොට දෙවියන්ට පින් දී ඇතුළු මාළිගාව හෙවත් වැඩසිටින මාළිගාවට වැඩම වීම, පූර්වයෙන් කියන ලද චාරිත්‍රානුකූල ව හේවිසිනාද මධ්‍යයේ ම. එකල දළ දා මාළිගාව සුර විමනක් සේ දෙව් බඹුන්ගේ ආකර්ෂණයට පත් වන සේ සරසා තිබීම ද විශේෂත්වයක්.

දළ දා වහන්සේ බුදුන් වහන්සේ වැඩ සිටීමක් බඳු නිසා දළ දා වහන්සේ ප්‍රදර්ශනය කිරීමට අදහසක් ප්‍රකාශයට පත් කළ මොහොතේ පටන් කළ යුතු සියලු කාර්ය සංවිධානය කිරීමේදී සිතිවිලිවලින් පවා උපදවන්නේ අප්‍රමාණ කුසල්. රටක් ම ඒකරාශී වන, එක ම හැඟීමකින් බුද්ධ භක්තියෙන් බුද්ධ වන්දනා කරන බැතිමත් සිතිවිලිවලින් පරිසරයට මුසු වන්නේ යහපත් ප්‍රාර්ථනා. යහපත් සිතිවිලි. බුදුන් වහන්සේ ගැන දැන ගන්න දැන ගන්න උන් වහන්සේ කෙරෙහි හදවත් අප්‍රමාණ භක්තියකින් ගෞරවයකින් පිරෙනවා.

බුදුන් වහන්සේ දෙසූ දහම හදාරන විට, එය තමන්ගේ කර ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵල අත්විඳින විට බුදුන් වහන්සේ කෙරෙහි ඇතිවන ගෞරවය හා ආදරය අප්‍රමාණයි. යහපත් අරමුණුවලින් පිරුණු මිනිස් සමාජයක් ඇති කිරීමට එය ඍජු ව දයක වනවා. යහපත් ආර්ථික ශක්තියක් ගොඩ නගා ගැනීමට යටිතල පහසුකම් සැපයීමෙන් මෙන් ම දේශපාලනික වශයෙන් රාජ්‍ය නායකයා තමාගේ රටවැසි ජනතාව කෙරෙහි අප්‍රමාණ මෛත්‍රියකින් ක්‍රියා කිරීමට මෙලෙස උත්සාහවත් වීම පැසසිය යුත්තක්. සංස්කෘතික පරිවර්තනය ලෙස සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය, එකිනෙකාට සහය වීම ආදී බොහෝ කාරණා මේ දළ දා ප්‍රද්ර්ශනය සමග බැඳී තිබෙනවා. රටට ලොවට සැමට සෙත සැලසීමයි මෙහි උදාර පරමාර්ථය විය යුත්තේ.

දළ දා වහන්සේ ගැන ලෝකවාසී බෞද්ධ මහජනතාවට ඇත්තේ අප්‍රමාණ ගෞරවයක්. භක්තියක්. දිනපතා වසර සිය දහස් ගණනක් තිස්සේ විවිධ රජවරුන් ඇතුළු ප්‍රභූ නිර්ප්‍රභූ දෙව් බඹුන්ගෙන් පිදුම් ලබන මේ තරම් විටිනා ශාරීරික වස්තුවක් ලොව ඇත්තේ ම නැති තරම්.



ආචාර්ය
**පූජ්‍ය මැදගම ධම්මානන්ද නාහිමි**
මහාලේඛකාධිකාරී
අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභාව

# ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරගැනීමක්

ඓතිහාසික සෙංකඩගල පුරවරයේ කන්ද උඩරට වැඩහිඳින දළ දා වහන්සේ චිරාත් කාලයක් මුළුල්ලේ මෙරට ජනී ජනයාගේ අතිපූජනීය වස්තුව ලෙසයි සැලකෙන්නේ. දළ දා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය පමණක් නොව රාජ්‍යත්වය ගොඩනැගී තිබෙන්නේ ද හෙළ බොදු සංස්කෘතිය පදනම් ව තිබෙන්නේ ද දළ දා වහන්සේ මත බව පළමු ව සිහිකර ගැනීම වැදගත්. කලාව, ඉදිකිරීම් ක්ෂේත්‍රය ඇතුළු සකලවිධ සංස්කෘතිකාංග පවත්වා ගැනීමට අවශ්‍ය උත්තරීතර බලය ලෙසින් අප මුදුන් තැන තබා තිබෙනුයේ දළ දා වහන්සේ.

විශේෂයෙන් ජනතාව තම රටේ සෞභාග්‍යය සඳහාත් අභිලාෂ මුදුන්පත් කර ගැනීම සඳහාත් ගෞරවනීයත්වයෙන් සලකන්නේ දළ දා වහන්සේ. කෘෂි ආර්ථික රටාව මූලික කරගත් ශ්‍රී ලාංකික ජනතාව තම සියලු කර්තව්‍යවල උපරිම පූජනීයත්වය ලබා දෙන්නේ දළ දා වහන්සේ වෙත. කලට වැසි වැස, අටුකොටු ධන ධාන්‍යයෙන් පුරවා, කෙත් වතු අස්වද්දා රටක් සශ්‍රීකත්වයට පත්කිරීමට ඔවුන්ගේ හදවතේ උන් වහන්සේ වෙනුවෙන් තබා තිබෙන්නේ ඉහළ ම තැනක්. රටේ කවර ජන කොටසක් වුවත් ඒ බව පිළිගන්නේ විවාදයෙන් තොර ව.

වසර දෙදහස් ගණනකට පෙර සිට ම අපේ අතීත රජවරු දළ දා වහන්සේ දැයේ මුදුන්මල්කඩ වශයෙන් සලකා සියලු වත්පිළිවෙත් සපුරා රට, දැය සුරක්ෂා කරගත්තේ බොදු ප්‍රතිපදාව අනුව. දායෝප තිස්ස වැනි රජවරු තම නමට දළ දා වහන්සේගේ නාමය ගෞරවනීය ලෙස භාවිත කිරීම ම ඊට හොඳ නිදසුනක්. එතරම් ම දළ දා වහන්සේ වෙත පුද සත්කාර හා ගෞරව පිදීම් කළ අතීත රාජ්‍ය පාලකයන් බොහෝ සිටිනවා.

පැරණි අනුරාධපුර, පොළොන්නරු ආදී රජරට ශිෂ්ටාචාරගත රාජ්‍ය පාලනයේදීත් දඹදෙණි අවධියේ සිට බිහි වූ සෙසු පාලන රාජ්‍ය අවධිවලත් රජුගේ දකුණතට දිගු කරන දුරින් දළ දා වහන්සේ ගෞරව පූජාවෙන් සැලකූ බවයි සනාථ වන්නේ.

දළ දා වහන්සේ ලක්දිවට වැඩම කරවන්නේ ක්‍රි.ව. 301-328 අතර කාලයේ. දඹදිව කාලිංග දේශයේ එවක හටගත් වියවුල්කාරී තත්ත්වය නිසා දන්ත කුමරු හා හේමමාලා කුමරිය මූලික වී මෙරටට දළ දා වහන්සේ වැඩම කරවන අවස්ථාව පිළිබඳ ව දාඨාවංශය නම් පාලි ග්‍රන්ථයේ පැහැදිලි කර තිබෙනවා. එහිදී කලිඟු රට ගුහසීව රජු තම දියණිය අතට දළ දා වහන්සේ පිරිනමා පැවසූ කාරණයයි මෙහිදී වැදගත්. "පුතේ සිංහල රටේ මිනිසුන් අපේ ඥාතීන් නොවෙයි. නමුත් ඔවුන් දිවි හිමියෙන් දළ දා වහන්සේ රකින බව විශ්වාසයි. බුදුන් වහන්සේ වෙනුවෙන්, දළ දා වහන්සේ වෙනුවෙන් උත්තරීතරත්වය පුදන එබඳු විශ්වාසවන්ත වෙනත් ජාතියක් තවත් නැහැ. ඔවුන් මේ දළ දා වහන්සේ දිවි පුදා හෝ රකින බව මට විශ්වාසයි" යනුවෙන් කළ ඒ ප්‍රකාශය අප රටේ ජන හෘද ස්පන්දනය කවරේද යන්න පසක් කරනවා.

මෙරට මුදුන්මල්කඩ වූ දළ දා වහන්සේ ලෝකයට ම වැදගත් වූ පූජනීය වස්තුවක්. ඒ නිසා සිදු කරන මේ 'දළ ද ප්‍රදර්ශනය' බොහෝ රටවලට අප හෙළ බොදු බිමේ අභිමානය පෙන්වාදීමටත් අවස්ථාව උදා කරනවා. විශේෂයෙන් ජාත්‍යන්තර සබඳතාවල ගෞරවනීය බවක් ඇති කර ගැනීමටත් බෞද්ධ රටවල් සමග තිබෙන අප සම්බන්ධතා තව තවත් ශක්තිමත් කර ගැනීමටත් මේ අවස්ථාව රුකුලක්.


වර්ෂ 2009න් පසු මෙවර සිදු කරන දළ දා ප්‍රදර්ශනය රටේ බොහෝ ක්ෂේත්‍ර වෙත ආශිර්වාදාත්මක බවක් ගෙන දෙනු ඇති. 'සියැසින් දළ දා වහන්සේ දැක ගැනීමට' ලැබෙන හැකියාව නිසා මෙවරත් අතිවිශාල පිරිසක් උතුම් දළ දා නමස්කාරය සඳහා පැමිණේවි යැයි විශ්වාස කරනවා. 2009 වසරේ ලක්ෂ 40ක පමණ ජනතාවක් පැමිණි බව සඳහන්.

රටේ සහජීවනයට, එකමුතුවෙන් රට ගොඩනැගීමට මේ 'දළ දා දැක්ම' පුණ්‍ය ක්ෂේත්‍රයක් වනු ඇතැයි යන විශ්වාසය අපට තිබෙනවා. ඒ නිසා, ඉතා සාමකාමී ව පින් සිත් පෙරදැරි ව මේ මහා පුණ්‍යෝත්සවයට සහභාගි වීම රටේ ජනතාවගෙන් සිදු විය යුත්තක්. අවශ්‍ය සියලු පහසුකම් හා අදාළ සහන කණ්ඩායම්වල සහයෝගය මේ කාර්යයට ඉහළින් ම ලැබෙනවා. ලද මේ දුර්ලභ වූ උතුම් අවස්ථාව ගෞරවනීය ව සමගිසම්පන්න ව චිත්ත වීර්යයෙන් යුතු ව අත්විඳීමයි කළ යුත්තේ. ඒ සඳහා සකලවිධ ජනතාවට ම දළ දා ආශිර්වාදය ලැබී සිත් සුවපත් වේවා.

**නිශාන්ත පීරිස්**

# මහා ජන සෙත් සුව

# මහානීය පිංකම





**ප්‍රදීප් නිලංග දැල**
දියවඩන නිලමේ - ශ්‍රී දළ දා මාලිගාව

බුද්ධ, ධම්ම ද්විධ රත්නයේ මහානීය සංකේතය වූ අතිඋත්තම දළ දා වහන්සේ විෂයෙහි සිදුකෙරෙන නන්විධ පූජා අතුරින් සිරි දළ දා වන්දනාව ඉතා සුවිශේෂ පූජා චාරිත්‍රයක්. එය පැවැත්වෙන්නේ කලට වැසි ලැබ, රටට සමෘද්ධිය, සෞභාග්‍යය, සමගිය හා සමාදානය, සතුට ප්‍රාර්ථනා කොට දැහැමි සමාජයක් බිහි කිරීමේ අරමුණෙන්. අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගෞරවනීය මහ සඟරුවනට පින් සිදුවන්නට එම පූජා චාරිත්‍ර, තේවා විධි අදටත් අප උරුමයක් ලෙසින් සුරැකී තිබීම ජාතියේ වාසනාවක්.
සිරි දළ දා වන්දනාව පැවැත්වීමට දින නියම කරගත් පසු එහි මූලික කාර්ය සංවිධානය උභය මහා විහාරයන්හි අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේ දෙනමගේ අවවාද අනුශාසනා, මාර්ගෝපදේශනය අනුව ඉටු කිරීමේ වගකීම පැවරුණේ දළ දා වහන්සේගේ ගිහි භාරකාර දියවඩන නිලමේවරයා වෙත. විශේෂයෙන් පෙර රජ දවස එම සංවිධාන කාර්යයේ මූලිකත්වය ගනු ලැබුවේ රටේ රජතුමා. එහෙත් ක්‍රි. ව. 1853න් පසුව එම වගකීම් සම්භාරය දියවඩන නිලමේවරයා වෙතයි පැවරී තිබෙන්නේ. එකී ව්‍යවස්ථාව හා ක්‍රි. ව. 1931 විහාරදේවාලගම් පනතේ විධිවිධාන අනුව එය අදටත් සිදු වනවා.

පසුගිය වකවානුවේ මානුෂවාදී යුද මෙහෙයුමේ අවසාන භාගයෙහි දළ දා ප්‍රදර්ශන පූජෝත්සවයක් සංවිධානය කළ යුතු වූ බැවින් එවර රාජ්‍ය වර්ෂ 2009 මාර්තු මස 06 දින මෙවැනි දළ දා ප්‍රදර්ශනයක් ඇරඹුණා. එදා එය සිදු කළේ ආරක්ෂක විධිවිධාන සම්බන්ධ ව විශේෂ අවධානයක් යොමු කරමින්. දළ දා වහන්සේගේ හා ශ්‍රී දළ දා මාළිගාවේ ආරක්ෂාව අරභයා දුරාතීතයේදී රජ දරුවන්ගේ රාජකීය හමුදා බණ්ඩවල සහය නොඅඩුව ලැබුණු බව වංශ කථාවලින් පවා හෙළි වනවා. පොළොන්නරුවේ විජයබා රජු එය සිදු කළ ආකාරය ගැන, අදටත් වේලක්කාර සෙල්ලිපිය කදිම නිදසුනක් වන්නේ ඒ අනුව. අදටත් එය නිවැරදි ව නිසි ආකාරයෙන් ඉටු කිරීම අතිශය වැදගත්.

එදා එම දළ දා දැක්ම සුබ මොහොතින් ආරම්භ වූ විට මහත් ශ්‍රද්ධාවෙන් පිනා ගිය උවැසි උවැසියන් වෙහෙස මහන්සිය නොතකා පැය ගණන් පේළි ගැසී සිට ජීවමාන බුදුන් දැක්කා සේ සිත් පහන්කොට, සුවඳ මලින්, පිරිකරින් දළ දා වහන්සේ පිදුවා. ශ්‍රද්ධාවෙන් පිනා ගිය බොහෝ උවැසියන් තම ගෙල පැලඳි මාල, කන් පැලඳි කරාබු, දෑත සැරසූ රන් වළලු ක්ෂණයකින් ගලවා දළ දා වහන්සේ පිදූ අයුරු බුදු බැතිය දනවන දසුනක් වුණා. එක් ගැමි මාතාවක් තම ගෙල සරසා තිබූ රන්මාලය ගලවා පූජා කළ ආකාරය දුටු එතැන්හි සිටි බොහෝ දෙනා තුළ බුද්ධාලම්බන ප්‍රීතිය ඉපිලී ගියේ නෙතග නැගි කඳුළුවලින්. දළ දා වන්දනාව ඇරඹුණු මුල් දිනයේ ප. ව. 5.15 ට පමණ එතෙක් මහනුවර පැවති තද නියඟය කෙළවර කොට ඇදහැළුණු මහ වැස්ස දළ දා ප්‍රාතිහාර්යයකින් සිදු වූවක් බව සියලු සැදැහැවතුන්ගේ ජීවමාන පිළිගැනීම වුණා. මේ අසිරිය දුටු බැතිමතුන්ගේ සාධු නාදයෙන් අවට ගිගුම් දුන් අතර අහස ගුගුරුවමින් ඇදහැලුණු වැසි දිය දහර පවා ඒ ජනතාව සැලකුවේ ආශිර්වාදයක් ලෙසින්.

එවර සිරි දළ දා වන්දනා පූජා දිනවල සුවිශාල ජන ගංගාවක් මහනුවර නගරයට ඇදී ආවත් දළ දා සමිඳුන්ගේ ප්‍රාතිහාර්යයකින් මෙන් කිසිදු අතුරු ආන්තරාවක් නොවී එවර උතුම් සිරි දළ දා වන්දනාව සාර්ථක ලෙස අවසන් වීම සකල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ බලවත් ප්‍රීති ප්‍රමෝදයට හේතුවක් වුණා. එය මෙවර ද අපේක්ෂාවක්.

අප රටේ මහා පූජනීය උරුමය ලෝකයේ ම උත්තරීතර පූජ්‍ය වස්තුවක් හෙයින් මේ උතුම් කාර්යය ලෝක බෞද්ධ ජනතාවට මෙන් ම මෙත් සිතැති ඕනෑ ම අයකුට පින් සිත් උපදවන්නක්. එය සශ්‍රීක පුණ්‍ය අස්වැන්නක් බවට පත් කර ගැනීමට මේ සමය උපකාරී කර ගැනීමයි යෝග්‍ය වන්නේ.

**නිශාන්ත පීරිස්**



**ඩබ්.පී. සේනාධීර**
ලේකම්
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# චිත්ත දමනයෙන්
# දළ දා නමදින්න

රටේ ජනතාවට බොහෝ කලකට පසුව අතිඋතුම් දළ දා වහන්සේ දැක, වැඳ පුදා ගැනීමට ලැබුණු මේ අවස්ථාව ඉතා සුවිශේෂ වූවක්. රටේ ජනාධිපතිතුමා කළ මේ ඉල්ලීමට ත්‍රෛනිකායික මහා සංඝරත්නය නියෝජනය කරන මහා නා හිමිපාණන් වහන්සේලා සිය අභිමතය ප්‍රකාශ කිරීමත් මෙහිදී වැදගත් වුණා. අප්‍රේල් මස දළ දා ප්‍රදර්ශනය පැවැත්වෙන දින 10යේ ම දළ දා වන්දනාව සේ ම ඒ හා බැඳි සංස්කෘතිය, සම්ප්‍රදය මෙන් ම දළ දාවෙන් අපේ ජීවිතවලට වැටුණු ධර්මාලෝකය පිළිබඳ සමාජයේ කතිකාවක් ඇති කිරීමත් ප්‍රමුඛ අපේක්ෂාවක්. විශේෂයෙන් ජනමාධ්‍ය සහ වෙනත් සන්නිවේදන මාර්ග ඔස්සේ රටේ ජනතාවට එකී පණිවුඩය ඒත්තු ගැන්වීම සිදු විය යුතුයි. උත්තම දළ දා වහන්සේ ශ්‍රී ලංකාවේ මුදුන්මල්කඩ වීමෙන් වසර දහස් ගණනක් රැක දුන් සම්බුද්ධ ධර්මයේ සැබෑ උරුමය යළි සනාථ කරවීමත් මෙයින් මල්ඵල ගැන්වෙනවා.

දළ දා ඉතිහාසය හා සම්ප්‍රදාය මෙරට ජන සමාජයේ කවරාකාර නව ආකල්පයක් ඇති කරන්නේ ද යන්න ගැනත් ගැඹුරින් විමසා බැලිය යුතුයි. විශේෂයෙන් එම ජන උරුමය නූතන යොවුන් පරම්පරාව වෙත සම්ප්‍රේෂණය කරවීමයි මෙහි වැදගත් ම කාරණය. එය ප්‍රත්‍යක්ෂ උරුම සමූහයක්. එදා මෙදාතුර සිංහල ජන සමාජයේ පමණක් නොව ලාංකික ජන විඥානයේත් තදින් බැඳුණු හුස්මක් තරමට ම එය ප්‍රාණ ගුණයෙන් යුතු ශක්තියක්.

විශේෂයෙන් පාසල් දරු පරපුර ඇතුළු මෙරට මහා සමාජයට දළ දා වහන්සේගේ ආශිර්වාදාත්මක නව සාංකල්පික හරය ඔවුන්ගේ ජීවිතවලට කෙතරම් ශක්තිමත් ආලෝක ධාරාවක් වනු ඇත් ද? යන්නත් ගැන මෙහිදී අලුතින් සිතීමට හැකි වනවා.

දළ දා සම්ප්‍රදාය හා පෙර අත්දැකීම් අනුව දළ ද දැක්මට ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මහනුවරට පැමිණෙනු ඇතැයි යන පුරෝකථනය කරන්නට පුළුවන්. ශ්‍රී ලංකා යුද හමුදාව, පොලිසිය ඇතුළු සියලු ආරක්ෂක අංශ, විදුලිබල මණ්ඩලය, මධ්‍යම පළාත් සභාව ඇතුළු සියලු රාජ්‍ය ආයතන හා සෙසු ආයතන සංවිධාන ආදිය මෙහිදී වඩාත් සංවිධිත වන්නේ එය ඉතා ඉහළ මට්ටමකින් සිදුකිරීමට. පැමිණෙන ජනතාවගේ ආරක්ෂාව හා සෙසු පහසුකම් සියල්ල නොපිරිහෙලා ඉටු කිරීම සඳහා රජයේ වගකීම උපරිමයෙන් ලබාදීමයි අපගේ උත්සාහය.

විශේෂයෙන් මහජනතාව ලෙස මේ වන්දනීය බොදු උලෙළට සහභාගිවීමේදී සංයමය, විනය හා පවිත්‍රත්වය ඉතා ඉහළින් පවත්වා ගැනීම වැදගත්. ඓතිහාසික මහනුවර පුරවරය කිලිටි නොකර, කැළිකසළ නොදමා ආදර්ශමත් ජන මෙහෙවරක් ඉටුවනු දැකීමේ පරම අපේක්ෂාවක් අපට තිබෙනවා. විශාල ජන සන්නිපාත සිදුවන ස්ථානවලට වඩා මේ අවස්ථාව වෙනස්. මෙය උතුම් වන්දනාවක් පෙරදැරි ව සිදු වන ජන ඒකරාශී වීමක් නිසා බුදුදහමේ හරය වටහාගෙන ඒ හා සම්බන්ධවීමයි ජනතාවගේ පාර්ශ්වයෙන් විය යුත්තේ. මෙය සැණකෙළියක් හෝ ප්‍රීති උත්සවයක් නොවන වග තේරුම් ගත් උසස් සමාජ පැවැත්මක් සහිත, ශික්ෂණයක් සහිත ජනතාවක් ලෙස ඊට යොමුවීම වැදගත් බවයි අප අවධාරණය කරන්නේ.

ඇතැම් විට එක ම අපේක්ෂාවෙන් එන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට දිනක පැය පහක කාලයකදී දළ දා වහන්සේ දැක වැඳ පුදා ගැනීමට සිදු වනවා. නමුත් මෙහිදී අදාළ කාලසීමාවේදී එය දැක ගැනීමට නොහැකි වුවහොත් කිසිවකු ඉන් කෝපයට පත් නොවීමත් ආවේගශීලී නොවීමත් ඉතා ම වැදගත්. ධර්මානුකූල ව ම ඒ ගැන සිතා බලා ක්‍රියා කිරීමට ඒ සෑම පුරවැසියකුට ම චිත්ත ධෛර්යයක් තිබිය යුතු බව කලින් ම අවධාරණය කර ගැනීම වටිනවා. කිසිවකු අපේක්ෂාභංගත්වයකට පත් විය යුතු නැහැ. එවැන්නක් සිදු වුණත් එය ඉවසීමෙන් දරා ගැනීමට තරම් චිත්ත වීර්යයක් ගොඩනගා ගැනීම ම කුසලයක්.

විවිධ මතවාද, අභිලාෂ දරන මහා ජන සමූහයක් විනයවත් සුපිරිසිදු සිත්සතන් බවට පත් කිරීම අපහසු වුවත් මේ උතුම් වන්දනීය පිංකම පුණ්‍යකර්මයක් ලෙස ම අර්ථවත් කර ගැනීමයි වඩා වැදගත්. මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ පුණ්‍ය ක්ෂේත්‍රයකට නුසුදුසු කිසි ම දෙයක් භාවිත කර හෝ එබඳු නොගැළපෙන කිසි ම ආකාරයකින් කිසිවකුටත් දළ දා පූජෝත්සවය පැවැත්වෙන සීමාවට පැමිණීමට ඉඩක් නොතබන බවට ආරක්ෂක අංශ ප්‍රබල සුරක්ෂාවක් ඇති කිරීමත් ඉතා වැදගත්.

මේ නිසා ගතත් සිතත් පළුදු නොකරගෙන සන්සුන් ලෙසින් මේ පිංකම හා ඒකාත්මික වන මෙන් ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. එය ඉතා ශික්ෂණයෙන් යුතු ව නොපිරිහෙළා ඉටු කිරීමයි ජනතාවගේ වගකීම හා යුතුකම වන්නේ.

**නිශාන්ත පීරිස්**

**නුවන් කුමාර කටුගම්පල**

දේශීය ගීත ක්ෂේත්‍රයේ මේ ගාම්භීර ගී හඬ පෞරුෂය පළමු වරට ශ්‍රී ලංකා ගුවන්විදුලියෙන් නින්නාද නැංවුණේ 1973 පෙබරවාරි 19 දින. එදා ඔහු ගැයූ 'දෑස නිලුපුල් තෙමා' ගීතයට අදටත් ඔබ ආදරෙයි. එහි පද නිමැවුම්කරු ප්‍රියානන්ද විජේසුන්දර. තනුව යොදා සංගීතවත් කළේ මහාචාර්ය සනත් නන්දසිරි. එතැන් පටන් ශ්‍රී ලාංකේය ගීත ලෝලීන්ගේ මතු නොව සමාජ ශෝධක ක්‍රියාකාරීන්ගේ ද විකල්ප මතධාරීන්ගේ ද වාමාංශික සහ සමාජවාදී දේශපාලන මැදිහත්කරුවන්ගේ ද දේශීය තරුණ ප්‍රජාවගේ ද මතවාදීමය සහෘදයෙක් බවට ද ඔහු පත් වුණා. සිය අවසන් විදෙස් සංචාරයත් අවසන් සංගීත සංදර්ශනයත් නිමවා ඩුබායි රාජ්‍යයේ සිට කටුනායක ගුවන්තොටුපළට ගොඩබසිද්දී සිදු වූ, ඒ හඬ නිහඬ කළ දෛවයේ සරදම් සහගත ක්‍රියාව සුවහසක් ශ්‍රී ලාංකික ප්‍රජාව කම්පිත කළේ කම්පන ප්‍රසංගයෙන් ඔහු සිදු කළ සමාජ ප්‍රකම්පනයට වඩා සිය දහස් ගුණයක ඉහළ අගයකින්. ඒ, 2003 අප්‍රේල් 03 දින. 2025 අප්‍රේල් 03 දිනට යෙදෙන්නේ ඔහුගේ 22 වැනි ගුණානුස්මරණය.

1945 අගෝස්තු 07 දින උපත ලද ඔහු සිය ගායන දිවිය ආරම්භ කළේ තම මාමා වන එස්. එඩ්මන්ඩ්ගේ යොමු කිරීමෙන් ගමේත් පාසලේත් සංදර්ශන වේදිකා සහ නාට්‍ය වේදිකාවල ගී ගයා ලද පරිචය ඇති ව. 1963 සිට රජයේ ලලිත කලා ආයතනයේ (හේවුඩ්) උගෙන ගත් ඔහු 1965 වසරේදී ඉන්දියාවේ ලක්නව්හි භාත්ඛණ්ඩේ සංගීත ආයතනයට ඇතුළත් වූයේ තම සංගීත ශාස්ත්‍ර ඥානය වඩවා ගන්නට. එහිදී පණ්ඩිත් හරිශංකර් මිශ්රා, උස්තාද් මක්ෂූඩ් අලි, පණ්ඩිත් රත්නජංකර්, සීතා ශිරන් සිං වැනි ගුරුවරුන් යටතේ සංගීත විශාරද උපාධිය හදාරා ඉන් ඔහු සමත් වූයේ 1969 වසරේදී. එම වසරේදී ම ශ්‍රී ලංකා ගුවන්විදුලිය සංස්ථාවේ ක්‍රියාකාරී සහකාරවරයකු (ශබ්ද පරිපාලක) ලෙස සේවයට එකතු වූ ඔහු ස්ථිර සේවයට පත් වූයේ 1970 වසරේදී. 1974 වසරේදී 'ඒ' ශ්‍රේණියේ ගුවන්විදුලි ගායකයකු වූ ඔහු ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදක තනතුරට උසස් වූයේ 1975 වසරේදී.

ගුවන්විදුලි නාට්‍ය සංගීතවත් කර පළපුරුදු ඔහු මුලින් ම වේදිකා නාට්‍යකට සංගීත අධ්‍යක්ෂණයෙන් දායක වූයේ 1973 වසරේදී නාට්‍යවේදී සුගතපාල ද සිල්වා නිර්මාණය කළ තුරඟ සන්නියෙන්. තාරාවෝ ඉගිළෙති, සිරකඳවුර ඇතුළු වේදිකා නාට්‍යවලට ද මුසු වූයේ ඔහුගේ සංගීතය. ඔහු ප්‍රථමවරට චිත්‍රපටයක සංගීතය නිර්මාණය කළේ 1979 වසරේදී. ඒ, 'සඳා' චිත්‍රපටයට. චුට්ටේ, රතු මකරා, මාලගිරවී, පුතුනි මට සමාවෙන්න සහ ධර්මසිරි බණ්ඩාරනායකගේ භව දුක සහ භව කර්ම යන චිත්‍රපටවල සංගීත නිර්මාණත් ඔහුගේ. එක්ටැම්ගේ චිත්‍රපටය සඳහා ගැයූ 'උන්මාද සිතුවම්' ගීතයේ පටන් ඔහු ගැයූ චිත්‍රපට ගීත සංඛ්‍යාව අතළොස්සක්. බිතුසිතුවම් චිත්‍රපටයට මහාචාර්ය සුනිල් ආරියරත්න රචනා කළ 'කියග මගිය' ගීතයට සහ විසිදෑළ චිත්‍රපටයට එච්.ඩී. ප්‍රේමරත්න රචනා කළ 'බිඳුණා දැහැන් බිඳුණා' ගීතයට ඔහු වෙත සරසවිය සම්මාන උලෙලේ හොඳ ම ගායකයාට හිමි සම්මානය පිරිනැමුණා. ඔහුගේ ගායනය සහ සංගීතය සම්මානයට පාත්‍ර කළ උලෙළ අතරට සවර්ණසංඛ, රස සංගීත සම්මාන, ජනාධිපති, OCIC, ප්‍රසාද පූජා ද අයත්.

එවක ප්‍රමුඛතම රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතනයේ සේවය කරමින් සමාජවාදී දේශපාලනික, දාර්ශනික පදනමක පිහිටා ධනවාදී රාජ්‍ය යාන්ත්‍රණය නිසා අසාධාරණයට සහ පීඩනයට ගොදුරු වන ජනතාව වෙනුවෙන් නිර්මාණාත්මක හඬ අවදි කිරීම නිසා 1977 වසරේදී බලයට පත් වූ ආණ්ඩුවේ බලධාරීන් ඔහුගේ ගීත ගුවන්විදුලිය ඔස්සේ ප්‍රචාරය කිරීම තහනමට ලක් කළා.

1978 ජූලි 22 දින කියුබාවේ හවානා නුවර පැවැති තරුණ සමුළුවට සහභාගි වී ආපසු පැමිණීමේදී සේවය හැරගියා සේ සැලකෙන ලිපිය ගුවන්තොටුපළට ම ගෙනවිත් භාර දී තිබෙනවා. ඒ වසරේදී ම යළි සේවයේ පිහිටුවන ලද්දේ වී නමුත් එවක සිටි අගමැතිවරයාට අපහාස කළේ යැයි චෝදනාවකට බන්ධනාගාරගත ව සිටින්නටත් ඔහුට සිදු වුණා. මෙසේ ඔහු කිහිපවරක් ම වැඩ තහනමට ලක්වන්නේ රාජ්‍ය පාලකයන්ගේ අත්තනෝමතික සහ අදූරදර්ශී ක්‍රියා පිළිවෙත් නිසා පීඩාවලින් මිරිකෙන මහජනතාවගේ නිවීම, සැනසීම, ගැලවීම සහ මිදීම වෙනුවෙන් රාජකාරිය භාවිත කිරීමේ සද්කාර්යමය වරද හේතුවෙන්.

> ඔහු ගැයුවේ හෝ සංගීතවත් කළේ අර්ථය, ගැඹුර, සාහිත්‍යමය ගුණය සහිත පදවැල් පමණයි. සමාජවාදී දෘෂ්ටිය, මානව ප්‍රේමය, සාමය, ජනවාර්ගික සහජීවනය, යුක්තිය, සාධාරණය, සමානාත්මතාව, ආදරය, විරහව වැනි තේමා පාදක කරගත් සුගේය පදරචනා කෙරෙහි ඔහු වඩාත් ආසක්ත වූයේ විශේෂයෙන් ඔහුට ගී පද රචනා කළ ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ, වෛද්‍ය යසනාත් ධම්මික බණ්ඩාර වැනි පරපුර කිහිපයකට අයත් ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රගතිකාරක ගීත රචකයන් සමග කළ ඥාන හුවමාරුවේ ද සහායෙන්.

1980 වසරේදී ගායිකා මාලනී බුලත්සිංහල සමග එක් ව සිය ප්‍රථම ගීත එකතුව වූ 'දම් පාටින් ළා සඳ බැස යනවා' ගීත කැසට්පටය නිකුත් කළ ඔහු සීතල සඳ එළියේ, උන්මාද සිතුවම්, ඉරබටු තරුව, මාවතේ ගීතය, පියසටහන්, කම්පන, සඳ රෑ සිහිනයේ, මිරිවැඩි සඟළක් කැසට් පට නිකුත් කර ඇති අතර සන්ෆ්ලවර් සංගීත කණ්ඩායම සමග නිකුත් කළ කැසට්පටය, එතෙක් ඔහු රඳවා ගත් රසික පිළිගැනීම වෙනත් මානයකට හැරවීමට හේතු වුණා. නමුත් එමගින් වැඩි සමාජ වපසරියක ඔහුගේ ගීත විසරණය වුණා.

1981 වසරේදී ඔහුට ගුවන්විදුලිය සංස්ථාවේ රැකියාව යළි ලැබුණේ ඒමන් කාරියකරවන සභාපතිවරයාගේ මැදිහත්වීමෙන්. එම වසරේදී ම රජරට සේවයට ලද ස්ථාන මාරුවෙන් ඔහුගේ රාජකාරි ජීවිතය උඩු යටිකුරු වී ස්වකීය අනන්‍ය කුසලතා ප්‍රභාවත් කරන රාජකාරි ජීවිතයකට ඉඩ ප්‍රස්ථා සැකසුණා. එවක රජරට සේවා අධ්‍යක්ෂ විජයානන්ද ජයවීර, මාධ්‍යවේදී නිව්ටන් ගුණසේකර, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර වැනි ප්‍රවීණයන්ගේ ඇසුරින් ඔහු ලද පන්නරය ඉමහත්. එහිදී තම සමාගමයට සබැඳුණු ගීත රචකයන් වන පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි, මහින්ද චන්ද්‍රසේකර, මහින්ද දිසානායක වැනි අය ද ගායක ගායිකාවන් වන ජානකී සුමිත්‍රා, ජයතිලක බණ්ඩාර, වේරලියැද්ද, දිවුල්ගනේ, ජානක, ක්‍රිශාන්ත එරන්දක වැනි ජනප්‍රිය ගායකයන් ද වඩාත් නැඹුරු වූයේ මානවවාදී නිර්මාණ සමාජගත කිරීමට. ආචාර්ය අමරදේවගේ 'කොළොම් තොට' ගීතයත් රංගධර විජයගේ 'දෑගගෙයි දඬුවම්' ගීතයත් රචනා කළ ගීත රචකයා වන්නේත් ඔහු.



# බක් මහේ නික්ම ගිය කෝකිලයා

1988/89 අවධියේ රාජ්‍ය පාර්ශ්වයෙන් දියත් කළ මර්දනකාරී අනාරක්ෂිත වාතාවරණයට මුහුණදුන් ඔහු කොළඹ ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවක් ලබා ගත් නමුත් ඔහුට ගුවන්විදුලිය සංස්ථාවේ සේවය කරන්නට ලැබුණේ 1990 ජනවාරි මාසය දක්වා පමණයි. එම මස 29 දිනෙන් ගුවන්විදුලියෙන් සමු ගත් ඔහු අගෝස්තු 25 දින සමස්ත සමාජය ම නිද්‍රාශීලී ව, ගොළු ව සිටින මොහොතක ගීතයෙන් ඔවුන් අවදි කරමින් කම්පන ප්‍රසංගය ආරම්භ කළා. එය මෙරට තරුණ පරපුර ජනතාවාදී දේශපාලන ප්‍රවාහයට තවදුරටත් ඇඳා, රඳවා ගැනීමටත් මහජනයාට පාලකයන්ගෙන් සිදුවන අකටයුතුකම් දැඩි ස්වරයෙන් පෙන්වා දීමටත් අසාධාරණය, අවනීතිය, භීෂණය සහ දේශපාලන එදිරිවාදිකම් ප්‍රශ්න කිරීමටත් නිර්භය ව වේදිකාව සහ ගීතය භාවිත කිරීමට ඇති හැකියාව ප්‍රබල ව පෙන්වා දුන් ප්‍රාසංගික ක්‍රියාත්මක වීමක්. ඊට පෙර ඔහු කාලයේ රාවය සහ මාවතේ ගීතය ප්‍රසංග පවත්වා තිබුණා.

ඔහු ගැයුවේ හෝ සංගීතවත් කළේ අර්ථය, ගැඹුර, සාහිත්‍යමය ගුණය සහිත පදවැල් පමණයි. සමාජවාදී දෘෂ්ටිය, මානව ප්‍රේමය, සාමය, ජනවාර්ගික සහජීවනය, යුක්තිය, සාධාරණය, සමානාත්මතාව, ආදරය, විරහව වැනි තේමා පාදක කරගත් සුගේය පදරචනා කෙරෙහි ඔහු වඩාත් ආසක්ත වූයේ විශේෂයෙන් ඔහුට ගී පද රචනා කළ ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ, වෛද්‍ය යසනාත් ධම්මික බණ්ඩාර වැනි පරපුර කිහිපයකට අයත් ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රගතිකාරක ගීත රචකයන් සමග කළ ඥාන හුවමාරුවේ ද සහායෙන්. විශේෂයෙන් බිම්බරක් සෙනඟ, ලෙලි තලන නුඹෙ අතට, උතුරු කොණේ යනාදී ගීත රචනාවල තිබෙන ගැඹුරු සමාජ, ආර්ථික, දේශපාලන සහ මානව හරය රසිකයාට මනාව අවබෝධ වන්නට ප්‍රබල ව දායක වුණේ ඔහුගේ හඬ තීව්‍රතාව.

දේශීය විදේශීය සිංහල සංගීත සංදර්ශන වේදිකාවට නැති ව ම බැරි ගායකයකු වූ ඔහු මුදල මත නොයැපුණු, ලැබුණු මුදල ද සිය පුද්ගලික පරිහරණයට නොගෙන හිතමිත්‍රාදීන්ගේත් නන්නාඳුනන අසරණ මිනිසුන්ගේත් විවිධ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පරිත්‍යාග කළ, සූරාකෑමෙන් තොර සමානාත්මතා සංකල්පය පෙරදැරි සමාජයක බලාපොරොත්තුව සහිත ව

සංගීත විද්‍යාත්මක පර්යාවලෝකන මත පිහිටා කෙරුණු විචාර වීමංසන විශාරද ගුණදාස කපුගේ ගැන තබා ආචාර්ය පණ්ඩිත් අමරදේව ගැනවත් මෙතෙක් සිදු නොවීම ඛේදයක්. එබැවින් බොහෝ විට රසිකයාට හමුවන්නේ සාහිත්‍යවේදීන් සහ ගීත රචකයන් විසින් උත්කර්ෂයට නගන ලද වර්ණනාවිෂයාතික්‍රාන්ත, සාහිත්‍යයික ගායකයෙක්. සාහිත්‍යයික සංගීතවේදියෙක්. එහිදී 'මානව හිතවාදී සුගැඹුරු ස්වරය, විමුක්තියේ අභීත නාදය, විප්ලවයේ කාහල නාදය, ජාතියේ පිනට උපන්, රත්තරන් හදවතක් ඇති' යනාදී භාවාතිශය සුවිශේෂණ රැසකින් ගායකයා හෝ සංගීතවේදියා සරසනවා.

# සංගීතඥයා වසා ගත් ගායකයා

කවර හෝ සංගීත කෘතියක්, සංගීතඥයෙක් පිළිබඳ සංගීත විද්‍යාව සහ සංගීත විචාරවේදය යන විෂය ඔස්සේ සාකච්ඡා කෙරෙන්නේ තානිකත්වය (Tonality) තානමය ප්‍රයෝග (Tonal Techniques) සහ තානමය සාහිත්‍ය (Tonal literature) යන මුඛ්‍ය සංගීත විද්‍යාත්මක සංකල්ප මත පිහිටමින්. මෙමගින් සංගීතවේදියාගේ සංගීතවේදීමය බව (Musicianship), සංගීතමය බුද්ධිය (Musical, Intelligence) ඔහුගේ ප්‍රත්‍යුත්පාදන පරිකල්පන ශක්තිය (Reproductive imaginative Power) සපුරා විනිශ්චය කෙරෙනවා. වචනවලට හිමි ගද්‍ය සහ පද්‍ය සාහිත්‍ය මෙන් සංගීතයට ද නාදමය (තානමය) සාහිත්‍යයක් ඇති බව අවධාරණය කිරීමයි සංගීත විචාරවේදයේ මූලික වෛෂයික ප්‍රවේශය.

මෙවැනි සංගීත විද්‍යාත්මක පර්යාවලෝකන මත පිහිටා කෙරුණු විචාර වීමංසන විශාරද ගුණදාස කපුගේ ගැන තබා ආචාර්ය පණ්ඩිත් අමරදේව ගැනවත් මෙතෙක් සිදු නොවීම ඛේදයක්. එබැවින් බොහෝ විට රසිකයාට හමුවන්නේ සාහිත්‍යවේදීන් සහ ගීත රචකයන් විසින් උත්කර්ෂයට නගන ලද වර්ණනාවිෂයාතික්‍රාන්ත, සාහිත්‍යයික ගායකයෙක්. සාහිත්‍යයික සංගීතවේදියෙක්. එහිදී 'මානව හිතවාදී සුගැඹුරු ස්වරය, විමුක්තියේ අභීත නාදය, විප්ලවයේ කාහල නාදය, ජාතියේ පිනට උපන්, රත්තරන් හදවතක් ඇති' යනාදී භාවාතිශය සුවිශේෂණ රැසකින් ගායකයා හෝ සංගීතවේදියා සරසනවා. සාමාන්‍ය රසිකයා ද එය සංගීත විචාරයකැයි සිතා ඉන් තෘප්ත වනවා.

සැබවින් ම සංගීතවේදියාගේ ලෝකය වන්නේ තානමය ලෝකය (Tonal World). ඔහුගේ සංගීතාත්මක මනසේ (Musical mind) රැව් දෙන්නේ එකී සංගීතාත්මක මනසේ සංජානනමය පරිමාව. එය ආත්මීය පාර්ශ්වය (Subjective factors) ලෙස ද ඉනික්බිති ව ඔහු හැදෑරීම් සහ අභ්‍යාසයෙන් ව්‍යුත්පන්න වීම (Objective factors) වෛෂයික පාර්ශ්වය ලෙස ද හැඳින්වෙනවා. සංගීතාත්මක චිත්ත රූප (Musical imagery) / සංගීතමය වේදිත (Musical feeling) / සංගීතමය ස්මෘතිය (Musical memory) / සංගීතමය අභිවහනය (Musical performance) සහ ප්‍රත්‍යුත්පාදන පරිකල්පන ශක්තිය යන නිර්ණායක මත පිහිටා සංගීතවේදියාගේ නිර්මාණ චර්යාව විග්‍රහයට ලක් කිරීම සිදුවනවා. මෙහිදී සංගීතවේදියා සතු සංගීතාත්මක බුද්ධියේ ශක්‍යතාව මෙන් ම ඔහුගේ සෙසු බහුවිධ බුද්ධි ශක්‍යතා ද



ක්‍රියා කළ අයෙක්. නම ඇසූ පමණින් ගීත මතක් වන සහ ගීත ඇසූ පමණින් නම මතක් වන අනනුකරණීය හඬ අනන්‍යතාව ඔහුගේ සුවිශේෂත්වය. උප්පැන්න සහතිකයට ඇල්ලමුල්ල කපුගේ ගුණදාස ද පවුලට කළු මහත්තයා ද වූ මේ අමරණීය හඬ හිමි අසහාය මානවහිතවාදී කලාකරුවා රට හඳුනන්නේ ගුණදාස කපුගේ කී විට. ගීතයෙන් බැහැර 'කපුගේ සංගීතය' සහ 'සංගීතයේ කපුගේ' ගැන පුළුල් සාකච්ඡාවකට තවමත් නොඑළඹීම අඩුපාඩුවක්. ඒ සඳහා ප්‍රවිශ්ට වීම අවශ්‍යතාවක්.

සංගීතවේදියාගේ රූපීය අනන්‍යතාව හා කොතෙක් ඓන්ද්‍රීයබද්ධ ව ඇත්ද යන්න විශ්ලේෂණය කොට ගැනීම සංගීත විචාර කාර්යයේ අනිවාර්ය කොන්දේසිය.

මේ අනුව සලකා බලන කල ගුණදාස කපුගේ යනු ගුණාත්මක වර්ගයේ (Qualitative type) සංගීතඥයෙක්. ගුණාත්මක වර්ගයේ සංගීතවේදියාගේ හැඩරුව වන්නේ ඔහු සෑම විට ම ස්වකීය නිර්මාණ කාර්යයේදී වියරණමය අලංකාරෝක්ති හා පෙළගැසුම් (Chords, harmony, Counterpoints, arrangement, Orchestration) ඉතා ප්‍රබල රසෝත්කර්ෂමය සාධකාංග ලෙස භාවිත කිරීම. විශාරද කපුගේ විසින් නිර්මිත සියලු ගී නිර්මාණවල මේ ලක්ෂණය නොඅඩුව දැකිය හැකි අතර ගීතයේ ප්‍රස්තුතය හා මනෝභාවය කවරක් වුව ද එකී තානමය පෞරුෂය (Tonal personality) අතිශය චාරුතර රීතික විචිත්‍රත්වයක් ලෙසයි සටහන් ව තිබෙන්නේ.

තනු නිර්මාණ කාර්යයේදී පිබිදෙන ඔහුගේ ප්‍රත්‍යුත්පාදන පරිකල්පන ශක්තිය ඉතා විශිෂ්ටයි. ඔහු උගත් උත්තර භාරතීය රාගධාරී සංගීතයත් හඳ යෞවනයේදී ආස්වාද කොටගත් හින්දි සිනමා සංගීතයත් නෞෂාඩ්, සී. රාමචන්ද්‍රන්, සලීල් චෞද්රි, ශංකර් ජායිකිෂන්, ඕ.පී. නයියාර්, රවි වැනි සංගීතවේදීන්ගේ භාව ප්‍රභාවත් කපුගේ සංගීත රීතිය තුළ ආත්මීය කවිතාව බවට පත් ව තිබෙනවා. තනු නිර්මාණකරණයේදී තානිකත්වය සම්බන්ධයෙන් (අදාළ පද රචනාවේ කාව්‍යෝක්තියට සුදුසු තනුව නිර්මාණය කිරීමෙහි ලා ඊට වඩාත් සුදුසු ස්කේලය හා ස්වර කලාපය තෝරාගැනීමේදී) විශාරද කපුගේ පළ කොට ඇත්තේ බෙහෙවින් ම ප්‍රශස්ත චාතුර්යයකැයි ආචාර්ය වික්ටර් රත්නායක පවසන්නක්.

ඔහුගේ ගායනා පිළිබඳ වගවිභාග කිරීමේදී ඔහු තුළ යම් මුකේෂ් සහ සයිගාල් රසාවේශයක් ඇතැයි ආචාර්ය තිස්ස අබේසේකර පවසන අතර ඔහු තමා වෙනුවෙන් තනු නිර්මාණය කොට ගනිමින් ගයන අවස්ථාවලදී යම් පමණකින් හේමන්ත් කුමාර් සලකුණ ද රසානුභාවික නිමිත්තක් සේ අත්විඳින බවයි අපගේ අදහස. ඔහුගේ සංගීතයේ න්‍යායික පදනම වන්නේ උත්තර භාරතීය සංගීතය වුව ද ලාංකේය ජන සංගීත ආර පිළිබඳ සහ වෙසෙසින් ම හෙළ බසෙහි ඇති ව්‍යංජනා ශක්තියත් ශබ්දාලංකාර සහ අර්ථාලංකාරත් සමස්ත භාව ධ්වනියත් පිළිබඳ සෙසු බොහෝ ශ්‍රී ලාංකික ගායනවේදීන්ට වඩා ඔහු සබුද්ධික හා රසාවිෂ්ට මනසකින් සෞන්දර්යකරණයේ යෙදුණු බැව් පෙනී යනවා. අප මුහුණදුන් නන් විධ බේදයන්හි කේන්ද්‍රය දේශපාලනික සත්තාවක් බව කපුගේ හැඳින සිටියා. ඔහු ඒ වෙනුවෙන් පුළුල් කියවීමක ද නියුක්ත ව සිටියා. එහෙත් ඔහු තුළ වූ විශිෂ්ට ගුණාත්මක වර්ගයේ සංගීතවේදියා අවදි කොට ගන්නට ඔහු කිසි කලෙකත් අවකාශ ලද්දේ නැහැ. ඔහු සතු වූ මනෝරම්‍ය තානික සාහිත්‍ය වචන රහිත ස්වායත්ත සංගීත ආඛ්‍යානයක් සේ එළිදැක්වීමේ සිහිනයක් ඔහුට තිබුණා. ඔහුට ඒ වෙනුවෙන් තමා සංගීත අධ්‍යක්ෂණය කළ භව දුක සහ භව කර්ම චිත්‍රපටවලින් යම් ස්වල්ප අවකාශයක් ලැබුණා. එහිදී ඔහු තේමා සංගීතය සඳහා භාවිත කළේ වචන රහිත ඔහුගේ ගැඹුරු හඬින් කෙරෙන ස්වරාලාපයක් පමණයි. ඔහු එහි සංගීතය වෙනුවෙන් සම්මානයට ද පාත්‍ර වුවා.

ගීතය යනු සංගීතයේ පරම නිෂ්ඨාව යැයි සමාජගත වූ රටක කපුගේ තමාට ලැබෙන රචකානුභූතීන් ස්වරාරෝපණය කළ අතර ස්වරාත්මක ව රසාරෝපණය කළා. එයින් යම් සමාජ මෙහෙවරක් සිදු වූ බව සැබෑවක්. එහෙත් වෛෂයික ව සලකා බැලූ කල ඒවා සංගීතයෙන් රසාරෝපණය වූ පද්‍ය කාව්‍යෝක්ති වශයෙන් හඳුන්වා දීම වඩාත් සාධාරණයි. එය කපුගේ මුහුණදුන් අභාග්‍යයක්. එහෙත් වචනවල අධිකාරිය සහිත ආකෘතියකට යටත් ව පවා ඔහු සිය සංගීතාත්මකභාවය (Musicality and musicianship) මනා ව ස්ඵුට කළා. ඉතා අවාසනාවන්ත ම තත්ත්වය නම් අඩුම තරමේ එකී ගී තනුවල පවා ඇති තානමය සංදර්භය සහ සංගීතාත්මක විස්තාරණය හඳුනා නොගෙන එහි භාවීය ප්‍රදීප්තියට මූලාශ්‍ර වූ තානික සංරචකයන් විශ්ලේෂණය කොට නොගෙන කෙරෙන නිරන්තර ගුණානුස්මරණ හා සාහිත්‍යයික නොස්ටැල්ජියාවකින් කපුගේ වැසීයාම. විශාරද ගුණදාස කපුගේ සතු වූ කටහඬ සංගීතවේදයේදී නම් තානමය බුද්ධියක් (Tonal intelligence/ Vocal intelligence). එය සංගීතමය බුද්ධියේ ඵලයක්. ඔහුගේ තනු නිර්මාණ සහ සංගීතය තානමය සාහිත්‍යයක් (Tonal literature). සාහිත්‍ය යනු ගද්‍ය පද්‍ය පමණක් ම නොවේ. ඒ ගැන ඇමරිකානු ගායනවේදී බොබ් ඩිලන් මෙසේ පැවසුවා. "In any Medium, where Sweet Sentiments and Emotions are generated, there is a Literature."

**ලාල් ආනන්ද අබේසිරි**



කථිකාචාර්ය
**මනිෂ දුක්ගන්නාරාළ**

# ගුරු ගීතය



'ගුරු ගීතය' නවකතාව පාදක කරගෙන උපාලි ගම්ලත් විසින් අධ්‍යක්ෂණය කරනු ලැබූ 'ගුරු ගීතය' චිත්‍රපටයේ ඔහු පෙළ අර්ථකථනය කර ගැනීම හෝ තිර කතාව රචනා කිරීමේදී ඔහු ග්‍රහණය කරගත් සහ නොගත් කරුණු පිළිබඳ අධ්‍යයනය වඩා සුදුසු යැයි මා කල්පනා කළේ එය සාහිත්‍ය කෘතියක් පදනම් කරගෙන රචනයේ යෙදෙන අනාගත තිර කතාකරුවන්ට වැදගත් වනු ඇති නිසා.

සුප්‍රසිද්ධ කිරිගිස් (Kyrgyzstan) ජාතික කතුවරයකු වූ චින්ගිස් අයිත්මාතොව් රචිත (Первый Учитель/ The First Teacher) 'ගුරු ගීතය' විශාල බලාපොරොත්තු සහ සමාජ ප්‍රතිසංස්කරණ පිළිබඳ සංකල්ප රූප ගොඩනඟන කුඩා නවකතාවක්. පවතින සමාජ සම්මතයට සහ නොදැනුවත්කමට එරෙහි ව කැරලි ගැසීමෙන් සංස්කෘතික ලෝකයක් අත්පත් කර ගත හැකි බවට ඉඟි සපයන කැරැල්ලක්. දුයිෂෙන් නිසා අකුරු උගැන්මට පටන් ගත් ගමේ ළමයින්ගේ ජීවිතය වෙනස් වන ආකාරයත් සාම්ප්‍රදායික චින්තනය විසින් නව චින්තන පරාසයක් ඇතිවීම නිරන්තරයෙන් වළක්වාලනු ලබන ආකාරයත් නිරූපණය කරමින් කතාව විකාශනය වනවා. කුසගින්න, නොදැනුවත්කම, බලාපොරොත්තු සුන්වීම, ලෝකයේ සිදුවන අසාධාරණ දෛනික ප්‍රචණ්ඩත්වය යන තත්ත්වයෙන් මිදීමට අධ්‍යාපනය මාර්ගයක්. දුයිෂෙන් මාව කැඳවාගෙන යන්නේ 2011 නිෂ්පාදනය වුණු දමිළ චිත්‍රපටයක් වන 'වාගයි සූදවා (vaagai Sooda Vaa)හි, වෙළුම්බායි වෙත. එම චිත්‍රපටය මේ නවකතාවෙන් පෝෂණය ලැබුවේ ද යන්න ඔබ සොය බැලිය යුත්තක්.

> අල්තීනායි සඳහන් කරන ආකාරයට 'පාසල' සහ 'ඉගැන්වීම්' වැනි වචන නවකතාවල සංවාද හා සමාන බවත් ප්‍රදේශවාසීන් විශ්වාස කළේ "කියවීම යහපත් අයට පමණක්" බවත්. දුයිෂෙන් කොම්සොමෝල් සාමාජියකයකු (හිටපු විප්ලවවාදී හා කොමියුනිස්ට්) වීම නිසා සම්ප්‍රදායට බිය නොවී සහ විවෘත ව අභියෝග කළා. මෙවැනි නවකතාවක් චිත්‍රපටයකට නැගිය හැක්කේ එවැනි සමාජ වටපිටාවක පෝෂණය ලැබූ අධ්‍යක්ෂවරයකුට පමණයි.

'ගුරු ගීතය' නවකතාවට අනුව ඈත පිටිසර කුරුකුරේව් ගම්මානයක ස්ථාපිත කරන ද්වීතියික පාසැල් ගොඩනැගිල්ලක් විවෘත කිරීමට ගමේ ම ඉපදී නාගරික අධ්‍යාපනය ලැබූ ප්‍රභූවරයා ගමට එන තෙක් ගම්මුන් බලා සිටිනවා. දුයිෂෙන් විසින් නූගත් දරුවන්ට කියවීමේ සහ ලිවීමේ මූලික කරුණු ඉගැන්වීමෙන් අනුප්‍රාණය ලැබූ 'අල්තීනායි' මොස්කව් නගරයට ගොස් පොහොසත් අධ්‍යාපනවේදිනියක ලෙස නැවතත් ගමට සංක්‍රමණය වනවා. නිසි අවබෝධයකින් හෝ විධිමත් ක්‍රමයකින් තොර ව ඉගෙන ගත් මේ අතීත සිදුවීම් දාමය ගමේ මිනිසුන් විසින් සිනහවෙන් මතක් කරනු ලබන විට කඳු මුදුනේ සුළඟට සැලෙන කහ පාට පොප්ලර් ගස් දෙස ඕනෑකමින් බලා සිටින අල්තීනායිගේ මුහුණ ශෝකයෙන් බරිත වූවා. ශාස්ත්‍රාලයීය ජීවිතයක් වෙනුවෙන් අනුප්‍රාණය ලද මුල් ගුරුවරයා වන දුයිෂෙන් නිසා, එම අවස්ථාවේදී හැඟීම් බරවන ඇය ව අපට දිස්වන්නේ ශාස්ත්‍රලෝභිනියක වශයෙන්



නොව කිර්ගීස් සාමාන්‍ය කාන්තාවක් මෙන්. එහෙත් ඇගේ ආගමනයට විශාල අවධානයක් යොමු කරමින් ගම්වැසියන් විසින් පෙන්වනු ලබන්නේ ඇය පිළිබඳ ඇති ගරුත්වය.

එහිදී අල්තීනායි සඳහන් කරන ආකාරයට 'පාසල' සහ 'ඉගැන්වීම්' වැනි වචන නවකතාවල සංවාද හා සමාන බවත් ප්‍රදේශවාසීන් විශ්වාස කළේ "කියවීම යහපත් අයට පමණක්" බවත්. දුයිෂෙන් කොම්සොමෝල් සාමාජිකයකු (හිටපු විප්ලවවාදී හා කොමියුනිස්ට්) වීම නිසා සම්ප්‍රදායට බිය නොවී සහ විවෘත ව අභියෝග කළා. මෙවැනි නවකතාවක් චිත්‍රපටයකට නැගිය හැක්කේ එවැනි සමාජ වටපිටාවක පෝෂණය ලැබූ අධ්‍යක්ෂවරයකුට පමණයි. උපාලි ගම්ලත් එක්තරා ආකාරයකට සමාජවාදය කොමියුනිස්ට්වාදය වැනි අදහස්වලින් පෝෂණය වී සිටින අධ්‍යක්ෂවරයෙක්. චිත්‍රපටයේ එක්තරා ආකාරයකට දුයිෂෙන්ගේ චරිතය නිරූපණය කර ඇති ආකාරයෙන් මේ තත්ත්වය පිළිබඳ යම් අවබෝධයක් අපට ඇති වනවා.

පාසල් පවත්වාගෙන යෑමට විරුද්ධ ව ගොඩනැගුණු බලවේග යටපත් කරවීමට ම දුයිෂෙන් අසන්නේ මෙලෙස. "එසේ නම් ළමයින් පාසල් යා යුතු යැයි සඳහන් සෝවියට් රජයේ නිල මුද්‍රාව සහිත මෙම පත්‍රිකාවට ඔබ විරුද්ධ ද? ඔබට ඉඩම් හා ජලය දුන්නේ කවුරුන් ද? නිදහස ලබා දුන්නේ කවු ද? උත්තර දෙන්න" කෘතියේ සඳහන් මේ කරුණු ඒ ආකාරයට ම සඳහන් නොවුණත් ඒ සඳහා යම් මැදිහත්වීමක් අධ්‍යක්ෂවරයා සිදු කර තිබෙනවා. යන්තම් සිය ජීවිතයේ 14 වැනි වසර පසුකරමින් සිටි අල්තීනායි ස්ටෙප් තණ බිමෙහි අතරමන් වූ මල් කැකුළක් ව දුයිෂෙන්ට හමු වුණා. කෙතරම් වෙහෙස මහන්සි වී වැඩ කළත් තම නැන්දම්මාගේ නිරන්තර දෝෂ දර්ශනයට ලක් වූ ඇය අපමණ අවමන් වින්දා. එක් අතකින් නැගී එන ධනේශ්වරයත් අනෙක් අතට ජීවිත වටා වැටුණු දිළිඳු බවේ ලෝගුවත් විසින් පීඩිත මිනිසුන්ට කුස පුරවා ගනු ලැබීම හැර වෙනත් යමක් අවශ්‍ය නොවන බව සඳහන් කළ ප්‍රබල රූපකයක්. එහෙත් අල්තීනායිගෙන් මතු කරන්නේ අනාගත සුබවාදී රාජ්‍ය සහ සමාජය වෙනුවෙන් වෙහෙස මහන්සි වී ඉගෙන ගැනීම අත්‍යාවශ්‍ය ම බව.

අයිතමාතව්ගේ ආඛ්‍යාන කලාවේ ගම නියෝජනය කරන්නේ සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය. තරුණයා ඔවුන්ට ඉගැන්වීමට සහ අකුරු කියාදීමට පැමිණි

එක් අතකින් නැගී එන ධනේශ්වරයත් අනෙක් අතට ජීවිත වටා වැටුණු දිළිඳු බවේ ලෝගුවත් විසින් පීඩිත මිනිසුන්ට කුස පුරවා ගනු ලැබීම හැර වෙනත් යමක් අවශ්‍ය නොවන බව සඳහන් කළ ප්‍රබල රූපකයක්. එහෙත් අල්තීනායිගෙන් මතු කරන්නේ අනාගත සුබවාදී රාජ්‍ය සහ සමාජය වෙනුවෙන් වෙහෙස මහන්සි වී ඉගෙන ගැනීම අත්‍යාවශ්‍ය ම බව.

බව දැන ගත් අල්තීනායිගේ අභ්‍යන්තර ලෝකය ම පහන් වුණා. දෑස් දැල්වූවා. අභ්‍යන්තරයට විදුලි පන්දමක ආලෝකය ලැබුණා සේ දැල්වූවා. එය ඇගේ ඉදිරි ගමනේ පෙර මං සලකුණු සනිටුහන් කිරීමක්. අල්තීනායි තම බෑගය පාසලේ දොර අසළ හිස් කරන විශේෂ කතාංගය, ආයිත්මාතොව්ගේ කාව්‍යාත්මක වාක්‍ය ඛණ්ඩ ඔස්සේ කරන විචිත්‍රවත් ව රූපක භාවිත කිරීම කියවන්නාගේ සිත් ගන්නා සුළුභාවය තිව්‍ර කිරීමට සමත්.

වෙහෙස මහන්සි වී වැඩ කරන අවංක ගුරුවරයකුගේ සහ දක්ෂ ශිෂ්‍යයකුගේ චිත්තවේගී බැඳීම නිරූපණය කරන මේ පඨිතය ජාති, ආගම්, කුල භේදයකින් තොර ව ඕනෑ ම පාඨකයකු/ ප්‍රේක්ෂකයකු ග්‍රහනය කිරීමට සමත්. කතාව ආරම්භය වන්නේ ලෙනින්ගේ යුගයේදී. කතාව අවසාන වන විට දුයිෂෙන් ව උත්කර්ෂයට (අල්තීනායිගේ මෙන් ම පාඨකයාගේ ද) නැංවීමට රචකයා දක්වන සමර්ථකම සැබවින් ම විශිෂ්ට ගුරුවරයකුගේ භූමිකාව ඉස්මතු කිරීමක්. ඔහු කිර්ගිස් ජාතියේ පමණක් නොව සමස්ත ලෝකයේ ම මුල් ගුරුවරයා. ඒ නිසා මෙවැනි කෘතියක් මුල්කරගෙන නිර්මාණකරණයේ යෙදෙන අධ්‍යක්ෂවරයකු හෝ නිර්මාණකරුවකු පරෙස්සම් විය යුතුයි. මුල් කෘතිය, මුල් කෘතියේ අභිලාෂ එසේ ම උත්කර්ෂයට නංවන්නේ ද? නොඑසේ නම් එම මුල් කෘතිය පදනම් කරගෙන ස්ව-අනන්‍යතාවක් සහිත ව නව නිර්මාණයක් කරන්නේ ද? යන්න පළමු ව තේරුම් ගත යුතු වනවා. මේ ප්‍රකාශය ගම්ලත්ට ද එසේ ම වලංගුයි.

"අප පිළිබඳ වටිනා මතක ඇති ස්ථානවල සදහට ම අපගේ පා සටහන් තබන්නට අපට නොහැක්කේ ඇයි?



# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල
# වැටුප් ගැන ටිකක් - 01


ඉදිරිපත් කිරීම

**නාලක දිසානායක**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු)
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව


රාජ්‍ය/පළාත් රාජ්‍ය මෙන් ම අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා ද දශකයකට ආසන්න කාලයකට පසුව මූලික වැටුපේ සංශෝධනයක් වර්තමාන රජය සිදු කර තිබෙනවා. ඒ නිසා 'වැටුප්' යන්න වෙනදාටත් වඩා කතාබහට ලක් වන මාතෘකාවක් යැයි කීම අතිශෝක්තිය නොවෙයි. විභාග අත්වැලක් ලෙස මෙන් ම සාමාන්‍ය දැනුවත්භාවයටත් වැටුප් සම්බන්ධ මේ ප්‍රශ්නෝත්තර සංග්‍රහය ඔබට වැදගත්වනු ඇති.

01. වැටුප් හා සම්බන්ධ ආයතන සංග්‍රහයේ පරිච්ඡේදය කුමක් ද?

VII වැනි පරිච්ඡේදය

02. 'වැටුප' යන්න අර්ථ නිරූපණය කරන්න.

වැටුප යන්න අර්ථ නිරූපණය කර ඇති 2018.09.07 දිනැති රා.ප.ච 24/2018හි අර්ථ නිරූපණය කෙරෙහි ඔබේ අවධානය යොමුවිය යුතුයි. ඒ අනුව වැටුප යනු "වැටුප් පරිමාණයක් හෝ ස්ථාවර වැටුපක් යටතේ දැක්වෙන දීමනා රහිත වැටුප වන අතර වෙනත් නියමයක් කර නොමැති නම් ඊට කිසිදු දීමනාවක් ඇතුළත් නොවේ."

03. 'පඩිනඩි' යන්නට අයත් නොවන දීමනා මොනවා ද?

පඩිනඩි යන්නෙන් වැටුප්, රාජකාරි දීමනා, පෞද්ගලික දීමනා බඳු ප්‍රතිපූර්ණ ගෙවීම්වල ස්වභාවය නොදරන වෙනත් ඕනෑ ම දීමනාවක් අදහස් කෙරේ. ඒ අනුව ගමන් වියදම් දීමනා, ප්‍රවාහන වියදම් දීමනා හෝ සංයුක්ත දීමනා බඳු ප්‍රතිපූර්ණ ගෙවීම්වල ස්වභාවය දරන දීමනා අයත් නොවේ.

04. මාසයක කොටසක් සඳහා එනම් යම් මාසයක දින කිහිපයක වැටුප ගණනය කරන්නේ කෙසේ ද?

යම් මාසයක යම් දින ගණනක වැටුප ගණනය කරන විට, අදාළ සම්පූර්ණ වැටුප 30න් බෙදා අදාළ අගය සෙවිය යුතු බවට වන අදහස් සෑම විට ම නොවේ. එය නියත ව ම 30න් බෙදන ලෙස සඳහන් වන අවස්ථාවකදී නිවැරදි වුව ද අන් සෑම විටකදී ම දින ගණනක වැටුපක් ගණනය කරන විටක එය සිදු කළ යුත්තේ අදාළ මාසයේ දින ගණනින් මාසයේ සම්පූර්ණ වැටුප බෙදීමෙනි.
උදාහරණයක් ලෙස රු. 24250/=ක ආරම්භක වැටුපක් සහිත තනතුරකට යම් අයකු ජනවාරි 25 දින පත්වීම් ලැබුවේ නම් එම මාසයේ මාසික වැටුප

$$\frac{\text{රු. } 24250 \times \text{දින } 7}{31} = \text{රු. } 5475.81 \text{ වේ.}$$

05. රාජ්‍ය නිලධරයකු එක් තනතුරක සිට වෙනත් තනතුරකට පත් වී / උසස් වී, නැවත පූර්ව තනතුරට පත්වන/පත්කරන අවස්ථා මොනවා ද? ඒ අවස්ථාවල වැටුප සංශෝධනය වන්නේ කෙසේ ද? මේ සම්බන්ධ විධිවිධාන ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 6 වැනි වගන්තියේ දැක් වේ.

i විනය කරුණු මත නිල තත්ත්වයෙන් පහත හෙලා ආපසු පූර්ව තනතුරට පත් කිරීම

නිලධරයකු විනය කරුණු මත නිල තත්ත්වයෙන් පහත හෙලා ඔහු කලින් දැරූ පහළ ශ්‍රේණියකට හෝ තනතුරකට ආපසු පත් කළ විට එසේ ආපසු පත්කිරීමේදී ඔහුට ගෙවිය යුතු වැටුප නිශ්චය කළ යුත්තේ එකී විනය නියෝගයෙහි විශේෂයෙන් සඳහන් කොට ඇත්තා වූ පරිද්දෙනි.

ii. තනතුර අහෝසි කිරීම නිසා හෝ අතිරික්ත වීම නිසා

තනතුර අහෝසි කිරීම නිසා හෝ අතිරික්ත වීම නිසා හෝ යම්කිසි නිලධරයකු ඔහු කලින් දැරූ තනතුරකට හෝ ශ්‍රේණියකට ආපසු පත් කළහොත්

එසේ ආපසු පත් කිරීමේදී ඔහුගේ වැටුප විය යුත්තේ ඔහු කලින් දැරූ තනතුරේ හෝ ශ්‍රේණියේ දිගට ම සේවය කොට එම තනතුරේ හෝ ශ්‍රේණියේ හෝ වැටුප් පරිමාණය මත වැටුප් වර්ධක උපයා ගත්තේ නම්, ඒ අනුව ඔහුට ලැබිය යුතු ව තිබුණු වැටුප ය. එතෙකුදු වුවත් එම වැටුප ගෙවිය හැක්කේ එය, ඔහු එසේ ආපසු පත් කරන අවස්ථාවේදී දරමින් සිටි තනතුරේ අන්තිම වරට ලබමින් සිටි වැටුපට වඩා අධික නොවේ නම් පමණි. යම්කිසි කාලයක් තුළ ඔහුගේ වැටුප් වර්ධක විලම්බනය කර තිබුණේ නම් එබඳු කාල සීමා සඳහා ඔහුට වැටුප් වර්ධක වාසි නොදිය යුතු ය.

iii. නිලධරයකු සිය ඉල්ලීම පිට ආපසු පූර්ව තනතුරට විධිමත් අනුමැතිය මත පත්වීම

2019.07.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 මඟින් සංශෝධිත පරිදි කිසියම් නිලධරයකු, ඔහුගේ ම ඉල්ලීම මත ඔහු කලින් දැරූ තනතුරට හෝ ශ්‍රේණියට, පත්කිරීමේ බලධරයාගේ නිර්දේශ මත හා අමාත්‍ය මණ්ඩලයේ/ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ආපසු පත් කරනු ලැබුවහොත් එසේ ආපසු පත් කිරීම අලුත් පත් කිරීමක් සේ සලකා එසේ ආපසු පත් කරනු ලැබූ තනතුරට අයත් වැටුප් පරිමාණයේ නිලධරයා අවසන් වරට සේවය කළ පන්තියට/ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප ඔහුට ගෙවිය යුතු ය.

ආරම්භක වැටුපට වඩා ඉහළ වැටුපක් ඔහුට නියම කිරීම යුක්තිසහගත වන විශේෂ අවස්ථාවලදී ඒ සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය, නිලධරයා එම තනතුරට ආපසු පත්කිරීමට පෙර ලබාගත යුතු ය. නිලධරයා එම තනතුර අත් නොහැර සේවයේ රැඳී සිටියේ නම් ඔහු විසින් ලැබිය හැකි ව තිබූ වැටුපට වඩා අධික වැටුපක් එම තනතුරට ආපසු පැමිණීමේදී ලබා ගැනීමට ඔහුට කවර හේතුවක් නිසාවත් ඉඩ නොදිය යුතු ය.

IV. රාජ්‍ය සේවයෙන් බැහැර සේවාවන් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතුමත පත් කළ අයකු පූර්ව තනතුරට නැවත පත්වීම

රාජ්‍ය සේවාවෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත මුදා හැර ඇති නිලධරයකු ඔහුගේ නිත්‍ය තනතුරට ආපසු පත්කරන විට ඔහු පිහිටුවිය යුත්තේ එම තනතුරෙහි ඔහු දිගට ම සේවය කොට එම තනතුරට අයත් වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක ඔහු උපයා ගත්තේ නම් ඔහුට ලැබිය යුතු ව තිබුණු වැටුප මත ය. එතෙකුදු වුවත් එම වැටුප මත ඔහු පිහිටුවිය හැක්කේ ඔහුට නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම්වලින් ඔහු නිසි කල්හි සමත් වී ඇත්නම් පමණි.

V. රාජ්‍ය සේවයෙන් බැහැර සේවාවන් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය නොවන හේතුමත පත් කළ අයකු නැවත පූර්ව තනතුරට නැවත පත්වීම

රාජ්‍ය සේවාවෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය නොවන හේතු මත නිදහස් කරනු ලැබ සිටින නිලධරයකු ඔහුගේ නිත්‍ය තනතුරට ආපසු පත්කරනු ලැබූ විට, ඔහු මුදාහරින අවස්ථාවේදී අන්තිමට ලබමින් සිටි වැටුපෙහි ඔහු පිහිටුවිය යුතු ය. එසේ මුදා හරිනු ලැබ සිටි කාලය සඳහා ඔහුට වැටුප් වර්ධක වාසි හිමි නොවේ.

06. 2025/03/25 දින රා.ප.චං.10/2025න් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ වැටුප් පරිවර්තනය සිදු කරනු ලැබූයේ කවර ක්‍රමයකට ද?

පියවරට පියවර තැබීම් ක්‍රමයට ය.

07. ඉහත ආකාරයේ වැටුප් ප්‍රතිශෝධනයකදී එය සිදුකරන ආකාරය ආයතන අධ්‍යක්ෂ ජනරාල් හෝ නිසි බලධරයා සඳහන් කර නොමැති විටෙක වැටුප් ප්‍රතිශෝධනය ආයතන සංග්‍රහයේ Vii පරිච්ඡේදයේ කුමන වගන්තියේ විධිවිධාන පරිදි සිදු කළ යුතු ද?

4 වැනි වගන්තිය

08. ඉහත අවස්ථාවලදී වැටුප් ප්‍රතිශෝධනය සිදු කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

- වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධරයා පැරණි වැටුප් පරිමාණය අනුව අවසාන වශයෙන් ලබාගත් වැටුප නව පරිමාණයේ වැටුප් වර්ධක පියවර අතරේ ගැනේ නම්, ඔහු නව වැටුප් පරිමාණයේ ආසන්න ඉහළ පියවරේ තබනු ඇත.

- වැටුප් ප්‍රතිශෝධනය කිරීමෙන් පසු නිලධරයකු අවසාන වශයෙන් ලබාගත් වැටුප නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරකට අනුරූප වේ නම් ඔහු ආසන්න ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබිය යුතු ය.

- ප්‍රතිශෝධන කිරීමේදී නිලධාරියකු අවසාන වශයෙන් ලැබූ වැටුප නව පරිමාණයේ ආරම්භක වැටුපට අඩු නම් ඔහු වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙහි තබනු ඇත.

ඉතිරි කොටස ඉදිරි කලාපයට




# මලල ක්‍රීඩාවට ධනාත්මක ලකුණක්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**අනෝමා රත්නායක**
ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන
අධ්‍යයන අංශය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

ලෝක මලල ක්‍රීඩා ගෘහස්ථ ශූරතාවලිය යනු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ වේගය, ජවය සහ උපාය මාර්ග පරීක්ෂා කරන, මැන බලන ප්‍රමුඛතම ගෝලීය තරගාවලියක්. සෑම වසර දෙකකට ම වරක් ජවන හා පිටිය යන ඉසව් යටතේ එය පැවැත්වෙනවා. මේ තරගාවලිය මලල ක්‍රීඩාවේ විවිධත්වය සඳහා වන ගෝලීය ශූරතාව ලෙස දක්වන්නට පුළුවන්.

2025 මාර්තු 21 දින සිට මාර්තු 23 දින දක්වා චීනයේ යෞවන ඔලිම්පික් ක්‍රීඩා උද්‍යානයේ අලුතින් ඉදිකරන ලද 'නැන්ජින් කියුබ්' ව්‍යායාම ශාලාවේදී එය පැවැත්වුණේ 21 වැනි වරට. ඉසව් 26ක් මෙවර තරගාවලියට ඇතුළත් කර තිබුණා. ඒ සඳහා සුදුසුකම් ලබා තිබුණේ රටවල් 127 ක්‍රීඩක ක්‍රීඩිකාවන් 576ක්.

මෙවර තරගාවලියේදී ශ්‍රී ලංකා පිරිමි මීටර් 4×400 සහය දිවීමේ කණ්ඩායම නව ජාතික ගෘහස්ථ වාර්තාවක් පිහිටවූයේ එහි අවසන් තරගයේදී පස් වැනි ස්ථානයට පත්වෙමින්. ඒ, කාලය විනාඩි 3:10.58කින් තරගය නිමා කරමින්. 2007 වසරේදී ප්‍රසන්න අමරසේකර, රෝහිත පුෂ්පකුමාර, ශිවන්ත වීරසූරිය සහ අසෝක ජයසුන්දර මේ ඉසව්වේ තබා තිබූ කාලය 3:11.79ක්.

ශ්‍රී ලංකා කාන්තා මීටර් 4×400 සහය දිවීමේ කණ්ඩායම පළමු වරට ගෘහස්ථ ඉසව්වකට සහභාගි වූ අතර ඔවුන් ද අවසන් මහා තරගයේදී පත්වුණේ පස් වැනි ස්ථානයට. කෙටි දුර ධාවන ශූර චමෝද් යෝදසිංහ සහ කඩුලු පැනීමේ ක්‍රීඩිකාවන් වන කවීෂා බණ්ඩාර විසින් ඔවුන්ගේ අදාළ ඉසව්වල ලබාගත් අවසන් පූර්ව වටය ලෝක ගෘහස්ථ ශූරතාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායමේ ඉහළ ම ලකුණු වුණා. මීටර් 60 කෙටි දුර ධාවන ඉසව්වේ අවසන් පූර්ව වටයට පිවිසි චමෝද් යෝදසිංහ තත්පර 6.70ක් වාර්තා කරමින් අට වැනි ස්ථානය දිනා ගත්තා. නඳුන් කේ බණ්ඩාර අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූවේ මීටර් 60 කඩුලු පැනීම ඉසව්වේ සිව් වැනි තේරීමේ තරගයේදී තත්පර 7.87ක දස්කමක් දක්වමින්.

'ලෝක මලල ක්‍රීඩා' (World Athletics) විසින් පළමු වරට සංවිධානය කරන ලද මේ ශූරතාවලිය 1985 වසරේදී ප්‍රංශයේ පැරිස් නුවරදී පවත්වා තිබෙනවා. දෙවැනි ශූරතාවලිය නම් කර ඇත්තේ ලෝක ගෘහස්ථ ශූරතා තරගාවලිය ලෙස. ඒ, 1987 වසරේදී. 2019 වසරේදී ක්‍රීඩා පාලක මණ්ඩලයේ නම වෙනස් කිරීමත් සමග 'ලෝක ගෘහස්ථ මලල ක්‍රීඩා ශූරතාවලිය' **(World Athletics Indoor Championships)** ලෙස එය නම් කර තිබෙනවා. ඒ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීම සිදු කෙරෙන්නේ ද්විත්ව මාර්ගයක් මත පදනම් ව. 50%ක් ඇතුළත් වීමේ ප්‍රමිති සපුරා ගැනීමෙන් සුදුසුකම් ලබන අතර ඉතිරි 50% ඉහළ ලැයිස්තුවලින් සුදුසුකම් ලබනවා.

> ගෝලීය ආයතනයේ අවධානය දිනාගත් තනි කාර්යසාධනය සැලකිය යුතු ජයග්‍රහණයක්. විශේෂයෙන් ශ්‍රී ලාංකික කෙටි දුර සහ මැද දුර ධාවකයන් ඔවුන්ගේ පෞද්ගලික ධාවන කාලය ලෝක ශ්‍රේණිගත කිරීම්හි පරිසාධනීය මට්ටම දක්වා වර්ධනය කර ගනිමින් පවතිනවා. මෙවැනි දක්ෂතාවලින් ලෝක ශ්‍රේණිගත කිරීම්හි ඉහළට ම යා හැකි වන අතර එය ලෝක ගෘහස්ථ ශූරතාවලිය වැනි ප්‍රධාන ඉසව් සඳහා සුදුසුකම් ලැබීමට සෘජු ව ම බලපාන්නක්.

ශ්‍රී ලංකාව මේ ගෝලීය වේදිකාවට පිවිස ඇත්තේ 2001 වසරේ පෘතුගාලයේ ලිස්බන් නුවර පැවැති 08 වැනි ශූරතාවලියේදී. මේ සඳහා සුසන්තිකා ජයසිංහ, සුගත් තිලකරත්න, දමයන්ති දර්ශා සහ රොහාන් ප්‍රදීප් කුමාර යන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිව්දෙනකු සුදුසුකම් ලබා තිබෙනවා. ඒ සඳහා සහභාගි වන වැඩි ම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව මෙවර ශූරතාවලියට සහභාගි වීම විශේෂත්වයක්. මේ ප්‍රගතිය ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විභවය පමණක් නොව ගෝලීය මලල ක්‍රීඩාව රටේ වර්ධනය වීම ද පිළිබිඹු කරන අතර මෙය ශ්‍රී ලාංකේය මලල ක්‍රීඩා ගමනේ සැලකිය යුතු සන්ධිස්ථානයක්.

ඓතිහාසික ව ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩා ජයග්‍රහණ සීමා වී තිබෙන්නේ එළිමහන් ඉසව්වලට පමණයි. දකුණු ආසියානු ක්‍රීඩා උලෙළේ අමතක නොවන දස්කම්, ආසියානු ක්‍රීඩා උලෙළේ සහ ඔලිම්පික් උලෙළේ කැපී පෙනෙන අවස්ථා කිහිපයක් ද තිබෙනවා. තාක්ෂණික අවශ්‍යතා සහ දැඩි තරගකාරිත්වය හේතුවෙන් 'ලෝක ගෘහස්ථ මලල ක්‍රීඩා ශූරතාවලිය' ගවේෂණය නොකළ සහ මෙතෙක් ප්‍රවේශය අවම වූ භූමියක් ලෙසයි පැවතුණේ. මෑතකදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් හත් දෙනකු සහ ක්‍රීඩිකාවන් පස් දෙනකුගෙන් යුත් දොළොස් දෙනකු තෝරා ගැනීමෙන් පෙන්නුම් කරන්නේ දේශීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර ප්‍රමිති සපුරාලීමට පටන්ගෙන ඇති බව. ප්‍රධාන වශයෙන් එළිමහන් තරගවල ඔවුන්ගේ දස්කම් මත ඔවුන් ගෘහස්ථ ඉසව් සඳහා ස්වයංක්‍රීය ව සුදුසුකම් ලබනවා (ලෝක මලල ක්‍රීඩා, 2024). යටිතල පහසුකම් සහ ප්‍රතිපත්තිමය අභියෝග මධ්‍යයේ වුවත් ශ්‍රී ලංකා මලල ක්‍රීඩාව ගෝලීය මිනුම් සලකුණු සමග සෙමින් පෙළ ගැසෙන බවට මෙය ධනාත්මක ලකුණක්.

ගෝලීය ආයතනයේ අවධානය දිනාගත් තනි කාර්යසාධනය සැලකිය යුතු ජයග්‍රහණයක්. විශේෂයෙන් ශ්‍රී ලාංකික කෙටි දුර සහ මැද දුර ධාවකයන් ඔවුන්ගේ පෞද්ගලික ධාවන කාලය ලෝක ශ්‍රේණිගත කිරීම්හි පරිසාධනීය මට්ටම දක්වා වර්ධනය කර ගනිමින් පවතිනවා. මෙවැනි දක්ෂතාවලින් ලෝක ශ්‍රේණිගත කිරීම්හි ඉහළට ම යා හැකි වන අතර එය ලෝක ගෘහස්ථ ශූරතාවලිය වැනි ප්‍රධාන ඉසව් සඳහා සුදුසුකම් ලැබීමට සෘජු ව ම බලපාන්නක්.

මේ සංවර්ධනය ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඉහළ මට්ටමේ තරගකාරිත්වයට නිරාවරණය වීමට නව දොරටු විවර කරනු ඇති. ගෘහස්ථ ශූරතාවලියේ තරග කිරීමෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කෙටි ධාවන පථ සහ තද, වක්‍ර හා පාලිත දේශගුණික පරිසර වැනි විවිධ ධාවන පථ තත්ත්වයට අනුවර්තනය වීමට ඉඩ සලසනවා. මේ සඳහා නිශ්චිත තාක්ෂණික කුසලතා සහ ධාවන උපායමාර්ග අවශ්‍ය වන අතර ප්‍රධාන වශයෙන් එළිමහන් ධාවන පථවල පුහුණුවන ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අගනා ඉගෙනුම් අවස්ථා ද හිමි වනවා. එවැනි ඉසව්වලට සහභාගි වීම තනි පුද්ගල අත්දැකීම් වැඩි කරනවා පමණක් නොව එයින් ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩා විභවය කෙරෙහි ජාත්‍යන්තර අවධානය ද යොමු වනවා.

මේ වර්ධනය වන පැවැත්ම ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් සංවර්ධනයට ධනාත්මක ලෙස බලපෑම් කරන්නට පුළුවන්. ශ්‍රී ලංකාවේ වැඩි වන නියෝජනයෙන් ගෝලීය තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සූදානම් කිරීමට ගෘහස්ථ පහසුකම් සහ ව්‍යුහගත වැඩසටහන්වල අවශ්‍යතාව ගවේෂණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් දිරිමත් කරනු ඇති. එපමණක් නොව ගෝලීය ඉසව්වලට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි සංඛ්‍යාවක් සහභාගි වීමත් සමග මාධ්‍ය ආවරණය සහ මලල ක්‍රීඩා පිළිබඳ මහජන උනන්දුව ද වැඩි විය හැකියි. ලෝක ගෘහස්ථ ශූරතාවලියට සුදුසුකම් ලැබීම වැනි සන්ධිස්ථාන ඔස්සේ මේ ආඛ්‍යානය වෙනස් කිරීමටත් ජවන හා පිටිය ක්‍රීඩා කෙරෙහි ප්‍රේක්ෂක හා ක්‍රීඩක අවධානය යොමු කිරීමටත් හැකියාව තිබෙනවා. මාධ්‍ය උනන්දුව වැඩිවීමෙන් අනෙක් අතට අනුග්‍රාහකත්වය සහ පෞද්ගලික අංශයේ ආකර්ෂණය ලබා ගත හැකි අතර ඒවා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංවර්ධනය සඳහා විශේෂයෙන් මිල අධික පුහුණු වැඩසටහන් සහ ජාත්‍යන්තර තරග නිරාවරණය සඳහා තීරණාත්මක සාධක වනවා.

බිම් මට්ටමේ ක්‍රීඩා සංවර්ධනයට ඇති විය හැකි බලපෑම එහි එක් ධනාත්මක පැතිකඩක්. ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගෝලීය ගෘහස්ථ ඉසව්වල තරග වදිනු දැකීම මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් මලල ක්‍රීඩා ව කෙරෙහි ප්‍රවේශ කරවා ගැනීමට සපයන්නේ අභිප්‍රේරණයක්. අනාගත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ශක්තිමත් පදනමක් සැපයීමට ඉන් හැකියාව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පහසුකම් නොමැතිකම සහ ගෘහස්ථ ඉසව්වල සීමිත තාක්ෂණික විශේෂඥතාව වැනි අභියෝග තවමත් පවතින අතර ලෝක මලල ක්‍රීඩා සංවිධානවල නිර්ණායක මත පදනම් ව ශ්‍රී ලාංකේය ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමෙන් පෙන්නුම් කරන්නේ දේශීය දක්ෂතා නිවැරදි සහයෝගය ඇති ව ගෝලීය මට්ටමට නංවාලිය හැකි බව. පුහුණු කිරීම, ක්‍රීඩා විද්‍යාව, ක්‍රීඩා කළමනාකරණය සහ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මට්ටමේ ගෘහස්ථ ජවන හා පිටිය ජයග්‍රහණ පහසුවෙන් අත් කර ගත හැකියි.

බිම් මට්ටමේ ක්‍රීඩා සංවර්ධනයට ඇති විය හැකි බලපෑම එහි එක් ධනාත්මක පැතිකඩක්. ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගෝලීය ගෘහස්ථ ඉසව්වල තරග වදිනු දැකීම මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් මලල ක්‍රීඩා ව කෙරෙහි ප්‍රවේශ කරවා ගැනීමට සපයන්නේ අභිප්‍රේරණයක්. අනාගත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ශක්තිමත් පදනමක් සැපයීමට ඉන් හැකියාව තිබෙනවා.

මේ අනුව ලෝක මලල ක්‍රීඩා ගෘහස්ථ ශූරතාවලියේ ශ්‍රී ලංකාවේ නියෝජනයේ වර්ධනය සැලකිය යුතු හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරනවා. ජාත්‍යන්තර ප්‍රමිති මත තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිව්දෙනකුගේ සිට දොළොස් දෙනකු දක්වා යැවීම සංඛ්‍යානමය දියුණුවක් පමණක් නොව නැගී එන මලල ක්‍රීඩා විභවයේ සංකේතයක්. එය පිළිබිඹු කරන්නේ නිවැරදි උපායමාර්ගික අවධානයක් සහිත ව දක්ෂයන් සමග තරග කළ හැකි සංචිතය. සහභාගි වීම පමණක් නොව ජයග්‍රහණය කිරීමේ ඉලක්කය ඇති ව ක්‍රීඩා බලධාරීන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ පෞද්ගලික අංශයට මලල ක්‍රීඩා සඳහා තවදුරටත් ආයෝජනය කිරීමට පෙළඹවිය යුතුයි. මේ හැකියාව අවබෝධ කර ගැනීමෙන් ශ්‍රී ලංකාවට ගෝලීය මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ ශක්තිමත් අනන්‍යතාවක් ඇති කර ගත හැකි අතර නව පරම්පරාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒ සඳහා පොළඹවාලිය හැකියි.


# ආරවුල් නිරවුල් කිරීම

# EC-EDR

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ ව මහජන පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා නව ජංගම දුරකතන මෘදුකාංගයක් හඳුන්වාදීමට මැතිවරණ කොමිෂන් සභාව පියවර ගෙන තිබෙනවා. EC-EDR නම් මේ මෘදුකාංගය හඳුන්වාදීම සිදු කෙරුණේ මාර්තු 22 දින මැතිවරණ මහ ලේකම් කාර්යාලයේදී. විධිමත් සහ නව තාක්ෂණික ක්‍රමෝපාය ඔස්සේ මැතිවරණ පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකිවීමයි මෙහි සුවිශේෂත්වය.

මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය වෙත මැතිවරණ ආරවුල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී මේ මෘදුකාංගයෙන් ඕනෑ ම අයකුට තම ජංගම දුරකතනය ඔස්සේ මැතිවරණ පැමිණිලි සමග ඊට අදාළ වීඩියෝ දර්ශන සහ ඡායාරූප ඉදිරිපත් කළ හැකියි. එම පැමිණිලිවල පසු විපරමක් ද කළ හැකි වීම මෙහි විශේෂත්වයක්. ලැබෙන පැමිණිලි ක්ෂණික ව ම පොලිසිය හා සම්බන්ධ වන බැවින් ලැබෙන පැමිණිලි කඩිනමින් විමර්ශනය කර අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ලැබෙන බවයි මැතිවරණ කොමිෂන් සභාවේ සඳහන.

**කාංචනා සිරිවර්ධන**





දෙසතිය පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-